යථා* අන්තිමභවෙ මාතුකුච්ඡිතො ජායමානො'ව ඃබා ධිසතෙතා කරවරකරතො'පනීතදුකූලචුම්බටකතො ඔතරන්තො'ව බාලො සමානො'පි සොළසවස්සුද්දෙසිකො විය අමඛිතො'පි අනෙකවණ්ණාභරණවිභූසිතො විය භූමියා ගච්ඡන්තො'පි ආකාසෙන ගච්ඡන්තො විය සබ්බෙසං ජනානං පටිභාසි. තථෙ'ව තස්ස තද දන්තධාතුභට්ටාරකො සුගතබිම්බාකාරෙන සලක්ඛණාවයවෙන රූපෙන භාසමානො අනෙකවිධරංසිනිකරෙ විකිරන්තො තත්ථ සන්නිපතිතානං ජනානං මානනං ජනෙසි—වුත්තඤ්හි.

6 ලංකාධිනාථකරපංකජරාජහංසී
නිම්මාය සා දසනධාතු මුනින්දරූපං
නෙකෙහි රංසිවිසරෙහි සමුජ්ජලන්තී
සබ්බා දිසාව විදිසා සමලංකරිත්ථ

7 දිස්වා තම'බ්භූතම'තීව පසන්නචිත්තො
සම්පත්තචක්කරතනො විය චක්කවත්තී
සෙසෙහි නෙකරතනාභරණාදිකෙහි
පූජෙසි ධාතුම'සමං මනුජාධිනාථො. †

---

* මේගැණම බුද්ධවංශයෙහි මෙසේ පෙනේ : "තෙසං හත්ථතො මනුස්සා දුකූලචුම්බටකෙන මනුස්සානං හත්ථතො මුච්චිත්වා පඨවියං පතිට්ඨාය පුරත්ථිමං දිසං ඔලොකෙසි * * * * උත්තරාභිමුඛො සත්තපදවීතිහාරෙන අගමාසි. පඨවියා එව ගතො නා'කාසෙන : අචෙලකො'ව ගතො නොසචෙලකො : දහරො'ව ගතො න සොළසවස්සුද්දෙසිකො—මහාජනස්ස පන ආකාසෙන ගච්ඡන්තො වියව අලංකතපටියත්තො වියව සොළසවස්සුද්දෙසිකො වියව අහොසි"

† දාඨාවංශයෙහිද මෙසේ තිබෙයි.

"තස්මිංඛණෙ දසනධාතුමුනිස්සරස්ස
පක්ඛෙ පසාරිය දුමෙ විය රාජහංසී
විත්ථාරිතංසුනිවහා ගගණඞ්ගනම්හි
ආවට්ටතො ජවි ජවෙන මුහුත්තමත්තං
පච්චග්ඝ ම'ම්බරණකං සිතම'ත්ථරිත්වා
බුද්ධාසනම්හි විනිධාය මුනින්දධාතුං
තං ජාතිපුප්ඵනිකරෙන එකොසි රාජා
වස්සච්චයම්බුධර කූටසමප්පභෙන"

Digitized by Google

8 තතො ජිනදන්තධාතුවරප්පසාදනාලම්භා තෙ
ජබලපරක්කමවගිමො පරක්කමබාහුමහානරින්දො
පුලත්ථිපුරනිවාසිනිං කතලොකසාසනවිලොපං සරජ්
කම'නෙකසහස්සසංඛං චොළකෙරලවාහිනිච නෙක
දෙසමහීපාලමත්තමාතඟකෙසරිවික්කමං දුරතික්කමං
ලොකසාසනසඟහකරණවසෙන වචිතසකලලොකං
සම්පන්නබලවාහණං ලංකාරජ්ජගහණත්ථිකං තඛ
ලිඟවිසයාගතම'තිසාහසං චණ්ඩභානුමනුජාධිපච සසා
මත්ත'මත්තකභවනමුපනීයස.

සකලලංකාදීපමෙ'කච්ඡත්තං විධාය අත්තනො පිතු
මහාරජතො දිගුණං ලොකසාසනසඟහං කරොන්
තො තදච් සංඝස්ස කඨිනචීවරානි දතුකාමො තප්
පාසපරිකම්මකන්තනාදීකානිසබ්බකරණීයානිඑකා
හෙනෙ'ව නිට්ඨාපෙත්වා පච්චෙකම'නෙකමහග්ඝාරහ
ඝඩමණ්ඩිතානි සසාමණිකපරික්ඛාරානි අසීතිමත්තානි
කඨිනචීවරානි දාපෙත්වා ලොකස්ස සාධුවාදෙන දසද්
සං පූරෙසි.

9 එවම'ඤ්ඤානි'පි බහූනි ලොකවිම්හයකරානි පුඤ්ඤ
පදානානි සම්පාදෙන්තො සො පරක්කමබාහු මහාන
රින්දො හත්ථවනගල්ලවිහාරෙ අත්තනො පිතුමහාර
ඤ්ඤො ආළාහණට්ඨානෙ මහාචෙතියං *බන්ධාපෙත්වා
තත්ථෙ'ව අනෙකභික්ඛුසඞ්ඝස්සපරිභුත්තං පාසාද
වරං චිරකාලවිනට්ඨං සුත්වා ධනුකෙතකිවත්ථුවංසෙ ජා

---

* මේගැණ මහාවංශයෙහි මෙසේ කියාතිබේ.
“අථ රජවරො හත්ථවනගල්ලභිධානකෙ
විහාරම්හි සංඝබොධිරජා ඨානෙතු යත්ථ සො
අදා තස්ස දළිද්දස්ස සීසදානං තදා තහිං
ඨානෙ ගොඨාභයවිහෙන භූපාලෙන විභූමකං
වට්ටධාතුඝරං යන්තු කාරිතං තං (මහීපති)
පුනකාරා පසීතුග සොණ්ණසිඟං තිභූමකං
තස්මිංයෙව විහාරම්හි අත්තනො පිතුරජිනො
දෙහනික්ඛෙපඨානම්හි කාරයී වරචෙතියං
තත්ථෙ'ව පුනරට්ඨංසං කාරෙත්වා පටිමාඝරං
සම්බුද්ධපටිමං තත්ථ සංඨපෙසි සිලාමයං ”

Digitized by Google

තං සද්ධාදිගුණසම්පත්තිසමුදිතං පතිරාජදෙවනාමකං
අමච්චවරං පෙසෙත්වා තෙන අනෙකසහස්සධන
පරිච්චාගෙන භූමිභිත්ති ආදිසු චිත්තකම්මමණ්ඩිතං ම
නොහරං පූරෙවියතං පාසාදං කාරාපෙත්වා තත්ථ නි
වසන්තානං අනෙකෙසං භික්ඛූනං චතුපච්චයදානං
පවත්තෙසි.

10. තතො'ව වට්ටුලවිමානස්ස හෙට්ඨිමතලෙ ගොපා
නසියො ඨපෙත්වා සමන්තා ඡදනං කාරෙත්වා තිභූමකං
විමානං තිභූමකම'කාසි. තතො'ව ලංකාදීපෙ අභූත
පුබ්බං ජිනමන්දිරං කාරාපෙතුකාමො වට්ටුලවිමාන
තො උත්තරදිසාභාගෙ පඨමං පොරිසප්පමාණං සිලා
තලපරියන්තං ඛණිත්වා පංසූනි අපනෙත්වා නදිවාලුකා
හි පූරෙත්වා කුඤ්ජරරාජවිරාජිතආධාරබන්ධකතො පට්ඨා
ය යාවථූපිකං අට්ඨංසවිභාගෙන භිත්තිච්ඡදනානි විභත්
තානි කත්වා පච්චෙකං නානාවණ්ණවිචිත්තවිතාන
විමට්ඨානං භිත්තිභාගානමු'පරි කෙළිපරිහාසරසජන
කානාකාවෙසවිලාසභූසිත පග්ගහභූත කින්නර පරිසපරි
ගතවිටංකමණ්ඩලමණ්ඩිතං පමුඛපරියන්තෙ විවිධවිචිත්ත
රූපමනොහර'මුච්චතරං ඉට්ඨකාහි නිචිතං කත
සුධාපරිකම්මමකරතොරණමණ්ඩලඤ්ච නිම්මිනිත්වා අන්
තො විරචිතානි මනොහරමාලාකම්මලතාකම්මාදි
නානාවිධචිත්තකම්මසමුජ්ජලං සුවිහිතසොපානද්වාර
කවාටං සමලංකතට්ඨානලීලානමනොහර සජීවජිනසං
කාසපටිබිම්බරූපවිභූසිතං පටිබිම්බස්ස දක්ඛිණතො
ඝනසිලාවිහිතසුගතරූපපතිමණ්ඩිතං තිභූමකං මහා
විමානං කාරෙසි.

ඉති අට්ඨංස විමානු'ප්පත්ති පරිච්ඡෙදො එකාදසමො.

---

11 විධසතසංවරණතො නවකම්මුණාවා
ඛෙත්තාදිදාන විධිනාච අනාගතෙ'පි
යෙ සාධවො පරිහරන්ති ඉමං විහාරං
නාමඤ්ච කාරම'පි තෙස මිගාලිබන්තු

1 පුඤ්ඤෙනා'නෙන පප්පොමි
නිබ්බුතිං යාව තාව'හං
උප්පජ්ජෙය්‍යං කුලෙ සුද්ධෙ
සද්ධෙ අඩ්ඪෙ මහද්ධනෙ.

2 අසෙසදෙසභාසාසු
කලාසු සකලාසුච
කුසලො ලොකපඤ්චෙවො
වඩනිම්මද්දනො'පිච.

3 පිටකෙසුච වෙදෙසු
නෙකාදිසකරණෙසුච
තක්කාදිසු පන'ඤ්ඤෙසු
සබ්බෙසුච විසාරදො.

4 සාවිචා'ගමකොවාදො
පරවාදප්පමද්දනො
එකස්සුති ධරො'නෙක
සහස්සානම්'පි ගන්ථතො.

5 ගන්ථ සත සහස්සම්'පි
සුතමත්තෙන ධාරයෙ
අත්ථව්‍යඤ්ජනතො චා'පි
සහස්සනයතො'පිච.

6 වසා සීහස්ස පක්ඛිත්තා
යථා කඤ්චනපාතියා
සිලාලෙඛෙ'ව මෙ නිච්චං
සුතං සබ්බං න නාසයෙ.

7 මජ්ඣිමකො මහාතෙජො
කතඤ්ඤූ කුසලො බලී
ධිතිමා ජාතිසම්පන්නො
භවෙය්‍යං ජාතිජාතියං.

Digitized by Google

8 පරෙ'පි මං න හිංසෙය්‍යුං
න හිංසෙය්‍යං පරම්'පිච
අදණ්ඩෙන අසත්ථෙන
දමෙ'හං සබ්බපාණිනං.

9 කුදිකීපාපකම්මානච
නාසෙවෙය්‍යං කුදාචනං
පාණිනං අනුමත්තම්'පි
න ඝාතෙය්‍යං කුදාචි'පි

10 නිපුණං දුද්දසං පඤ්ඤං
යෙන කෙනචි පූජිතො
ඤාණෙනාන පකාසෙය්‍යං
තොසෙන්තො සකලං පජං,

11 අනෙකවිධා'පි යෙ රොගා
තෙ මයා පෙක්ඛිතක්ඛණෙ
නිස්සෙසා වූපගච්ඡන්තු
උදබින්දූ'ව පොක්ඛරා.

12 දස්සිතසුත මතානම්'පි
යං කිඤ්චි මම සන්තකං
රාජ චොරප්පියා සතතා
අග්ගිනා උදකෙන වා
න විනස්සන්තු මෙ භොගා
මාගය්හ ඔය්හ වූය්හන්තු.

13 රොගව්‍යාධන්තරායොතු
න පප්පොන්තු කුදාචි මං
දෙවා මනුස්සා අසුරා
ගන්ධබ්බා යක්ඛරක්ඛසා,
තෙ'පි මං පරිරක්ඛන්තු
භවෙ සංසරතො මම,

Digitized by Google

14 අදින්නං පරදාරඤ්ච
සුරාපානවිහිංසනං
අසච්චං සුපිනෙනා'පි
නාචරෙය්‍යං කුදාචනං.

15 පඤ්චානන්තරියං කම්මං
පඤ්ච දුච්චරිතම්'පිච
මනසා'පි න චින්තෙය්‍යං
සබ්බකාලමි'තො පරං.

16 න කරෙය්‍යං න කාරෙය්‍යං
න චින්තෙය්‍යං කුදාචනං
පාපකං අනුමත්තම්'පි
තථා දුක්ඛඤ්ච පාණිනං.

17 නිරයෙච තිරච්ඡානෙ
පෙතෙ අසුරයොනියං
යං යංහි දුක්ඛං තං සබ්බං
න ඵුසෙය්‍යං කුදාචනං
පූරෙත්වා බොධිසම්භාරෙ
බුද්ධො හෙස්සං අනාගතෙ,..,ති.

සිද්ධිරස්තු......ආරොග්‍යමස්තු.

Digitized by Google

අත්තනගලුවංසේ

පරණ

සිංහලසන්නයයි.

Digitized by Google

Digitized by Google

සිංහල සන්නේ.

පරිච්. I.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

ස්වස්තිප්‍රශස්ත ප්‍රවර විජකුල කමලවන රාජරාජහංසායමානවූ අක්ෂර ලිඛිත ගණිත ගාන්ධර්ව නක්ෂත්‍ර ඡන්දස් නිඝණ්ඩු අලංකාර ශාලිහොත්‍ර යන්ත්‍ර තන්ත්‍ර මන්ත්‍ර ජ්‍යොතිර්ඥාන ඉතිහාස පුරාණාදී සකල කලාවන්ට කලානිධිවූ වැනිවූ සූත්‍රාභිධර්ම විනය සංඛ්‍යාත ත්‍රිපිටක බුද්ධවචනයෙහි අනොමදර්ශීවූ අනවමදර්ශී නාම් සංඝරාජ ධුරන්ධරවූ මහාස්වාමිහු විසින් මෙහෙයනලදුව ඉතිහාස කථාවහා පූර්වලිඛිතයද ආශ්‍රයකොට පූර්වයෙහි මාගධික භාෂාවෙන් රචනාකරණලද අත්තනගලු විහාරවංසසංඛ්‍යාත ප්‍රබන්ධය ශ්‍රීශකවර්ෂයෙන් එක්වාදහස් තුන්සිය සිව්වසක්පිරුණුසඳ ත්‍රිසිංහලාධීශ්වර නාවරත්නාධිපති භුවනෛකබාහු නරෙන්ද්‍රයාහට අග්‍රාමාත්‍යවූ ශුද්ධාබුද්ධිසම්පන්න රත්නත්‍රය ශරණපරායණ අශරණ ශරණ ශරණාගත වජ්‍රපඤ්ජර අනවරත දානහෙතු ප්‍රපඤ්චිත විවිධවිභවසඤ්චිත වෛපුල්‍යප්‍රවර පවිත්‍ර පූර්වගොත්‍රක කාලප්‍රභූත චන්ද්‍රසූර්‍ය්‍යමණ්ඩල ශුගළායමානවූ ශ්‍රීලංකාධීශ්වර අලකෙශ්වරනාම් මන්ත්‍රීශ්වරයාණන්හා මෙම මන්ත්‍රීශ්වරයාණන්ට සහොදරවූ පරනාරී සහෝදර යනාදී අනෙකප්‍රකාර විරුදාවලිඇති ස්වාජී පරාජීකාරණ ප්‍රවීණඉෂ්ටාජී ප්‍රශ්වංසකිරීමෙන්

අභීප්සිත මනොරථ පූරණයෙහි අත්‍යර්ථයෙන් අර්ථී වූ අර්ථනායක නම් මන්ත්‍රීශ්වරයානන්හා දෙදෙනාගේ කරුණාකටාක්ෂ නිරීක්ෂණයෙන් සුසංරක්ෂිත මධුරතර කුශල ඵලභරිත තරුණ වෘක්ෂායමාණවූ පර ශත්‍රු කුඤ්ජර නිකර නිරාකරණයෙහි ප්‍රවීණ සිංහාය මානවූ ශත්‍රුසිංහ කුඤ්ජරාභිධාන සේනානායකප්‍රධානීහු විසින් ශ්‍රොතෘජනයාගේ සුඛාවබොධය පිණිස සවිනීය සිංහල භාෂාවෙන් ප්‍රවර්තිතවූවහොත් යෙහෙකැයි ආරාධිතව ශාස්ත්‍රාරම්භයෙහි ඉෂ්ටදෙවතාරාධනාව සඳහා පූර්වකවීන් විසින් වර්ණිතවූ

1, සොතාවතාරිය හදයාමලමල්ලිකාය *
පජ්ජාලිතො මතිදසාය ජිනප්පදීපො
මොහන්ධකාරමඛිලං මම නීහරන්තො
නිච්චං විභාවයතු චාරු පදත්ථරාසිං—යනාදීන්

ප්‍රථම ගාථාවෙහි පටන් අර්ථ කථනය කරමු—

සොතනැමැති තෛලය අධිකකොට ඇති සිත් නැමැති නිර්මලවූ ප්‍රදීපාධාරයෙහි අනර්ඝභාවූ ප්‍රඥා නැමැති කඩවැටියෙහි දල්වනලද සර්වඥනැමැති ප්‍රදීපයතෙම සමස්ත මෝහාන්ධකාර සන්තානය විධ්වංශනය කිරීමෙන් මතුකියනු ලබන්නාවූ මේ පදයන්හා අර්ථරාශිය සතතයෙන් මනොඥකොට ප්‍රකාශ කෙරේවා.

2 ලංකාභිසිත්ත වසුධාධිපතීසු රාජා
සො බොධිසත්තගුණවා සිරිසංඝබොධි
නාසාති චාරු චරියා රචනාමුඛෙන
වක්ඛාමි හත්ථවනගල්ල විහාරවංසං

---

* මේ වෘත්තය වසන්තතිලකා නම්. එට වුත්තොදයේ සූත්‍රය මෙලෙසයි—"වුත්තා වසන්තතිලකා තභජාජගාගො."
⏑ ⏑ —, ⏑ — —, — ⏑ —, — ⏑ —; ⏑ ⏑

[යනුහෙයින්] මේ ශ්‍රීලංකාද්වීපයෙහි අභිෂෙක ප්‍රාප්තවූ ක්ෂත්‍රිය රජුන් අතුරෙන් බොධිසත්ව කරුණා ගුණ මජ්ඣමඇති යම් දැහැමි සිරිසඟබෝ නම් රජෙක් විද ඒ රජහුගේ අතිශයෙන් මනොඥවූ අපදාන සංඛ්‍යාත කුශලචරිතයාගේ බන්ධන මුඛයෙන් හෙවත් වර්ණනා මුඛයෙන් අත්තනගල්ලු විහාරවංශය කියමු.

3. බ්‍රහ්මඤ්ඤවංසෙනා'නුගතජ්ඣම'නොමදස්සී
ඛ්‍යාතෙන සබ්බ යතිරාජ ධුරන්ධරෙන
ව්‍යාපාරිතො'හමි'ති නානුගතං කථඤ්ච
නිස්සාය පුබ්බලිඛිතං ච'ධ වායමාමි

බ්‍රාහ්මණවංශොද්භූතවූ අජ්ඣානුගත වශයෙන් (ශාස්ත්‍රධර්මාර්ථයන් කෙරෙහි) අලාමක දර්ශනයක් ඇති හෙයින් "අනොමදස්සී" නම්වූ සියලු භික්ෂූන් රජනය කාරණ සංඝරාජධුරන්ධරවූ මහාස්වාමීහු විසින් මෙහෙයනලද්දවූ මම ඉතිහා නම්වූ මුඛපරම්පරාවආශ්‍රිත කථාවද පූර්වලිඛිතයද ආශ්‍රයකොට මේකර්මයෙහි උත්සාහ කෙරෙමි. *

4. දීඝනිකායාදි බෞද්ධාගම නැමැති අමෘතමහා ගංගාජල ප්‍රවාහයෙන් ශුද්ධකරණලද මිථ්‍යාදෘෂ්ටි නැමැති විෂකලංකවූ ලංකාද්වීපයෙහි මහානාගවන නම් උද්‍යානයෙහිවූ සභායෙහි ඒ ඒ ස්ථානයෙන් රැස්වූ යක්ෂ රාක්ෂස ගණයාගෙන් ජයගැණීම් චරිතඇති

---

* ගාල්ල මාතර මහනුවර කොළඹ පලාත්වලින් පොත් කීප යක්ම සපයා සෙවූනමුත් මේ 'බ්‍රහ්මඤ්ඤවංසෙනා'නුගතජ්ඣම'නොම දස්සී' යනාදී ගාථාවට සන්නයක් නෑ. ඒ නොකරතිබෙන්නේ ආරම්භයෙහි "බුද්ධවචනයෙහි අනොමදර්ශීවූ අනවමදර්ශි නම්"— යනාදියෙන් අනවමදර්ශි තෙරුන්නාන්සේගේ මෙහෙයුම ප්‍රකාශ වෙනනිසායයි සිතමි. ඉත්නිසා පොත සම්පූර්ණයෙන් දක්වන පිණිස මේ ගාථාව අපේ ආචාර්යෙශ්වර හික්කඩුවේ සුමංගල නායක තෙරුන්වහන්සේලවා සිංහලකරවා බාහනලදී.

Digitized by Google

ගෞතම සර්වඥයන්වහන්සේට සිඬක්ෂෙත්‍රවූ මේ සිංහල පෘථිවිමණ්ඩලයට අලංකාරාභරණයක් වැනිවූ අනේක ප්‍රකාර රත්නාකරයෙන් උපලක්ෂිතවූ මහාර්ඝවූ මාණික්‍යප්‍රභෙදඇති මිණිබේනම් ජනපදයෙක් ඇතිවී.

5. ලද්ධාන සත්ථු චරණංකමනඞ්කලඤ්ඡ
මංනද්දිනා සුමනකූට සිලුච්චයෙන
උස්සාපිතා විජයකෙතු මතල්ලිකෙව
සුබොරුවාලුක නදීසමලංකරෙති—

[යනුහෙයින්] තවද ඒ ජනපදයෙහි වර්ණිතා විශෙෂයෙක් ඇති—කෙබඳුවූදයත්—අන් පර්වත රාජයන් විසින් නොලැබහැක්කාවූ සර්වඥරාජයානන් වහන්සේගේ පදලාංඡනාය ලදින් සන්තුෂ්ට සමනතකූට පර්වත රාජයාවිසින් නහනලදප්‍රශස්තවූ ජයකෙතුවක් වැනිවූ මහාවාලුක ගඟාතොමෝ යම් ජනපදයක් සරහාද එසේවූ ගඟාවෙක්වී.

6. ලංකාය යක්ඛගණ නීහරණෙ ජිනස්ස
චම්මාසනුග්ගතහුතාසන ඵස්සදඩ්ඪං
සංසාරරක්ඛස වපුබ්භව බුබ්බුලංව
යස්මිං විභාති මහියඞ්ගන ථූපරාජා

තවද—මේ ශ්‍රීලංකාද්වීපයෙහි යක්ෂප්‍රළයකාරණ දවස් සර්වඥයන්වහන්සේගේ චර්මාසනයෙන් නැංගාවූ වහ්නිජ්වාලායාගේ ස්පර්ශදහයෙන් සංසාරනැමැති රාක්ෂසයාගේ ශරීරයෙන් නැංගාවූ බුබුලක්මෙන් යම් ජනපදයෙක්හි මහියංගන නම්වූ ථූපරාජ්‍යයෙක් බබලාද එසේවූ ලෝකපූජ්‍යවූ දාගැබෙක්වී.

Digitized by Google

7. සදා මහොඝාය මහාපගාය
පානීය පානාය සමොසටානං
සමුච්චයො සාරද වාරිදානං
නූනං ගතො ථාවර ථූපරූපං *

තවද—හැමකල්හි මහවතුරු යන්නාවූ මහවැලි ගඟෙහි පැන් බොනපිණිස ඒ ඒ තැනින් රැස්වූ ශරත් මේඝකූටයන්ගේ සමූහයතෙම ස්ථිරවූ ථූපස්වරූපයට පැමිණියයි හඟිමි.

8. තස්සාපගාය විමලම්බුනි දිස්සමාන
මාලොළවීචිතරලම්පති බිම්බ රූපං
භොගෙහි වෙඨිය නිජම්භවනම්ඵණීහි
පූජත්ථිකෙහි විය රජති නියමානං

තවද—ඒ නිර්මලවූ ගඞ්ගාජලයෙහි දෘශ්‍යමානවූ චචලවූ රළින් බබලන්නාවූ ප්‍රතිබිම්බ ස්වරූපයතෙම බබලා,—තුමත්මෙනුයත් පූජාකරණු කැමැත්තාවූ නාගරාජයන්විසින් දරණවැලින්වෙලාගෙණ ස්වකීයවූ නාගභවනයට ගෙණයනු ලබන්නාක්මෙන් බබලා.

9. තවද—ශ්‍රීලංකාද්වීපයෙහි සකලමහීමඬල මඬනාය මානවූ මහානාග වනොද්‍යානයයි මේනමින් ප්‍රසිද්ධවූ භූමිභාගයෙහි වැඩහිඳ යක්ෂප්‍රලයකළාවූ ප්‍රදේශය බුද්ධ පාරිභෝගික හෙයින් සමන්දෙව්මහාරජානන් ප්‍රධාන

---

* උපෙන්ද්‍ර වජ්‍රාවෘත්තයත් ඉන්ද්‍රවජ්‍රාවෘත්තයත් මිශ්‍රකරණලද උපජාතිවෘත්තයක්. මෙහි පලමුවැනි තුන්වැනිපාදයෝ උපෙන්ද්‍ර වජ්‍රයි.

"උපාදිකාසාච ජතාජගාගො."—වුත්තොදය.
— ⌒ —, ⌒ ⌒ —, — ⌒ —, ⌒ ⌒

දෙවැනි සතරවැනි පාදයෝ ඉන්ද්‍රවජ්‍රායි—

"ඉන්දාදිකාතා වජිරාජගාගො."
⌒ ⌒ —, ⌒ ⌒ —, — ⌒ —, ⌒ ⌒

කොටඇති දිව්‍යබ්‍රහ්මාදීන් විසින් මහිතාවූ හෙවත්
පූජිතාහෙයින් මහියඟන * නාම්වූ මහාවිහාරයට නුදුරුවූ
හෙවත් ආසන්නවූ එක්තරා ගමෙක්හි සෙලාභයනාම්වූ †
ක්ෂත්‍රිය රජෙක් වාසයකරන්නේ පුතනුවකනොතුන්
ලැබ සාමුද්‍රිකාලක්ෂණපාඨක බමුණන්ට දැක්වූයේය
ඔහු රජකුමාරයන්ගේ අඟප්‍රත්‍යඟයෙහි ලක්ෂණබලා
මේ රජකුමාරයන්වහන්සේ වැලිත් ලංකා සත්වකො
තොතුන්වහන්සේ නොවනසේක භාග්‍යයෙන්පවිත්‍රවූ
ධාන්‍යලක්ෂණයෙන් සමෘද්ධසේක මේසියළුසිංහලද්වීපය
ඒකච්ඡත්‍රකොට මහත්වූ ආශ්චර්‍ය අද්භූතවූ වීරචරිත
යන් දක්වන්නේයයි ප්‍රකාශකළෝ—ඒ විවරණලත්
ඉක්බිත්තෙන් අබාසලමේවන් රජතෙම පුතනුවන්
ගේ අභිෂෙකාදිසම්පත්තිඅසා කෙළපැමිණියාවූ සන්
තෝෂපරවශවූයේද ඒ සමයෙහි අනුරාධපුරයෙහි රාජ්‍ය
යකරන්නාවූ ව්‍යවහාරතිස්සනාම් මහරජහුකෙරෙන් කි
සියම්උපද්‍රවයෙක් මතුඋපදනේයයි හටගත්තාවූශංකා
ඇත්තේ ඒ දයාකටයුතුවූ කුමාරයන් හැරගෙණ මියු
ගුණුමහවෙහෙර බෝධිමළුවෙහි පිරිත් බණනතැන
රැස්වූ නන්දමහ තෙරුන්වහන්සේ ප්‍රධානකොට ඇති
මහභික්ෂුසංඝයාවහන්සේගේ මධ්‍යයෙහි සතප්පා 'ස්වා
මිනි මාගේ මේ කුමාරතෙම මහසංඝයා වහන්සේගේද
බෝධිද්‍රැම රාජයානන් වහන්සේගේද සරණ යන්
නේය ඔහු සියලු පින්වතුන්වහන්සේ රක්ෂාකරණ
සේක්' වයි 'මේකුමාර මෙතැන්පටන් සංඝබෝධිනාම්ද
වේ' යි කියා මහසංඝයා වහන්සේටද බෝධිද්‍රැමයා
නන් වහන්සේ අධිග්‍රහිත දෙවතානන්ටද පාවාදී
කුමාරයන් සත්හැවිරිදිකල්හි රජ කාලක්‍රියාකෙළේයි.

---

* මිනිබේ මහානාග මහියංගණාදී (§§. 4, 6 යෙහි) දක්වා තිබෙන ස්ථාන බින්තැන්න සමීපයයි හඟිමු.

† මෙනම මිහින්තලේ ගල්සන්නසේ 'අභයසේල'යයි පෙනේ.

10. ඉක්බිත්තෙන් ඒ කුමාරයන්ට උරෙයිදු මයිල් නාඥ මහතෙරුන්වහන්සේ ඒ දයාකටයුතුවූ කුමාරයන් විහාරයටගෙන්වා පොෂ්‍යකරණසේක් ත්‍රිපිටක බුද්ධවචනයන්උගන්වං බාහිර ශාස්ත්‍රයෙහිද අතිශයෙන් දක්ෂකුරවුසේක, ඒසංඝබෝධිකුමාරයෝද කරණලද මහාපින්ඇතිබැවින්ද තියුණුවූනුවණඇතිබැවින්ද ඥාන විඥාන දෙකින් සමෘද්ධවූ වයසට පැමිණීයේ ලෝකවාසීන්ගේ නේත්‍රයෙන් බොහුලබන්නාවූ රූප සම්පත්තියෙන්ද කර්ණ නැමැති දෙහොතින් ආස්වාදය කරණලබන්නාවූ සදචාර ගුණසමෘද්ධියෙන්ද පතලාවූ යශෝඝොෂා ඇතොත්වී.

11. මේසදචාර ගුණසමෘද්ධියෙහිද යශෝඝොෂාවෙහිද වර්ණනාව බෙහෙවින්කියනු කින්ද—මේඝමාලා සමූහයෙන් දික්සිනිඳුනිල්වූ ගුණ කෙශකලාපයෙහි ගෙණයොදන්නාවූ, පරිපූර්ණ චන්ද්‍රමණ්ඩලයාකෙරෙන් සන්තෝෂකරවූ ප්‍රසන්නබවහා සෞම්‍යගුණය මුඛමණ්ඩලයෙහි ගෙණ යොදන්නාවූ, චාමීකර සවර්ණයක්සේ පිලුවන්වූ උතුම්වූ ශංඛයෙන් සිනිඳු මහත්වූ මනොඥබව ග්‍රීවාවයවයෙහ්ගෙණ යොදන්නාවූ, ස්වර්ණ පර්වතයෙන්හැසුනාවූ පළල්වූ ලීලාවක්ෂස්ථලයෙහි ගෙණයොදන්නාවූ, කල්පද්‍රුමයාගේ ශාඛාවෙන් පිරුණුදික් ලීලෝපේතවූ සවරූපයද කැමැති වස්තුදීම් සංබන්ධතාවූ චරිතයද බාහුයුග්මයෙහි ගෙණයොදන්නාවූ, මදසහිතවූ ගන්ධහස්තීහු කෙරෙන් ගමනලීලාවද ඔහුගේ සොඬබඳුවූ ආකාරයද ඌරු යුගලයෙහි ගෙණයොදන්නාවූ, අතිශයෙන් මනොඥවූ මිරින් බබලන රන්කැටපත් සගලකින් ඒආකාරය දෙදනමඬුලුසහිතවූ ජංඝායුග්මයෙහි ගෙණ යොදන්නාවූ, නිරන්තරව උන්නාවූ ශ්‍රීකාන්තාවඇති පද්මයෙන්රත්වූ කෝමලවූ පියුම්පෙත්හෙයි ශ්‍රී පතුල් යුග්මයෙහි ගෙණ යොදන්නාවූ සම

ත්‍රිංශත් පාරමිතාධර්ම්මනැමැති ශිල්පීහු විසින් නිර්ම්මාණයකරණලද අතිශයෙන් දර්ශනීය රූපවිලාසඇති ඒ කුමාරයන්ගේ ආත්මභාවයාගේ වර්ණ්ණනාතොමෝ ශ්‍රද්ධාගෞරව එළවා හෙවත් පමුණුවා.

12. දෙහෙ සුලක්ඛණයුතෙ නවයොබ්බනාඪෙ
තාසුජ්ජලෙ වපසමංහරණාදයෙන
කා වණ්ණනා කමලරූපිනි ජාතරූපෙ
ලොකුත්තරම්පරිමලම්පරිතො වහන්තෙ

මෙසේ යථොක්තවූ ශොභමාන ලක්ෂණයෙන් යුක්තවූ අභිනව යෞවනයෙන් සමෘද්ධවූ ස්වභාවයෙන් පහළවූ සන්හිඳිම්නැමැති ආභරණයෙන් බබලන්නාවූ පද්මයක්ෂටබඳුවූ ස්වරූපඇති රන්කඳක්වැනිවූ ඒ කුමාරයන්ගේ ශරීරයෙහි වර්ණ්ණනාතොමෝ කවරෙක්ද ඒහෙයින් ලෝකෝත්තරවූ මනොඥබව හාත්පසින් උසුලන්නාවූ ඒ සිරිසඟබෝනම් ප්‍රාඥතෙම.

13. දෙසාරයො හදය දුග්ග පුරෙ විජිත්වා
තත්ථාභිසිච්ච සුහදං විය ධම්ම භූපං
අත්ථානුසාසනිම්මස්ස වදං ගිරාය
තප්පවත්තයී සුධී නිජ කායකම්මං

සතුහෙයින් සිත්නැමැති දුර්ග්ගපුරයෙහි රාගවෙෂාදි දෙෂනැමැති සතුරන්ජයගෙණ තමහටමිත්‍රයකු වැනිවූ ධර්ම්මනැමැති රජහු ඒ පුරයෙහිදී අභිෂේකකොට මේරජහු අර්ත්‍ථයෙන් අනුශාසනාව තෙපුලෙන් කියන්නාවූ ප්‍රාඥවූ ඒසිරිසඟබෝකුමාරතෙම ස්වකීයවූ කායක්‍රියාව ඒ වෙහෙරදී පැවැත්වී.

මෙසේ යථොක්ත ක්‍රමයෙන් පළමුවෙනි රාජකුමාරයන්ගේ උත්පත්ති පරිච්ඡෙදයකියා නිමවනලදී.

Digitized by Google

පරිච්. II.

1. ඉක්බිත්තෙන් එක්දවසෙක ඒ කුමාරයන්ගේ මයිල්නඬු මහතෙරුන්වහන්සේ වැඩිවියවයසට පැමිණි සිරිසඟබෝ කුමාරයන් පිරිත්බැණ බණඅසා අනතායෙහි බණවා මෙසේවදාරණසේකි—මහත්භාග්‍ය ඇති කුමාරයෙනි දන්නෙපි දන්නාලද බෞද්ධනම ඇත්තෙහිය දන්නාලද සියලුබාහිරශාස්ත්‍ර ඇත්තෙහි ද්විය අධ්‍යයන අධ්‍යපන උත්ග්‍රහණ ධාරණ ප්‍රභෙද ඇති චතුෂ්ප්‍රකාරයෙන් යුක්තවූ පණ්ඩිතභාවයෙහිද කෙළපැමිණියෙහිය එතකුදුලවත් අභිමානධනකොංටඇත්තාවූ ක්ෂත්‍රිය වංශයෙහි උත්පත්තියද සියලු අඟප්‍රත්‍යඟයෙහි පහළාවූ යෞවන විලාශයෙන් සැරහුණාවූ ශරීරයද එහෙයින් අසදෘශවූ රූපශ්‍රීයද මනුෂ්‍යත්වය ඉක්මුණාවූ කායබලයද යනාමේ සියල්ල ඒකාන්තයෙන්මහත්වූ ප්‍රබලවූ අනර්ථපරම්පරාවෙක ඒ ජාත්‍යදීන් අතුරෙන් එකෙක් එකෙක්ම සියලු අනාචාරයන්ට ස්ථානය හෙවත් කාරණය ඒ යෞවනාදීන්ගේ එකස්ථානයෙහි එක්වීමෙන් වන්නාවූ අනභිවෘද්ධිතමා කියනුව කින්ද—සත්වයන්ගේබුද්ධිතොම සකලශාස්ත්‍ර නැමැතිජලයෙන් ශුද්ධකිරීමෙන් අතිශයෙන් නිර්මලවූවාද බොහෝසේ කලුෂබවට පැමිණේ, අඟනාවූවූ යෞවනයෙන්හටගත්තාවූ ගර්වඇත්තාවූන්ගේ ලබ්ධිතොම නොහරණලද ධවලත්වයඇත්තීද රජස්ථෙහෝ නොහොත් රාගසහිතවූයේමවේ—යෞවන සමයෙහි සත්වයන්ගේ ප්‍රකෘතිතොම තමාගේ ස්වෙච්ඡාවෙන් පුරුෂයා ඉතාදුරට පහකරන්නීදෘෂ්ටිකැඞක්මෙන්දසත් උසනැගාවූ රජෝභ්‍රමණඇති සුළඟින් විසැලි පරබලං පතකටමෙනි අතිශයෙන් නපුරුවූ කෙළවරඇති සත්වයන්ගේ අභ්‍යන්තර වස්තුපරිභොග නැමැති මෘගතෘෂ්ණිකාතොමෝ අනවරතයෙන් පමෙඤ්ඤය නැමැති මෘග

යන් ගෙණයන්නීය, ඒකාරණයෙන් ආස්වාද නොක
රණලද පචකාම විෂයෙහි රසයඇති තාට ගුරුවර
යන්ගේ උපදෙශයට මෙමකලි—අනංගයාගේ ශර
ප්‍රහාරයෙන් දැදුරුවූ තාගේ ලෙහිගුරුවරයන්ගේ අනු
ශාසනාව සිදුරුවූ භාජනයෙක්හි වත්කළ ජලයක්
මෙන් නොරඳ නපුරුවූ ප්‍රකෘති ඇත්තාහුගේ හෘදය
හෝ ඇසූග්‍රන්ථයහෝ වඩ්‍යට කාරණාවේ කුමක්මෙන්ද
සඳුන්වනයෙන් උපන්නාවූ වහ්නිය කුමක්නම් නොද
වාද දවාමැයි, නිවීමටකාරණවූ ජලය කරණකොට
ගෙණ වඩබාග්නියතෝම අතිශයෙන් වඩනොවේද
වඩවේමැයි, ඒකාරණයෙන් ඉතා තරකොට අනුශාස
නාකටයුත්තෙහිවි, ඒ එසේමැයි.

2. පහවූ දෙෂමලඇති සිත්හි ගුරුවරයන්ගේ උප
දේශගුණයෝ සැපසේවදිත් කුමක්මෙන්ද ස්ඵටික
මාණික්‍යයෙහි චන්ද්‍රමරීචිමෙනි—නිර්ම්මලවූ ජලයක් වැ
නිවූ ගුරුවරයන්ගේවචනය අයෝග්‍යයහට කණගෑසූ
උලක්මෙන් හානිය මහත්වඋපදවා, යෝග්‍යයහටවනා
හි ගුරුවචනය තෙම මුඛශොභා සමෘධිය ඉතා අධික
කොට එළවා, කුමක්මෙන්ද හස්තිහට මුඛශෝභාසමෘධි
යට එලූ සංඛාභරණයමෙනි—ආදියක් නැත්තාවූකාල
යෙහිසිඹවූ තෘෂ්ණාවෙන් කසටවූපඤ්චෙන්ද්‍රියයන් අනුචර
කොටඇති සිත කවරනම් අනාර්ය්‍ය නොඑළවාද එළ
වාමැයි—ඒකාරණයෙන් රජකුමරුවන්ටද තාපස්වී
වරයන්ටද ක්ෂාන්තිබලයෙන් ඉන්ද්‍රියයන්ගේ ජයගැන්ම
තෙම මෙලොවින් වනානාවූද පරලොවින් වන්නාවූද
සියලු කුශලසමූහය උපදවා, ඒ ගුරුවරයන්ගේ වච
නය නොවරදවා පිළිපදනාහට ගුරුවරයන්ටහා වෘධ
යන්ට සේවයකිරීම ජණිස ඉන්ද්‍රියවිජයද සමභාවේ, ඒ
කාරණයෙන් තොපවිසින් ප්‍රාණයාගේ කෙළවර
දක්වා බුධාදි වස්තුන් තුන්දෙනාගේ ශරණය පරම

Digitized by Google

ප්‍රතිෂ්ඨාකොට ඇතිබැව්තොමො නොහැරියයුත්තීය පචකාම විශනැමැති වග්නියට ජලශෛකයක් වැනිවූ අනුරාග නැමැති අපස්මාරයාගේ ප්‍රබෝධය නොකට යුතුයි. ඒ එසේමැයි චක්ෂුඉන්ද්‍රියයෙහි ලොල්බව පරම කොටඇති පලගැටියාගේ දිලියෙන්නාවූ ප්‍රදීපශිඛාවෙහි හිමද ශ්‍රොත්‍රෙන්ද්‍රියයාගේ සැපයෙහි යෙදුනාවූ තරුණ මෘගයාගේ සැරපතනයට හමුවීමද ඝ්‍රාණෙන්ද්‍රියයෙහි පරවශවූ භෘඞ්ගයාගේ මත්තහස්තීනුගේ කන්තලින් හිංසාවද ජිහ්වෙන්ද්‍රියයෙහි තෘෂ්ණ ව්‍යසනය ඇත්තාවූ මත්ස්‍යයාගේ බිලියෙහි ගොදුරුගිලීමෙන් වන්නාවූ ව්‍යසනයද ඵස්සෙන්ද්‍රියයෙහි අනුභවයෙන් ලොල්වූ වන්‍යහස්තීනුගේ හස්තිනීන්සං පැමිණි බන්ධනයෙන්වන්නාවූ අනාභිවෘද්ධියද කළණයෙහි අභිනිවේශයකරණ සුදුවූප්‍රාඥතෙම ප්‍රඥදෘෂ්ටීන්ද තිවා කාමිවූ එකකුට ඒ ස්ථානයෙහි රැස්කරණලද මේ පංචෙන්ද්‍රියයන් කරණකොටගෙණ එක්වටෙත්හිම පචාලම්බනයන්ගේ රසසෙවීමෙන් පැමිණියයුතුවූ මහත්වූ දුක්ඛසමූහය නොපරිද්දෙකින් වර්ණිනාකරමෝද නුවණැත්තෝ මේ සුභාසිත වචනයන්ද ඇසිල්ලක් ඇසිල්ලක්පාසා ප්‍රත්‍යවේක්ෂා කෙරේවා සලකාවා.

3. නා'ගාරිකං සුඛමුදික්ඛති කිඤ්චි ධීරො
ජානාති දෙහ පටිජග්ගනම්'ත්තනො චෙ
සංසෙවතො'පි යුවතිං රතිමොහිතස්ස
කණ්ඩූයනෙ විය වණස්ස සුඛාභිමානො

යනුහෙයින්—ශරීර පිළිදැගීම් කාරණහෙයින් ඉදින් දන්නම් රතියෙන් සජාතවූ මෝහඇති නොහොත් රතිවිසින් මෝහකරණලද්දවූ තරුණ ස්ත්‍රී සෙවුනහුගේ සැපයෙහි අභිමානය ව්‍රණයාගේ කඹූතියෙහි වානයක්මෙන් දන්නම් එබඳුවූ ප්‍රාඥතෙම ගෘහයෙහිවූ කිසි සැපයක් නොබලා.

4. කො සෙවෙය්‍ය පරං පොසො අවමානංසහෙය්‍ය ච
න චෙ කලත්ත නිගලං යදි දුක්ඛ නිබන්ධනං *

තවද—බොහෝදුකට කාරණවූ කලත්‍ර නැමැති හැකිල්ල ඉදින් නැත්නම් කවරනම්පුරුෂයෙක් අනිකක්හු සේවනයකෙරේද අන්‍යයක්හුකෙරෙන් අවඥා ඉවසාද නොංඉවසාමැයි.

5. ආකඩ්ඪමානා විසිඛා සමීපං
පරම්මුඛායෙ'ව සදා පවත්තා
දූරම්'පි ගච්ඡන්ති ගුණං විහාය
පවත්තනං තාදිසමෙ'වපීනං

යම්හෙයින්—ශරයෝ තමාලකට අදනාලබන්නාහු පරාඞ්මුඛවූවාහු හැමකල්හි පැවැත්තාහුවෙති ගුණය ද හෝ නොහොත් දුනුදියහැර දුරටයෙති ස්ත්‍රීන්ගේ පැවැත්මත් එබඳුමැයි.

6. අසන්ථුතං කාපුරිසම්'පි අනෙතා
කරොන්ති ආදාස කතා'ව භිත්ති
නෙකත්තිංස වල්ලී විය හත්ථගා'පි
දසාසු සබ්බාසු ච සංකනීයා †

තවද—ඒ ස්ත්‍රීහු පූර්වයෙහි මිත්‍රසන්ථවයක් නැත්තාවූ පුරුෂයාද ඇතුලත්කෙරෙත් තුමක්මෙන්ද දර්පණයෙන් කරණලද්දාවූ භිත්තියක්මෙනි තවද හස්තප්‍රාප්

* මේ පථ්‍යාවත්තනම්—මෙහි ලක්ෂණ [සමෙසුසින්ධු තොජෙන පථ්‍යාවත්තං පකිත්තිතං] දෙවැනි සතරවැනි පාදවල පමණක් (ගුරුලඝුවශයෙන්) වර්ණ සතරකින් පරවූ ජගණයෙවි. [ඒ පාදයන් සහ ඉතිරි එක එක] පාදය වර්ණ අටකින්_වේ.

⌒⌒⌒———⌒⌒⌒ [=8]; ——⌒⌒,—⌒—,— [=8.
—⌒—⌒————⌒ [=8]; ——⌒—,—⌒—,⌒ [=8.

† උපජාතියි—පෙර 51 වැනිපිටේ අඩොලිපිය බලනු. මෙහි පළමුවැනි තුන්වැනිපාද ඉන්ද්‍රවජ්‍රයි. ඉතිරිපාද උපෙන්ද්‍රවජ්‍රායි.

Digitized by Google

තවූද දූලයේ මුවහත්ඇති කඩුපතක්මෙන් සියලු දසා වෙයි සැකකටයුත්තාහුද වෙත්.

7. අනොතාරුඪා බහිඬා'පි නිස්සාසා විය නාරියො
කරෙන්තිනාසමෙ'වස්සකොධිමා තාසු විස්සසෙ *

තවද ස්ත්‍රීහු ඇතුළත්හි රුඳුවාහුද පිටත රඳවන ලද්දාහුද නාසිකාවෙන් පිටතට ඇතුළතට නික්මෙන් නාවූ ශ්වාසයක්මෙන් තමාරක්‍ෂාකාළ පුරුෂයාට විනාශයක්ම කෙරෙති ඒ එසේමවූ ස්ත්‍රීන් කෙරෙහි කවර නම් ප්‍රාඥයෙක් විශ්වාසකෙරේද ඇදිහිලිකෙරේද ඇදිහිලි නොකරන්නේමැයි.

8. මංනාසං පාප සනානිනානං අපායා විවටානනා
සමනතා පාපමිත්තාච මොකොධා සබ්බභයාකරං

තවද මේ ලෝකයෙහි සත්වයන්ගේ සිත අකුශලයට නැමෙන්නේය නරකාදි සතර අපායයෝ ඔවුන්ට හරණලද මාරයන් ඇත්තාහ—හාත්පසින් වටින් පවිටු මිත්‍රයෝම ඇත්තාහ එහෙයින් උක්තප්‍රකාර නරකාදි භයින් කෙසේ මිදීමෙක් ගැලවීමෙක් වේද නොවන්නේමැයි.

9. තවද කියයුතු අවවාදයෙක්ඇති. පින්වත්වූ කුමරුව තොපගේ සිත්නැමැති රුක්සිදුරගතකොට ඇති ක්‍රොධ නැමැති සර්පරාජතෙම කිසිකාලෙකත් පිටත්හි නොකටයුත්තේයි වැළි කුමක් කටයුත්තේද සහනයකිරීම් ඉවසීම් නැමැති මන්ත්‍රයෙන් මදකුත් නොසැලියයුතුබවට පැමිණ වියයුතුයි.

---

* මෙත් උපජාතියි—මෙහි තුන්වැනිපාදය පමණක් ඉන්ද්‍රවජ්‍රායි. ඉතිරි තුන්පාදය උපෙන්ද්‍රවජ්‍රායි.

Digitized by Google

10. සතං තිතික්ඛං තචවෙ විගුණ්ඨිතං
සිඤ්ඤං දුරාලාපඛනා ඛලානං
සභා පසංසං කුසුමතතාමෙ'තා
නිබජ්ඣරෙ තා ගුණමාලිකාය

දුර්ජනයන්ගේ පරුෂ වචන නැමැති සැරයෝ සත්පුරුෂයන්ගේ ඉවසීම් නැමැති සන්නාහයෙහි හැනී මොටවූවාහු සත්පුරුෂ සභායෙහි ප්‍රශංසා නැමැති පුෂ්පභාවයට පැමිණියාහු ඒ සත්පුරුෂයන්ගේ ගුණනැමැති මල්දම්හි බඳනාලැබෙත්.

11. ලොකාධිපච්චං විපුලෙ ධනෙ ච
මනොනුකූලෙ තනයෙ ච දාරෙ
ලද්ධා'පි යා යෙති න ජාතු තිත්තිං
බාධෙතු සා තං න පපඤ්ච තණ්හා

තවද—යම් තෘෂ්ණාවක්තොම ලෝකයහට අධිපති බවද නොහොත් ඉසුරු බවද බොහෝවූ ධනයන්ද සිතට අනුකූල පුත්‍රදාරවන්ද ලැබත් කිසිකලෙකත් තෘප්තියකට නොයේද සත්වයන් සසර ප්‍රපඤ්චකරණ හෙයින් ප්‍රපඤ්චනම්වූ තෘෂ්ණාතොමෝ තොප නොපෙලාවා එහෙයින් තෙපි වස්තුකාමයෙහි ලොභය නොකරව්.

12. වණ්ණප්පසාදා යසසා සුඛා ච
ධනා ච භායන්තු'පජීවිතා ච
යෙනා'භිභූතා රිපුනො'ව සන්තා
දොසග්ගි සො තෙ හදයං ජහාතු

තවද—සතුරකුවැනිවූ යම් ද්වේෂයක්හු විසින් මඩනාලද්දවූ සත්වයෝ ශරීරවර්ණයෙන්හා මුඛප්‍රසාදයෙන්ද පිරිවරින්ද නොහොත් කීර්තියෙන්ද කායික චෛතසික සැපයෙන්ද උපභොග පරිභොග වස්තුවෙන්ද තමානිසා ජීවත්වන්නාවූ ජනයාකෙරෙන්ද යනාමි

සියල්ලෙන් පිරිහෙති, එහෙයින් ඒ වෙෂනැමැති වහණිතෙම තොපගේ චිත්තසන්තානයෙහි හටනොගන්වා.

13. ඛෙදෙ විපත්තිසු පටික්‍රියා න
තස්මා න දීනප්පකතිං භජෙය්‍ය
පඤ්ඤානුයාතං විරියං වදන්ති
සබ්බත්ථ සිද්ධිග්ගහණග්ගහත්ථං.

තවද—තමහට ආපදුවක් දුකක් පැමිණිකල්හි සිත ට උපදනාවූ ඛෙදය තෙම ප්‍රතික්‍රියාවෙක් පිළියමෙක් නොවේද ඒ කාරණයෙන් බැගෑබව නොසෙව්නේය වැලි කවරක් සෙව්නේදයත් ප්‍රඥාව අනුවගියාවූ සියලු පුරුෂාර්ථසිද්ධියගේ ගැන්මට අග්‍රහස්තයක් වැනිවූ වීර්‍ය ප්‍රධාන කාරණයයි ප්‍රාඥයෝ කියත් එහෙයින් තමාගේ බැගෑබව නොහහවා වීර්‍ය වැඩීමෙහි උත්සාහකරව්.

14. ව්‍යාපාරසබ්බ භූතානං සුඛත්ථාය විධීයරෙ
සුඛඤ්ච න විනාධම්මං තස්මාධම්ම පරොභව, *

යම්හෙයින් තවද මේ ලෝකයෙහි සියලු සත්වයන්ගේ වීර්‍යයෝ සැප පිණිස කරනුලැබෙති කුශලධර්මය හැර වන්නාවූ සැපයෙක් යම්හෙයකින් නැත්තේද

15. එහෙයින් කුශලධර්මයෙහි තත්පරව පවතුවයි කියා මේආදීන් යථොක්තවූ සත්පුරුෂයන්ගේ නීතිමාර්ගය මසිල්නාඬු මහතෙරුන් වහන්සේ වදරනකල්හි

* මෙත් පථ්‍යාවත්තනම්. එහි ලක්ෂණ 58 වෙනි පිටේ පෙන්නූයේවූ. යළිත් මේ දෙවෙනි වර්ගයේ වෙනස මෙසේ සලකනු.

⌒ ⌒ ⌒ ⌒ — ⌒ ⌒ ⌒, [=8] — ⌒ ⌒ —, — ⌒ —, ⌒ [=8.
— ⌒ — — — ⌒ ⌒ ⌒, [=8] ⌒ ⌒ ⌒ —, — ⌒ —, — [=8.

ඒ ස්වාභාවිකවූ කළණගුණ ධර්මඇති කුමාරයන්
විසින් නොඇසිය යුතුබැව්යයි කියනලද අනාදරයෙන්
කරනලද හකුළුවනලද මුහුණුඇත්තාවූ විසින්හෝ
ඉවත එළවනලද ඇස්ඇත්තාවූ විසින් හෝ අහංකාර
පරවශයෙන් ඇතුන්ගේ බැල්මකට බඳුවූ බැල්ම කර
න්නාවූ විසින් හෝ නොව තමන්ගේ නුවණ අධිකබව
නොසිතන්නාවූමෙන් හෙවත් නුවනනැති කෙනෙ
කුන්සේ මානරහිතවූ, මුදුනෙහිපිහිටුවනලද කොම
ලවූ දෙහොත් ඇතිවූ, තන්නින්නතත්පොණතත්
ප්‍රාග්භාරයෙන් යුක්තවූ ඉසින් උපලක්ෂිතවූ, වැද ප්‍රී
තින් උපන්නාවූ සාධුකාර වචනයෙන් පිරුණාවූ
කපොලස්ථල ඇති මුඛයෙන් උපලක්ෂිතවූ, වැද සියලු
ශරීරාවයවයෙහි පතළාවූ ලොමුදැහගැනීම් නැමැති
සැටටඇති ශරීරයෙන් උපලක්ෂිතවූ, වැද භූමියෙහි
වැදහෙවූ දීර්ඝ ප්‍රණාමයෙන් හෙවත් දඬනමස්කාර
යෙන් වැදීමකරණ සවභාවකොටඇති ඒ සිරිසඟබෝ
කුමාරයන් විසින් මාර්ගඵල ලැබීමටවඩා ලාභයක්
මෙන් අතිශයෙන් විශිෂ්ටවූ සන්තොෂය පහලකිරීමවී.

මෙසේ දෙවෙනිවූ අනුශංසනාකිරීම සංඛ්‍යාතවූ
පරිච්ඡෙදය කියා නිමවනලදී.

පරිච. III.

1. එතැන්පටන් යථොක්තවූ ප්‍රතිපත්තීන් නොව
රදවා හැසිරීමෙන් සන්තුෂ්ටවූ මයිල්නාඳු මහතෙරුන්
වහන්සේ ඒ කුමාරයන්ගේ සංඝබෝධි යනනාම සඟ
වනු කැමැතිසේක් ධාර්මිකයයි ව්‍යවහාරයක් කැරවූ
සේක.

2. සාමුද්‍රිකා ලක්ෂණ දන්නාවූන්ගේ වචනය අද සනාසේක් බැනනුවන් මහණවනු කැමැත්තාන්ද මහණනොකොට මෙතැන්හි විසිමවත් වඩා අනුරාධපුරයෙහි විසීම කුමාරයන්ට නිසිනය එලවන්නේය ඔහුගේ කුශලානුරූපයෙන් උපදනා විපාකයට සෞභාදවෙයි රුවන් වැලි * මහසෑයට වත්පිළිවෙත් හැසිරීමෙන් මහත්වූ කුශලරාසියද සමෘඬවන්නේයයි සිතාන සේක් ඒ දැහැමි සිරිසඟබෝ කුමාරයන් කැඳවාගෙන අනුරාධපුරයට යනුකැමැතිවූ නික්මුණුසේක. ඒ සමයෙහි සංඝතිස්සනම්වූද ගොඨාභය නම්වූද අනිකුත් ලැමැණි පක්ෂයේ රාජකුමාරවරු දෙදෙනෙක් ඒ කුමාරයන්ගේ වැලිතෙළයෙහි පටන් යහළුවහ එහෙයින් ඔහු ඒ කුමාරයන් හා සමග නික්මුණාහ ඒ කුමාරවරුන් තුන්දෙනා කැඳවාගෙන වඩනා මහතෙරුන් වහන්සේ උන්නැමට පළමුකොට අනුරාධපුරයට වන්සේකි. ඒ කුමාරවරුන් තුන්දෙනා මහතෙරුන් වහන්සේ අනුව යනකල්හි හැමදෙනාටම වැඩිමහලුවූ සංඝතිස්ස කුමාරයෝද මධ්‍යයෙහි යන්නාවූ සංඝබෝධි කුමාරයෝද පස්සෙහි යන්නාවූ ගොඨාභය කුමාරයෝද යනමොහු තුන්දෙනම පිළිවෙළින් තෙරුන්වහන්සේ අනුව යන්නාහු තිසාවැව පෝරුහෙයින් යෙති.

3. ඒහේ මත්තේ නෑගු ශාලාවෙහි උන්නාවූ කිසිම දුස්නෑති නුවනැති බමුණෙක් ඒ කුමාරවරුන් තුන්

---

* මෙපදය සිංහලපොතේ තිබෙන්නේ "රුවන්මැලි" කියායි. "රතනවාලුක" "රතනමාලික" කියාපාලියෙහුත් දෙයාකාරයක් තිබේ. එහෙත් බොහෝ සිංහලපොත්වල සහ ව්‍යවහාරයෙත් "රුවන්වැලිසෑය" යයි පෙනෙනාබැවින්, එලෙස මේවචනය හරි ගස්සාලමු.

දෙනාගේ පතුල්තබන ශබ්දය අසා ශාස්ත්‍රලක්ෂණයට අනුව සිහිකෙරෙමින් නුවනින් පරීක්ෂාකොට මොහු තුන්දෙනම සිංහල විපයෙහි පෘථිවිශ්වර වෙතියි ඒ ශාලාවෙහි උන්නන්ට ප්‍රකාශකොට කීයේයි. ඒ වචන හැමට පස්සෙහි යන්නාවූ ගෝඨාභය කුමාරයෝ අසා තමන්ට ඉදිරියෙහි යන්නාවූ අනික් රජකුමරුවන් දෙදෙනාට නොහඟවා නැවත ඒ බමුණාකාර අවුත් ඒ තුන්දෙනා අතුරෙන් කවරෙක් බොහෝකලක් රජකම්කෙරේද රාජවංශයෙහි ස්ථිතාය කෙරේදැයි විචාළ පස්සෙහි යන තැනැත්තෝයයි කී කල්හි වඩවඩාලා සතුටුවූයේ ඔදවැඩියේ අතිශයෙන් වහා අවුත් ඔවුන්හාසමග යන්නේ තීක්ෂණවූ ප්‍රඥා ඇතිහෙයින්ද අතිශයෙන් ගැඹුරු බැවින්ද කිසිවක් හට නොහඟවා ඇතුළු නුවරට වන්නේය, එදවස් ඔවුන් තුන්දෙනම තමන් සුදුසුවූ තැනක නවාතැන් ගත්තාහුය.

4. ඉක්බිති හැමට බාලවූ ගෝඨාභය කුමාරතෙම මොහු දෙදෙනම සවල්පවූ ආයුස ඇත්තාහුය රාජ්‍යයෙහි පිහිටියාහුද බොහෝකලක් ජීවත්නොවෙත්ල එහෙයින් මම්ම ඔවුන්ට රාජ්‍යය දෙවමියි රාජ්‍යලාභයට සුදුසුවූ උපායෙන් පිළිපදනේ ඔවුන්ට රාජ්‍ය ලාභය පිණිස උපායදක්වන්නේ ඒකාවන්ව මන්ත්‍රණය කෙරේ. වැඩිමහලුවූ සංඝතිස්ස කුමාරයෝද ඒ ගෝඨාභය කුමාරයන් කෙරෙහි අතිශයෙන් ප්‍රියකරන්නේ ඒ ගෝඨාභය කුමාරයන් විසින් දක්වනලද උපදේශයෙහි හැසිරෙන්නේ ඒ නුවර රජ්ජුරුවන් දැකගෙන ලබනලද සම්මානඇත්තේ සියලු රාජකටයුත්තෙහි පෙරදැරිවැ නොබෝකලකින්ම රජහට වල්ලභවූයේයි, ඒ සමයෙහි රාජ්‍යකරන්නාවූ විජයරාජනම් ක්ෂත්‍රිය රජතෙම ඒ සංඝතිස්ස කුමාරයන් කෙරෙහි

ප්‍රසන්නවූයේ සියලුරජකටයුත්තෙහි සංඝතිස්ස කුමාර යන්ම ප්‍රධානකොට සෙනෙවිරත් තනතුරට පැමිණ වූයේය.

5. ධාර්මික කුමාර වනාහි රාජ්‍යය නොකැමැති බැවින් රාජ්‍යලාභයට සිතිවිල්ලකුදු නොකොට උදක් ඒ නන්දමහ තෙරුන්වහන්සේගේ අනුශාසනා පමණකින්ම රජහට සේවයකරන වේලාවෙහි අනුව හැසිරීම්පමණක් කරන්නේ රජගෙට වැද ඒ මාලිගාවෙන් ඔවුන්හාසමග නික්ම සවස ඒ ධාර්මික කුමාරයෝ තුමූ මහතෙරුන්වහන්සේගේ විහාරයෙහිම වසන්නේ තමන්ගේ ධාර්මිකවූ අනුෂ්ඨානය නොපිරිහෙලා රුවන්වැලි මහසෑයට කළමනා උපස්ථාන ගිලනුන්ට උපස්ථානකිරීම් ආදිවූ නිරවද්‍යවූ ධර්මයෙහි හැසිරෙමින් දවස් යවන්නේයි.—

6. ඒසමයෙහි සංඝතිස්සනම් සෙනෙවිරත්තෙම සියලු රාජ්‍යසැද තමන් හස්තප්‍රාප්තකොටගෙන එක් දවසෙක්හි ලබනලද අවකාශඇත්තේ රජහු ඇතුළු රජගෙසිදීම ගෝඨාභය කුමාරයන්ලවා මරවා ඒ සෙනෙවිරත්තෙමෙ රාජ්‍යයට පැමිණියේයි.

අනුරාධපුරයට වැදීම් සංබන්ධවූ තුන්වන පරිච්ඡෙදය කියා නිමවනලදී.

පරිච්. IV.

1. ඉක්බිති ඒ ගෝඨාභය කුමාරතෙම ධාර්මිකකුමාරයන් නොකැමැත්තාහුද සෙනෙවිරත් තනතුරෙහි පිහිටුවා තෙමෙ ඉදිරිබලං භාණ්ඩාගාර නායකවී—ඉක්බිත්තෙන් සංඝතිස්සනම් රජතෙම බොහෝවූ කුශල

ශන්ද අකුශලයන්ද රැස්කරන්නේ දියදඬ විලිතුන් සමයෙහි සේනාවහා අමාත්‍යයන්හා අන්තඃපුර වාසීන් සහිතවූයේ එකාවන්වූ, නැගෙනහිරි දිශාවට ගොස් දඬ අනුභවකරන්නේය මෙසේ රජහුගේ බොහෝ සේ යාචිරමෙන් පීඩිතවූ රාජ්‍ය වාසීහු රජහට අභ්‍යන්තර පරිභොගයට සුදුසුවූ දඬ පලයෙහි විෂයෙදූහ. ඉක්බිත්තෙන් ඒ සංඝතිස්සනම් රජතෙම විෂයෙන් මිශ්‍ර දඬ අනුභවකළ තැනදීම කාලක්‍රියා කෙළේයි.

2. ඉක්බිතෙතන් ගොඨාභය කුමාරතෙම දූස්නැති බමුණන්ගේ පළමුකී වචනය සිහිකරන්නේ පිළිවෙළින් රාජ්‍යයදෙවා පසුව මම රජකමට පැමිණෙමියි සිතන්නේ අමාත්‍යයන්හා සේනාව සහිතවූයේ සංඝබෝධි කුමාරයන් රාජ්‍යයෙන් පැවරී—ඉක්බිත්තෙන් සංඝබෝධි කුමාරතෙම තොමේ මහබෝසතානන් විසින් දක්නාලද ආදීනව ඇතිබැවින් රාජ්‍යශ්‍රීයැපයාගේ නොහැරීමෙන් අනුභවකරනලද මහත්වූ දුක්ඛ සමූහයන් සිහිකොට නැවැත රජකමට ආරාධනාකරනුලබන්නේ ප්‍රතික්ෂෙප කෙළේයි නොඉවසූයේයි—ඉක්බිත්තෙන් ගෝඨාභය නම් භාණ්ඩාගාරිකතෙම තමී නියංගම් රාජධානිවල්හි සියලුමනුෂ්‍යයන්ද රැස්කරවා ඔවුන්හා සමග නොයෙක්පරිද්දෙන් යාචඤාකරනුලබන්නේද ගිවිස්වාගන්ට නොපොහොසත්වී—ඉක්බිත්තෙන් ඒ සියලුම රටවැස්සෝද අමාත්‍යයන් සහිතවූවාහු රුවන්වැලිමහසෑ විහාරයට මහසංඝයාවහන්සේ රැස්කරවා ඒ සඟමැද සංඝබෝධි කුමාරයන්ට නැවතත් යාචඤාකළාහුය—ඒ යාචඤාකළාවූ කාලයෙහි සංඝබෝධි කුමාරතෙම භූමියෙහි වැදහෙව මහසංඝයාවහන්සේට නමස්කාරකොට ලබනලද අවකාශඇත්තේ අෂ්ටනිශ්‍රදෘෂ්ටි දෙෂවර්ජිතවූ, එකත්පස්ව හිඳ මෙසේ රාජ්‍යකිරීමෙහි ආදීනව කියන්ට පටන්ගත්තේයි.

3. ඒ කෙසේදයත්—"මේ රාජ්‍යශ්‍රීයනම් යම් යම් පරිද්දෙකින් බබලාද ඒ ඒ පරිද්දෙන් කපුරු පාන්සිළුක් දැලිකිළුටකටමෙන්ව ශුද්දක් නොයෙක්කටයුතු උද්ගිරණයකෙරෙ උපදවා. ඒ එසේමැයි—මේ රාජ්‍යශ්‍රීතොම තෘෂ්ණා නැමැති විෂලතාවන්ගේ වැඩීමට ඇතිකිරීමට ජලධාරාවක් වැන්නීය. පංචේන්ද්‍රිය නැමැති මෘගයන්ට වැද්දන්ගේ ගීතිකාවක් වැන්නීය සුචරිත නැමැති සිතුවමට වැදගත්තාවූ ධූමරශියක් වැන්නීය මෝහ නැමැති නිද්‍රාවන්ට විභ්‍රමශය්‍යාවක් වැන්නීය ප්‍රඥා නැමැති චක්ෂූන්ට පහලවූ ඇඳිරියක් වැන්නේය අනාචාර නැමැති මහසේනාවට ඉදිරියෙහි හැසිරෙන්නාවූ පතාකාවක් වැන්නීය ක්‍රෝධවේග නැමැති කිඹුලුන්ගේ උපැත්මට ගඟාවක්වැන්නීය මිථ්‍යාදෘෂ්ටි නැමැති යෞවන ස්ත්‍රීන්ට සුරාපානභූමියක් වැන්නීය, ඓශ්වර්ය විකාරනැමැති නළුවන්ට ගීතිකාශාලාවක් වැන්නීය, දෝෂ නැමැති සර්පයන්ට සැතපෙනගල්සිදුරක් වැන්නීය, සත්පුරුෂ ව්‍යවහාරයන්ගේ දුරුකිරීමට වේවැල් කම්බුවක් වැන්නීය, සත්පුරුෂ චරිත නැමැති හංසයන්ට අකාල මේඝයක්හුගේ පැමිණීමක් වැන්නීය, චපාප්‍රයෝග නැමැති නළුවන්ට නාටකශාලාවක් වැන්නීය, කාමතෘෂ්ණා නැමැති හස්තිහට කෙහෙල්ගසක් වැන්නීය සත්පුරුෂබවට වධ්‍යශාලාවක් වැන්නීය, ධර්ම නැමැති චන්ද්‍රමණ්ඩලයට රාහුමුඛයක් වැන්නෙය, සුපුරුදුකරනලද්දවූද මේ රාජ්‍යශ්‍රිය විසින් අත්‍යර්ථයෙන් වලදනාලද්දවූ යමෙක් විප්‍රලබ්ධ නොවීද විරුඞ ප්‍රකෘති ඇත්තේ නොවීද එසේවූ එකකු නොදකිමි.

4. "තවද කියයුත්තෙක්ඇති—මූර්ධාභිෂික්ත රජදරුවන්ගේ අභිෂේකකරන සමයෙහි මඟුල්කලස ජලයෙන්මෙන් දක්ෂිණ්‍යය ශුඞකිරීමට පැමිණේ, හෝම

භූමියෙන් කිලුටුවගියාක්මෙන් හෘදය කිලුටුවේ, පුරෝහිත බ්‍රාහ්මණයාගේ ඊර්ෂ්‍යාඅගින් හැමදීමෙන් පහවගියාක්මෙන් සහනයකිරීම් තොමෝ පහකරනුලැබේ උෂ්ණීෂපට්ටයාගේ බැඳීමෙන් මුවාව ගියාක්මෙන් ජරාවගේ පැමිණීම දක්මවසනුලැබේ—ධවලච්ඡත්‍රයාගේ මඬළයාගෙන් මුවාවූ ගියාක්මෙන් පරලෝබැලීම මුවාකරනුලැබේ චාමරපවනින් ගසාදුරුකළාක්මෙන් සැබෑකිම්තොමෝ ගසා දුරුකරනුලැබේ වේවැල්කම් වූවෙන් දුරුබාගියාක්මෙන් සත්පුරුෂ ගුණයෝ දුරට පහවයෙත්.

5. "රාජ්‍යශ්‍රී නැමැති රාගයෙන් මත්වූ සමහර රජදරුකොනෙක් තමන්ට ප්‍රයෝජන උපදවාගැන්මෙහි තත්පරවූ ධනනැමැති මාංසයකැමෙන් ගිජුලිහිණියන් වැනිවූ සභානැමැති විලට කොකුන් වැනිවූ ධූර්තයන්හා දූකෙළීම විනෝදයෙක රාජනීතියෙකැයි කියාද අනුන්ගේ දාරාවන්කරා යාම විදග්ධබවෙක දක්‍ෂබවෙකැයි කියාද මුවදඩයාම ශරීරයට ව්‍යායාමයෙක උගතයුතු සරමයෙකැයි කියාද රාපීම් ලීලාවෙකැයි කියාද නිරන්තරයෙන් ප්‍රමාදබව ශූරබවයයි කියාද ස්වදාරාවන් හැරීම වැසන නැතිබවයයි කියාද ගුරුවරයන්ගේ වචනය නොකිරීම පරමප්‍රත්‍යයෙන් නොපැමිණියයුතුබවයයි කියාද හෙවත් අනුන්ගේ බස් අදහ නොගැන්මයයි කියාද දෙවියන් පෝෂ්‍යකිරීම සැප සෙවියයුතු බවයයි කියාද නෘත්‍යගීතාභාවේශ්‍යාවන් කෙරෙහි ශක්තබැව් තොම රසිකබව කෙරේයයි කියාද ස්ත්‍රීන් පරාජයෙන්වන පරිභවය සහනයකරනබව ක්‍ෂමායයි කියාද ස්වෛරවාසය තමා සිතුවත් කියා කොට වසනබව පණ්ඩිතබවයයි කියාද හට්ටජනයාගේ වචනය යශෝඝෝෂාවෙකැයි කියාද චපලබව උත්සාහයෙකැයි කියාද විශේෂඥ නොවනබව පක්‍ෂපාත නොවනබවයයිකියාද මෙසේ දෝෂ සමූහයද

ගුණ පක්‍ෂයෙහි ආරොපණය කරන්නාවූ තුමූද තමන්
අතුරෙහි හාසකරන්නාවූ සතුටුකරවන්නාවූ සතුති
යෙහි දක්‍ෂවූ ධූර්ත්තයන් විසින් මනුෂ්‍යලෝකයට උචිත
නොවන්නාවූ සතුතියෙන් පතුරුවනු ලබනනාවූ
වර්ණනාකරණු ලබනනාවූ වසතුමදයෙන් මත්වූ
චෙතනාරගිතාවූ සිතින් එසැබැවැයි තමාකෙරෙහි
ආරොපණය කරන්නාවූ නපුරුවූ සිත්ඇත්තාහු මනු
ෂ්‍ය සවභාවවූවාහුද දෙවියන්ගේ අවයවයකට බවූවාක්
වැනිවූද දෙවියන්හා සමානබවක් වැනිවූද මනුෂ්‍ය
ත්‍වය ඉක්මූනාක් වැනිවූද තමන් අහනාහු පටන්ගත්
නාලද දිව්‍යයන්ට සුදුසුවූ ක්‍රියානුභාව ඇත්තාහු සියලු
ජනයා විසින් අපහාසකටයුතුබවට පැමිණෙත්—
තමන් අනුව රැකෙන්නාවූ ජනයා විසින් කරණුලබ
න්නාවූ අංතමයාගේ විඩම්බනයටද සිතින් සතුටුවෙත්.*

6. දෙවතාවන් තමන්කෙරෙහි ආරූඪකිරීම් සං
බන්ධ වර්ණනාවෙන් සමභාවනාවෙන් පහකරණු
ලද්දාහුද ශරීරභ්‍යන්තරයට වන්නාවූ අනික් බාහු
යුගමයක් ඇත්තේයයි තමන්ගේ ආතමභාවයද සමභා
වනා කෙරෙත් තමන්ගේ නලලද සිවින් ව්‍යවගිතාවූ
නේත්‍ර ඇත්තේයයි ශංකාකෙරෙත් වංචා සම්භාවනා
වෙන් පිරුණ ගව්ඇත්තාහු දේවතාවන් නොවදිත්
සම්ත පාපීවූද බාහිත බපාපීවූද ශ්‍රමණ බ්‍රාහමණයන්
නොපුදත් ආදරකටයුත්තාවුන්ට ආදර නොකෙරෙත්
ගුරුවරයන් දක්මෙහිද නොඑළබෙත් ප්‍රයෝජනයක්
නැත්තාවූ කාෂාය වස්ත්‍රයෙන් ව්‍යවගිතාවූ විෂයෙහි

* කාදම්බරියේ ශුබනාස බ්‍රාහ්මන පණ්ඩිතෝත්තමයාවිසින්
චන්ද්‍රාපීඩ කුමාරයාහට කළ අනුශාසනා අනුසාරයෙන් මෙ කාණ්
ඩය ලියා තිබෙනබැව් හඟිමු. ඒ දක්වන පිණිස කාදම්බරියෙන්
කොටසක් මතු සන්නසහිතකොට දක්වන්නෙමු.

අනුභව සැපය ඇත්තාහයි තපශ්විවරයන්ට අපහා ස්‍යකෙරෙත් වෘද්ධජනයාගේ උපදේශ ජරාවෙන් මඩ නාලද්දවුන්ගේ ප්‍රලාපයෙකැයි නොඅසත් තමන්ගේ ප්‍රඥාවට පරිභවයයි අමාත්‍යයන්ගේ උපදේශයට ඊර්ෂ්‍යා කෙරෙත් ඒකාන්තයෙන් හිතයක් කියන්නවුන්ට කිපෙත්. මේආදී කාරණයෙන් බොහෝවූ දෝෂ යන්ට උත්පත්තිස්ථානවූ රාජ්‍යසම්පත් මම නොකැ මැත්තෙමියිකී.

7. ඉක්බිත්තෙන් මහජනයා විසින් ආදරසහිතවූ ආරාධනා කරනලද මහසංඝතෙම කුමාරයන්ට අභි මුඛව අනුශාසනා කරනසේකි, “මහත්වූ භාග්‍යඇතී කුමාරයෙනි යම්සේ තනපුබ්බුවෙහි එලූනාවූ පූඩාතො මෝ තියුණු බෑහමෙන් ඒ තනපුබ්බුවෙහි දුක්ඛවේද නාව උපදවන්නේ ලෙහෙම ඇදගනීද කිරිබොංන දරුතෙම වනාහි කොමලවූ මුඛපුටයෙන් වැදූ මෑනියන්ට සැපසංඥාව උපදවන්නේ කිරි යම්සේ ඇද බෝද ඒපරිද්දෙන්ම රාජ්‍යසම්පතටද පැමිණියාවූ නුව ණැතතාවූ අඥානතෙම බොහෝවූ අකුශලයන් රැස්කෙරෙයි ප්‍රසස්තවූ ප්‍රඥාඇති ධීරපුරුෂවනාහි ආයු සංස්කාරයාගේ දුර්වලබවද ධනසමූහයාගේ නැසෙන සුලුබවද ප්‍රඥාවෙන් පරීක්ෂාකොට දශකුශලකර්ම යන් පූරන්නේ එබඳුවූ මහත්වූ භෝගරාශියෙන් මහ ත්වූ කුශලසමූහයන් රැස්කෙරෙයි එහෙයින් තෙපි කරනලද කුසල් ඇත්තෙහිද විය මහබෝසතුන්ගේ ධුරය දරන්නෙහිද වූයෙහිය මෙබඳු කුශලකරණයට ස්ථානයලැබ දැහැමෙන් සෙමෙන් ලෝකාරක්ෂාක රන්නේ සර්වඥශාසනයට සංග්‍රහකරන්නේ දානපාරමි තාව කෙළපැමිණියාක්කොටැ පසුව ගෘහාභිනිෂ්ක්‍රා මණයද කරන්නේ සතතිස්බෝධ පාක්ෂිකධර්මයන් රක්ෂාකරවයි කියා අනුශාසනාකොට වදාළසේකි.

Digitized by Google

8. ඉක්බිත්තෙන් මහත්වූ අධ්‍යාශයඇති උත්තම පුරුෂවූ සිරිසඟබෝ කුමාරතෙම මහාසංඝයාවහන් සේගේ අනුශාසනාව ඉවසනට අසමර්ථවූයේ ඉවසී. ඒ අනුශාසනාවට ඉක්බිතිවද මහජන සමූහතෙම සංඝයාවහන්සේගේ අනුඥාවෙන් සියලු සිංහලද්වීපය ඒකච්ඡත්‍රකොට අභිෂේකකොට දැහැමි සිරිසඟබෝ රජයයි ව්‍යවහාරයක් කෙළේයි. ගෝඨාභය භාණ්ඩාගාරිකයාද සෙනෙවිරත් තනතුරෙහි තිබී.

9. දානං අදා ධාරයි නිච්ච සීලං
වඩ්ඪිතිතික්ඛං හජී අප්පමාදං
පජාහිතජ්ඣාසය සොම්මරූපො
ධම්මොවසො විය්‍යාහවා විරොචි. *

යනුහෙයින් මෙසේ දැහැමි සිරිසඟබෝ රජතෙම යථොක්තවූ දශවිධදානය සියලු ශ්‍රමණබ්‍රාහ්මණයන්ට දින නිරන්තරයෙන් පඤ්චසීලයදැරීය අපරාධ සහනය ක්ෂමාව උපහනයකෙළේය ප්‍රමාදනොවනබව කුශල කරණයෙහි අප්‍රමාදබව සේවනය කෙළේය සියලු ප්‍රජාවකෙරෙහි හිතවූ අදහසින් සෞම්‍යවූ ස්වරූප ඇත්තේ මූර්තිමත්වූ ධර්මජාතයක්මෙන් බැබළුන ඒ එසේමැයි.

10. විඤ්ඤාය ලොකස්සහි සො සභාවං
පධානවත්තානු ගතිප්පධානං
නිබෙතුකාමො ජනතාසු ධම්මං
සයම්පි ධම්මාචරණමහි සතතො. †

---

* මෙ උපජාති—තුන්වෙනි වෘත්තයයි. මෙහි පළමුවෙනි සතරවෙනි පාද ඉන්ද්‍රවජ්‍රයි—ඉතිරි උපේන්ද්‍රවජ්‍රයි සලකනු.

† උපජාති—සතරවෙනි වෘත්තයයි. මෙහි පළමුවෙනි පදේ පම තක් ඉන්ද්‍රවජ්‍රායි—ඉතිරිපාද උපේන්ද්‍රවජ්‍රායි සලකනු.

Digitized by Google

ඒ දැහැමි සිරිසඟබෝ රජතෙම ලෝකයාගේ සවභාවය සවබුඩින් දැන සතරසම්‍යක් ප්‍රධාන වෘත්තිය අනුව ගියාවූ වියඞ්ඇති කුශලධර්ම්‍ය ජනයා කෙරෙහි පිහිටුවනු කැමැත්තේ තෙවේද ධර්ම්යෙහි හැසිරීමෙහි ශක්තාවී ඇලුණේයි.

රාජාභිෂෙක සංබන්‍ධනාවූ සතරවන පරිච්ඡෙදය කියා නිමවනලදී.

පරිච්. V.

1. ඒ දැහැමි සිරිසඟබෝ රජතෙම රුවන්වැලි මහවිහාරයෙහි මහඇඟිවූ විසල්වූ ලාබත්කරවා නොයෙක් දහස්ගණන් භික්‍ෂූන්වහන්සේට නිරන්තරයෙන් ලහබත් පැවැත්වී. මයිල්නානු මහතෙරුන්වහන්සේටද සවකියවූ නාමයෙන් මහත්වූ දැහැමි සිරිසඟබෝ නම් පිරිවෙන් විහාරයක්කරවා නොයෙක් කප්පිය භාණ්ඩයන්හා සමඟ පරිවාරසහිතවූ ග්‍රාමක්‍ෂෙත්‍රයන් සංඝයාවහන්සේගේ පරිභෝගයට සුදුසුකොට දෙවී. තවද නිරන්තරයෙන් මධ්‍යම රාත්‍රියෙහි රහස්ගතවූයේ කායිකවිවේකයට පැමිණියේ අප මහබෝසතුන්ගේ මාංසදානාදී නොකටහැකි චරිතයන් සලකන්නේ එබඳුවූ චරිතයන් තමාකෙරෙහි පිහිටුවන්ට ප්‍රාර්ථනා කෙළෙයි ඒ එසේමැයි.

2. දෙහීති චක්ඛුමසුකං ගදිතොපි යෙහි
නාලාකරෙත්ථ මිහනත්ථි නදෙම්වාති
චින්තාමහා කරුණයා * පහටාවකාසා
දූරඞ්ගමා වියතස්ස හි චක්ඛුදානා.

අතිපීවූ යාචකයන් විසින් අසවල් වස්තුවක් මට දෙවයි කියනලද්දේ මෙහි නැතැයි කියාද කියන්ට අසමර්ථවිය ඒ එසේමැයි බෝධිසත්වයන්ගේ සිත්හි මහත්කරුණාවෙන් පහරණලද අවකාශඇති සියලු වස්තුවෙහි තෘෂ්ණාතොම දුරගියාක් වැනිවිය—මෙසේ අප මහබෝසතාණන්ට මෙන් බාහිර වස්තූන්ගේ පරිත්‍යාග නැමැති මහත්වූ උත්සවය කවරකාලෙක්හි මට වේද්දෝයි කියාද,—

3. අනීයතෙ නිසිතසත්ථනිපාතනෙන
නිකත්තඩ්ඪතෙ ච මුහු දානභවාය රත්ත
එවම්පනප්පන ගතාගතවෙගකිනානං
දුක්ඛං නතස්ස හදයං වතපීළයිත්ථ.

තවද සවකීය ශරීර මාංසදානය පිණිස ජනිතවූ අභිරතියෙන් තියුණුවූ මුවහත්ඇති ශස්ත්‍රනිපාතනයෙන් මාංසච්ඡේදය පිණිස ඇතමෑත එක්වන් අද නාලෑබෙයි මෙසේ නැවත නැවත යාචිරම් සංඛ්‍යාත

---

* 'කරුණය' විය යුතුව්බත් ඒකවචනේ 'කරුණයා' කියා සංස්කෘතේ මෙන් යොදතිබෙන්නා. මෙසේම 'ආරාධනාය' වෙනුවට 'ආරාධනයා' කියා හවෙනිපරිච්ඡේදේ දසතුන්වෙනිකාණ්ඩේ පෙනේ. වෙනපොත්වලත් මෙසේ මේ විබත යොදඇති. 'සද්ධයා, යනපදේ මෙහිදක්වනලද සද්ධම්මොපායනේ ගාථාවේ බලනු.

'සබ්බාදරෙණ වන්දිතා සම්මා සම්බුද්ධ මාදිතෝ
අථ ධම්මඤ්ච සංඝඤ්ච [සද්ධයා] බුද්ධනා අහං.'

වේගයෙන් බෙදයට පැමිණියාවූ සම් දුක්ඛයෙක් ඇද්ද ඒ දුක්ඛය ඒ මහබෝසතාණන් වහන්සේගේ ධ්‍යානාභිරතියෙන් ඒකාන්තයෙන් චිත්තයට පීඩානොකෙළෙයි. මෙසේ වනාහි අප මහබෝසතාණන්ගේ මස්ලේ ආදිවූ අධ්‍යාත්මික වස්තු දෙන සමයෙහි දුක්ඛවේදනාතොම සිත නොපෙළීය—මට්ද මෙබඳුවූ අධ්‍යාත්මික දානනම් මහාමඟුල කවරකලෙක්හි වේද්‍යෙහොයි කියාද,—

4. සොසංඛපාලභුජගො විසවෙගවාපි
සීලස්ස හෙද නභයෙන අතුප්පමාණො
ඉච්ඡංසදෙහ හරවාහි ජනෙ දයාය
ගනතුංසයං අපදතාය සුඛෙසාච ඤාණං

සංඛපාල නාගරාජන්වූ ඒ බෝධිසත්වතෙම අතිශයෙන් විෂඇත්තේද පවා සිල් බිඳියෙයි යන භයින් නොකිපෙන්නේ සවතීයවූ ශරීරභාරය උසුලන්නාවූ ජනයං කෙරෙහි කරුණාවෙන් තෙමේ යන්නට කැමැතිවූයේද තමාගේ පානැතිබැවින් සෝක කළ හයි සිතා මෙසේ සිල්රැකීම් සංඛ්‍යාතවූ චරිතාශ්‍රය කවර කලෙක්හි ලැබෙද්‍යෙහොයි කියාද,—

5. පිවෙය්‍යථඤ්ඤං අමතංව බාලො
වුඩ්ඪිංගතො සො ච ජිගුච්ඡතෙ තං
සත්තු එවං අනුභුය රජ්ජං
ඤාණස්ස පාකො සතතං ජහානි.

බාලතෙම අමෘතයක්මෙන් තනකිරි බොන්නේය නැවැත වැඩිමට පැමිණියාවූ ඒ බාලතෙම ඒ තනකිරි යම්සේ පිළිකුල්කෙරේද මෙපරිද්දෙන් කිසිකලෙක ඒ බෝධිසත්වතෙම රාජ්‍යය අනුභවකොට නුවණ මිහිකිරිණුකල්හි අනවරතයෙන් රාජ්‍යය හැරපියා ගෘහාභිනිෂ්ක්‍රමණයකරන්නේය. මෙසේ මෙපරිද්දෙන් මා

විසිනුදු නොබෝ කලෙකින්ම ඒකාන්තයෙන් ගෘහාභි
නිෂ්ක්‍රමණය කටයුත්තේයයි කියාද,—

6. සො සෙනකො විජ්ජපසිද්ධකායසිප්පං
අඤ්ඤාසි දොසකලුසාය ධියබඤානත්තං
කා වණ්ණනාංසස බලුදොසවිනිග්ගතාය
සබ්බඤ්ඤුතාය දසපාරමිසංඛිතාය.

සේනකපණ්ඩිතනම්වූ ඒ බෝධිසත්වතෙම බ්‍රාහ්මණ
ණාගේ අත්සුනු පසුම්බියෙහි දරණලාගෙනැ හොත්
තාවූ සර්පයා රාගාදිදෝෂයෙන් කලුෂවූ ප්‍රඥාවෙන්දත
ඒ අංශවංශීය දශපාරමිතාවෙන් සිද්ධකරණලද පහවූ
රාගාදිදෝෂඇති ඒ සර්වඥයන්ගේ සර්වඥතාඥානය
ගෙනැ වර්ණනාතොම කවරක්ද. මෙබඳුවූ ප්‍රකාර
ඇති කලණවූ ඥානසම්බෝධිය කවරකාලෙක්හි මට
සම්බෝධවේදෝහොයි කියාද,—

7. වාලෙන සොංතිසකලන්දක ජාතියම්පි
උස්සිඤ්චිතුං සලිලමුස්සගි සාගරස්ස
තාමුබතාය නහවෙ මතියාමහතාක
සම්පාදනායභිමතස්ස සමත්ථතාය.

කෘශවූ ලෙහෙනාවූ උපන් සමයෙහි ඒ බෝධිසත්ව
තෙම වාලධියෙන් සමුද්‍රජලය ඉසදමන්ට උත්සාහ
කෙළේය—එමුග්ධබැවින් නොවෙයි වැලි කුමක්හෙ
සිඳු මහත්වූ ප්‍රඥාවෙන් අභිමතාර්ථයාගේ සැපවීමෙහි
සමර්ථබැවිනි. මෙබඳුවූ ප්‍රකාරඇති වීර්‍ය්‍යපාරමිතා
වට ප්‍රාප්තවූයෙම් කවරකාලෙක්හි වෙම්දෝහොයි
කියාද,—

Digitized by Google

8. කලාබුරාජෙන හිඛන්තිවාදී
වධං විධායාපි අතිත්තකෙන
හතො පදෙනොරසි ඛන්තිසොභෙ
සො තුට්ඨසන්ධිග්ගහණම්බුබොධ *

කලාබු නම් කසිරජහු විසින් ක්ෂාන්තිවාදී තාපස යන්ට වධකොටද තෘප්තියක් නැත්තාහු විසින් තාප සයන්ගේ ළය පයින් පහරන ලද කල්හි ඒ ක්ෂාන්ති වාදී තාපසතෙම ක්ෂාන්ති නැමැති ප්‍රාසාදයෙහි කුළු සන්ධිනැන්වීම සැලකීය. මෙබඳුවූ ප්‍රකාරඇති ක්ෂා න්තිපාරමිතාවෙන් කවරකාලෙක්හි සරහම්යි කියාද.

9. මිච්ඡාභියොගං න සහිංසු තාසස †
රමාභිධානස්ස පි පාදුකායො
සච්චයා නාඤ්ඤමභාසි ධීරො
සොසච්චසන්ධො චතුසච්චවාදී

ඒ රමණිම් බෝධිසත්වයන්ගේ සිත්පිත් නැතතාංවූ රන්මිරිවැඩිහුද පවා අසත්‍යයෙහි යෙදීම නොඉවසූ හ—සත්‍යසන්ධානඇති මතු චතුස්සත්‍යය කියන්නාවූ ප්‍රාඥවූ ඒ බෝධිසත්වතෙම සම්මුතිසත්‍ය පරමාර්ථ සත්‍ය දෙකින් අතිකාන්ත නොකී. මමද මෙබඳුවූ සත්‍ය පාරමිතාබලයෙන් සියලු ලොවට චතුස්සත්‍යාවබෝධ කිරීමෙහි හෙවත් දැන්වීමෙහි සමර්ථවූයෙම් කවරකා ලෙක්හි වෙම්යි කියාද,—

* උපජාති-පස්වෙනිවර්ගයයි. මෙහි සතරවෙනිපදේ ඉන්ද්‍ර වජ්‍රයි. ඉතිරිපාද උපේන්ද්‍රවජ්‍රයි සලකනු.

† උපජාති-හවෙනි වර්ගයයි. සමවෘත්තයි. අන්තිම අකුර ලඝු වූවත් වෘත්ත පිනිස ගුරුක්සේ සලකනු.

Digitized by Google

10. සො මූනපක්ඛවිදිතො සිරිසීරුතාය
මූගාදිකං වතවිධිං සමධිඨ්ඨහිත්වා
තංතාදිකං අනුභවං අසහම්පිදුක්ඛං
යාවාභිනික්ඛමමහොසි අධිඨිතෙනා

මූනපක්ෂයයි දන්නාලද ඒ තේමිය බෝධිසත්වතෙම රාජ්‍යශ්‍රියෙහි භයින් ගොළුබැව් ආදිවූ ව්‍රතවිධිය අධිෂ්ඨානකොට සහනයකොට ගතනොහැක්කාවූද මෙබඳු දුක්ඛයාගේ අනුභවයෙන් තාපස ප්‍රව්‍රජ්‍යාව දක්වා හෙවත් ගෘහාභිනිෂ්ක්‍රමණය දක්වා අධිෂ්ඨානය නොබින්දේය. මෙසේ මාවිසිනුදු අධිෂ්ඨාන පාරමිතාවගේ සම්පූර්ණතා තොමෝ කවරකලෙක්හි වේද්‍යහොයි කියාද,—

11. මෙත්තානුභාවෙන සලොමහංසො
පෙමානුබන්ධෙන සඛීකාරෙනෙතා
සත්තෙ සමන්තෙපිච නිබ්බෙරී
සද්දං විරුද්ධප් මකාසි ධීරො.

ලෝමහර්ෂ නාම්වූ ඒ මහබෝධිසත්වතොම මෛත්‍රීආනුභාවයෙන් සියලුසත්වයන් කෙරෙහි ප්‍රෙම අනුව බැදීමෙන් යහළුකරන්නාවූ ඒ ප්‍රාඥතෙම නිත්‍යවෛරී ශබ්ද බොහෝකලක් විරුද්ධවූ අජීඅෑතතා කෙළේය. මමද මෙබඳුවූ ප්‍රකාරඇති මෛත්‍රී පාරමිතාවෙන් කෙළපැමිනියෙම් කවරකලෙක්හි වෙම්සිකියාද,—

12. සොඑකරජ්ජ විදිතො සමචිත්තතාය
මානාවමානනකරෙසු තුලාසරූපො
තොසම්බරෙසමනුපෙක්ඛ හජ්ජුළපෙක්ඛං
සබ්බප් පීතිවිකතී හතවෙතනො ච.

ඒකරාජයයි දන්නාලද ඒ බෝධිසත්වතෙම සමසිත් ඇතිබැවින් මාන අවමාන කරන්නාවුන් කෙරෙහි තරාදියකට බඳුවූ ස්වරූප ඇත්තෝ සන්තොෂයටද

Digitized by Google

රොෂයටද නොපැමින සියලු සත්වයාකෙරෙහි තුවූ පහවූ විකෘතිඇත්තෝ පහවූ සිත් ඇත්තාක්හු මෙන් උපේක්‍ෂාව සේවිනයකෙළේය. මෙසේ මමද උපෙක්‍ෂා පාරමිතාවෙන් කවරකාලෙක්හි සියල්ලවුන්ට සාධාරණවූයෙම් වෙමියිකියාද අනවරතයෙන් සිතී.

මෙසේ පාරමිතා ප්‍රාර්ථනාසංබන්‍ධතවූ පස්වන පරිච්ඡේදය කියා නිමවනලදී.

පරිච්. VI.

1. මෙසේ නිරවද්‍යවූ ස්වභාවඇති දැහැමි සිරි සඟබෝ රජහු රාජ්‍යයකෙරෙමින් සිටිකල්හි කිසි කාලෙක්හි සත්වයන්ගේ කිසි අකුශල විපාකයෙන්

[ජඨරපිඨර භාරක්කන්තවංකොරුජන්නු
සජලජලදකූටාකාරඝොරෙරු කායො
කුටිලකඨිනදාඨා කොපිසඤ්ජල්ල ගණ්ඩො
නවදිවසකරකොබා රක්ඛසො දීපමාග.]*

කුක්ෂි නැමැති සැලෙහි බරින් මඬනාලදින් වක්වූ මහත්වූ දනමඬුලුඇති ජලසහිතවූ මේඝකූටයකට බඳුවූ ආකාරඇති දරුණුවූ මහත්වූ ශරීර ඇති වක්වූ දැඩිවූ දළකෙළවරින් ඔබනාලද කපොලස්ථලඇති අභිනව සූර්‍ය්‍යමණ්ඩලයකට බඳුවූ ඇස්ඇති රාක්‍ෂසයෙක් සිංහලද්වීපයට පැමිණියේයි.

---

* මාලිනී...තල්ලක්ඛණං......
නනමයයයුතායං මාලිනී භොගිසීහි.
— — —, — — —, ⌒ ⌒ ⌒, — ⌒ ⌒, — ⌒ ⌒

2. ඒ රාක්ෂසතෙම ඒ ඒ ගම් කෙළවරවල්හි හිඳි
නේය යම් යම් මනුෂ්‍යකෙනෙක් වටින් අවුත් රත්වූ
ඇස්ඇති ඔහු බලත්ද ඒ බැලූවවුන්ගේ අක්ෂීනු රත්
වෙති ඒ ඇසිල්ලෙහිම රක්තාක්ෂමාරක නම්වූ ජ්වර
රෝගයෙන් පහළව මරයි.

3. මළමළවුන් ඒ යක්ෂතෙම සැකැයක්නැත්තේ
කයි ඒ යක්ෂයා නොදැකාද යම්යම් සත්වකෙනෙක් ඒ
රෝගයෙන් පීඩිතයෝද ඔවුන් බලන්නවුන්ටත් ඒරෝ
ගයතෙම පහළවෙයි මෙසේ නොබෝකලකින්ම
යක්ෂභයින්ද රෝගභයින්ද ජනපදයතෙම තුනීවූ
ජනයා ඇත්තේවිය.

4. රජතෙම එපවත් අසා මං රාජ්‍යයකෙරෙමින් සිටි
යදී සත්වයන්ට මෙබඳුවූ භයක්වීම සුදුසු නොවන්නේ
යයි හගනේ එදවස්ම අෂ්ටාඞ්ගශීලය සමාදන්ව තමා
විසින් අනවරතයෙන් කරන්නාවූ දශකුශලකර්මයන්
සිහිකොට මම ධර්මයෙන් ජයගන්නා සුළුයෙම් ඒ රා
ක්ෂසයා නොදැක නැගී නොසිටිම්යි ඉතා තරකොට
අධිෂ්ඨානකොට ශ්‍රීයහන් ගබඩාවෙහි සැතපිනි.

ඒ දැහැමි සිරිසඟබෝරජහුගේ ආචාරධර්මයෙහි
තේජසින්ද රජහුගේ ආනුභාවයෙන්ද ඒ රාක්ෂසතෙම
තැවුනේ විතෙතාත්‍රාසයට පැමිනියේ භයපත්වූයේ
ඇසිල්ලකුත් සිටිනට නොහැකිවූයේ ආකාශයෙන්
අවුත් ඉතා අලුයම්වේලෙහි ඇතුළුගර්භගෙට වදින්ට
නොපොහොසත්වූයේ පිටත සිට රජහට තමාදැක්වී
රජහුවිසින් තෙපි කවරක්හුදැයි විචාරනලද්දේ මෙ
සේකියා රතසියා නම් මමය දුරුවූ ජනපදයෙහි සිටි
යෙම් ඇසිල්ලකුත් සිටින්ට නොහැකිවූයෙම් නුඹ
වහන්සේගේ ආනුභාවයෙන් බඳනාලද්දක්හු මෙන්
මෙතැන්හි පැමිනියෙම් රජ්ජුරුවන්වහන්ස නුඹවහ
න්සේගේ දැක්මෙහි බාමියි කී.

Digitized by Google

රොෂයටද නොපැමිනි සියලු සත්වයාකෙරෙහි තුටු පහවූ විකෘතිඇත්තේ පහවූ සිත් ඇත්තාක්හු මෙන් උපේක්ෂාව සේවනයකොළේය. මෙසේ මමද උපෙක්ෂා පාරමිතාවෙන් කවරකාලෙක්හි සියල්ලවුන්ට සාධාරණවූයෙම් වෙමියිකියාද අනවරතයෙන් සිතී.

මෙසේ පාරමිතා ප්‍රාර්ථනාසංඛ්‍යාතවූ පස්වන පරිච්ඡෙදය කියා නිමවනලදී.

පරිච්. VI.

1. මෙසේ නිරවද්‍යවූ ස්වභාවඇති දැහැමි සිරි සඟබෝ රජහු රාජ්‍යයකෙරෙමින් සිටිකල්හි කිසි කාලෙක්හි සත්වයන්ගේ කිසි අකුශල විපාකයෙන්

[ජඨරපිඨර භාරක්කානතවංකොරුජානු
සජ්ජලජලදකූටාකාරඝොරොරුකායො
කුටිලකඨිනදාඨා කොටිසන්දට්ඨ ගණ්ඩො
නවදිවසකරක්ඛො රක්ඛසො දීපමාග.]*

තුක්ෂී නැමැති සැලෙහි බරින් මඩනාලදින් වක්වූ මහත්වූ දනමඬුලුඇති ජලසහිතවූ මේඝකූටයකට බඳුවූ ආකාරඇති දරුණුවූ මහත්වූ ශරීර ඇති වක්වූ දැඩිවූ දළකෙළවරින් ඩහනාලද කපොලස්ථලඇති අභිනව සූර්‍ය්‍යමණ්ඩලයකට බඳුවූ ඇස්ඇති රාක්ෂසයෙක් සිංහලද්වීපයට පැමිනියේයි.

---

* මාලිනී...තල්ලක්ඛණං......

නනමයයයුතායං මාලිනී භොගිසීහි.

— — —, — — —, ◡ ◡ ◡, — ◡ ◡

2. ඒ රාක්ෂසතෙම ඒ ඒ ගම් කෙළවරවල්හි හිඳිනේය යම් යම් මනුෂ්‍යකෙනෙක් වටින් අවුත් රත්වූ ඇස්ඇති ඔහු බලත්ද ඒ බැලූවවුන්ගේ අක්ෂීනු රත්වෙති ඒ ඇසිල්ලෙහිම රක්තාක්ෂමාරක නම්වූ ජ්වර රෝගයෙන් පහළව මරයි.

3. මළමළවුන් ඒ යක්ෂතෙම සැකයක්නැත්තේ කායි ඒ යක්ෂයා නොදැකද යම්යම් සත්වකෙනෙක් ඒ රෝගයෙන් පීඩිතයෝද ඔවුන් බලන්නවුන්ටත් ඒ රෝගයතෙම පහළවෙයි මෙසේ නොබෝකලකින්ම යක්ෂභයින්ද රෝගභයින්ද ජනපදයතෙම තුනීවූ ජනයා ඇත්තේවිය.

4. රජතෙම එපවත් අසා මං රාජ්‍යකොරෙමින් සිටියදී සත්වයන්ට මෙබඳුවූ භයක්වීම සුදුසු නොවන්නේයයි හගතේ එදවස්ම අෂ්ටාඞ්ගශීලය සමාදන්ව තමා විසින් අනවරතයෙන් කරන්නාවූ දශකුශලකර්මයන් සිහිකොට මම ධර්මයෙන් ජයගන්නා සුලුයෙමි ඒ රාක්ෂසයා නොදැක නැගී නොසිටිමියි ඉතා තරකොට අධිෂ්ඨානකොට ශ්‍රීයහන් ගබඩාවෙහි සැතපිනි.

ඒ දැහැමි සිරිසඟබෝරජහුගේ ආචාරධර්මයෙහි තෙජසින්ද රජහුගේ ආනුභාවයෙන්ද ඒ රාක්ෂසතෙම තැවුනේ චිත්තෝත්‍රාසයට පැමිනියේ භයපත්වූයේ ඇසිල්ලකුත් සිටිනට නොහැකිවූයේ ආකාශයෙන් අවුත් ඉතා අලූයම්වේලෙහි ඇතුළුගබඩාගෙට වදින්ට නොපොහො[illegible] පිටත සිට රජහට තමාදැක්වී [illegible]ුවිසින් [illegible]රක්හුදැයි විචාරනලද්දේ මෙ [illegible]වූ ජනපදයෙහි සිටි [illegible]නොහැකිවූයෙමි නුඹ [illegible]දැක්හු මෙන් [illegible]ස නුඹවහ

Digitized by Google

අනුභව සැපය ඇත්තාහයි තපශ්වීවරයන්ට අපහාස්‍යකෙරෙත් වෘද්ධජනයාගේ උපදේශ ජරාවෙන් මඩනාලද්දවුන්ගේ ප්‍රලාපයෙකැයි නොඅසත් තමන්ගේ ප්‍රඥාවප පරිභවයයි අමාත්‍යයන්ගේ උපදේශයට ඊර්ෂ්‍යාකෙරෙත් ඒකාන්තයෙන් ගිනයත් කියන්නාවූන්ට කිපෙත්. මේආදී කාරණයෙන් බොහෝවූ දෝෂයන්ට උත්පත්තිස්ථානවූ රාජ්‍යසම්පත් මම නොකැමැත්තෙමියි කී.

7. ඉක්බිත්තෙන් මහජනයා විසින් ආදරසහිතවූ ආරාධනා කරනලද මහසංඝතෙම කුමාරයන්ට අභිමුඛව අනුශාසනා කරනසේකි, “මහත්වූ භාග්‍යඇති කුමාරයෙනි යම්සේ තණපුඩුවෙහි එල්ලුනාවූ පූඩාතොමෝ තිබුණු බැහමෙන් ඒ තණපුඩුවෙහි දුක්ඛවේදනාව උපදවන්නේ ලෙහෙම ඇඳගනීද කිරිබොනදරුවාතෙම වනාහි කොමලවූ මුඛපුටයෙන් වැදූමෑණියන්ට සැපසංඥාව උපදවන්නේ කිරි යම්සේ ඇදබොද ඒපරිද්දෙන්ම රාජ්‍යසම්පතටද පැමිණියාවූ නුවණැත්තාවූ අඥානතෙම බොහෝවූ අකුශලයන් රැස්කෙරෙයි ප්‍රසස්තවූ ප්‍රඥාඇති ධීරපුරුෂවනාහි ආයුසංස්කාරයාගේ දුර්වලබවද ධනසමූහයාගේ නැසෙනසුලුබවද ප්‍රඥාවෙන් පරීක්ෂාකොට දශකුශලකර්මයන් පූරන්නේ එබඳුවූ මහත්වූ භෝගරාශියෙන් මහත්වූ කුශලසමූහයන් රැස්කෙරෙයි එහෙයින් තෙපි කරනලද කුසල් ඇත්තෙහිද විය මහබෝසතුන්ගේ ධුරය දරන්නෙහිද වූයෙහිය මෙබඳු කුශලකරණයට ස්ථානයලැබ දැහැමෙන් සෙමෙන් ලෝකසංරක්ෂාකරන්නේ සර්වඥශාසනයට සංග්‍රහකරන්නේ දානපාරමිතාව කෙළපැමිණියාක්කොට පසුව මහාභිනිෂ්ක්‍රමණයද කරන්නේ සතතිස්බෝධපාක්ෂිකධර්මයන් රක්ෂාකරවයි කියා අනුශාසනාකොට වදාළසේකි.

Digitized by Google

8. ඉක්බිත්තෙන් මහත්වූ අධ්‍යාශයඇති උත්තම පුරුෂවූ සිරිසඟබෝ කුමාරතෙම මහාසංඝයාවහන්සේගේ අනුශාසනාව ඔබනට අසමර්ථවූයේ ඉවසී. ඒ අනුශාසනාවට ඉක්බිතිවද මහජන සමූහතෙම සංඝයාවහන්සේගේ අනුඥාවෙන් සියලු සිංහලද්වීපය ඒකච්ඡත්‍රකොට අභිෂේකකොට දැහැමි සිරිසඟබෝ රජයයි ව්‍යවහාරයක් කෙළේයි. ගෝඨාභය භාණ්ඩාගාරිකයාද සෙනෙවිරත් තනතුරෙහි තිබී.

9. දානං අදා රක්ඛිච සීලං
වසීතිතික්ඛං භජීඅප්පමාදං
පජාහිතාපක්ඛාසය සොම්මරූපො
ධම්මොවසො විග්ගහවා විරොචි. *

ඝනුහෙයින් මෙසේ දැහැමි සිරිසඟබෝ රජතෙම යථොක්තවූ දශවිධදානය සියලු ශ්‍රමණබ්‍රාහ්මණයන්ට දින නිරන්තරයෙන් පංචසීලයද්දැරීය අපරාධ සහනය ක්ෂමාව උවහනයකෙළේය ප්‍රමාදනොවනබව කුශල කාරණයෙහි අප්‍රමාදබව සේවනය කෙළේය සියලු ප්‍රජාවකෙරෙහි හිතවූ අදහසින් සෞම්‍යවූ ස්වරූප ඇත්තේ මූර්තිමත්වූ ධර්මජාතයක්මෙන් බැබළුනා ඒ එසේමැයි.

10. විඤ්ඤූය ලොකස්සහි සො සභාවං
පධානවත්තානු ගතිප්පධානං
නිබෙතුකාමො ජනතාසු ධම්මං
සයම්පි ධම්මාචරණම්හි සත්තො. †

---

* මෙ උපජාති—තුන්වෙනි වර්ගයයි. මෙහි පළමුවෙනි සතර වෙනි පාද ඉන්ද්‍රවජ්‍රයි—ඉතිරි උපේන්ද්‍රවජ්‍රයි සලකනු.

† උපජාති—සතරවෙනි වර්ගයයි. මෙහි පළමුවෙනි පදේ පමනක් ඉන්ද්‍රවජ්‍රායි—ඉතිරිපාද උපේන්ද්‍රවජ්‍රායි සලකනු.

Digitized by Google

ඒ දැහැමි සිරිසඟබෝ රජතෙම ලෝකයාගේ ස්වභාවය ස්වබුද්ධින් දැන සතරසම්‍යක් ප්‍රධාන වෘත්තිය අනුව ගියාවූ වීර්‍ය්‍යඇති කුශලධර්මය ජනයා කෙරෙහි පිහිටුවනු කැමැත්තේ තෙමේද ධර්මයෙහි හැසිරීමෙහි ශක්තව ඇලුණේයි.

රාජ්‍යාභිෂෙක සංබන්ධනාවූ සතරවන පරිච්ඡේදය කියා නිමවනලදී.

පරිච්. V.

1. ඒ දැහැමි සිරිසඟබෝ රජතෙම රුවන්වැලි මහවිහාරයෙහි මහඇඟිවූ විසල්වූ ලාබත්කරවා නොයෙක් දහස්ගණන් භික්ෂූන්වහන්සේට නිරන්තරයෙන් ලහබත් පැවැත්වී. මයිල්නාඳ මහතෙරුන්වහන්සේටද ස්වකීයවූ නාමයෙන් මහත්වූ දැහැමි සිරිසඟබෝ නම් පිරිවෙන් විහාරයක්කරවා නොයෙක් කප්පිය භාණ්ඩයන්හා සමඟ පරිවාරසහිතවූ ග්‍රාමක්ෂෙත්‍රයන් සංඝයාවහන්සේගේ පරිභෝගයට සුදුසුකොට දෙවී. තවද නිරන්තරයෙන් මධ්‍යම රාත්‍රියෙහි රහස්ගතවූයේ කායිකවිවේකයට පැමිණීයේ අප මහබෝසතුන්ගේ මාංසදානාදී නොකටහැකි චරිතයන් සලකන්නේ එබඳුවූ චරිතයන් තමාකෙරෙහි පිහිටුවන්ට ප්‍රාර්ථනා කෙළෙයි ඒ එසේමැයි.

Digitized by Google

2. දෙහීති වච්‍යමසුඛං ගදිතොඃර්ථිභි
නාල්‍යාසකපෛතු මිහනාර්ථ නදෙම්වාති
චිතෙතාමහා කරුණයා * පහටාංචනාසා
දූරජගාම වියතස්ස හි වච්ඡුතාණ්‍යා.

අතිථිවූ යාචකයන් විසින් අසවද්‍ය වස්තුවක් මට දෙවයි කියනලද්දේ මෙහි නැතැයි කියාද කියන්ට අසමර්ථවිය ඒ එසේමැයි බෝධිසත්වයන්ගේ සිත්හි මහත්කරුණාවෙන් පහරණලද අවකාශඇති සියලු වස්තුවෙහි තෘෂ්ණාතොම දුරගියාක් වැනිය—මෙසේ අප මහබෝසතානන්ට මෙන් බාහිර වස්තූන්ගේ පරිත්‍යාග නැමැති මහත්වූ උත්සවය කවරකාලෙක්හි මට වේද්‍යෙහොයි කියාද,—

3. අනියතෙ නිසිතසත්ථනිපාතනෙන
නිකත්තඛණ්ඩිතෙ ච මුහු දනාහවාය රතාස
එවම්පුනප්පුන ගතාගතවෙගඛිනානං
දුක්ඛං නතස්ස හදයං වතපීළයිත්ථ.

තවද ස්වකීය ශරීර මාංසදානය පිණිස ජනිතවූ අභිරතියෙන් තියුණුවූ මුවහත්ඇති ශස්ත්‍රනිපාතනයෙන් මාංසච්ඡේදය පිණිස ඈතාමෑත එක්වන් අද නාලැබෙයි මෙසේ නැවත නැවත යාම්ඊම් සංඛ්‍යාත

---

* 'කරුණය' විශූ කතුවිබත් ඒකවචනේ 'කරුණයා' කියා සංස්කෘතේ මෙන් යොදතිබෙත්නා. මෙසේම 'ආරාධනාය' වෙනුවට 'ආරාධනයා' කියා හවෙනිපරිච්ඡේදේ දසතුන්වෙනිකාණ්ඩේ පෙනේ. වෙනපොත්වලත් මෙසේ මේ විබත යොදඇති. 'සද්ධයා, යනපදේ මෙහිදක්වනලද සද්ධම්මොපායනේ ගාථාවේ බලනු.

'සබ්බාදරෙණ වන්දිත්වා සම්මා සම්බුද්ධ මාදිතෝ
අථ ධම්මඤ්ච සංඝඤ්ච [සද්ධයා] මුද්ධනා අහං.'

වේගයෙන් බෙදයට පැමිණියාවූ යම් දුක්ඛයෙක් ඇද්ද ඒ දුක්ඛය ඒ මහබෝසතාණන් වහන්සේගේ දනාභිරතියෙන් ඒකාන්තයෙන් චිත්තයට පීඩා නොකෙළෙයි. මෙසේ වනාහි අප මහබෝසතාණන්ගේ මස්ලේ ආදීවූ අධ්‍යාත්මික වස්තු දෙන සමයෙහි දුක්ඛවේදනාතොම සිත නොපෙළීය—මටද මෙබඳුවූ අධ්‍යාත්මික දනතාම් මහාමඟුල කවරකලෙක්හි වේද්දහොයි කියාද,—

4. සොසංඛපාලභුජගො විසවෙගවාපි
සීලස්ස හෙද භයෙන අතුප්පමානො
ඉච්ඡංසදෙහ හරවාහි ජනෙ දයාය
ගනතුංසයං අපදතාය සුභොව ඤූනං

සංඛපාල නාගරාජන්වූ ඒ බෝධිසත්වතෙම අතිශයෙන් විෂඇත්තේද පවා සිල් බිඳියෙයි යන භයින් නොකිපෙන්නේ සවකීයවූ ශරීරභාරය උසුලන්නාවූ ජනයා කෙරෙහි කරුණාවෙන් තෙමේ යන්නට කැමැතිවූයේද තමාගේ පානැතිබැවින් සෝක කළ හයි සිතම් මෙසේ සිල්රැකීම් සංඛ්‍යාතවූ චරිතශ්‍රිය කවර කලෙක්හි ලැබේද්දහොයි කියාද,—

5. පිවෙය්‍යථ ඛීරං අමතංව බාලො
වුඩ්ඪිංගතො සො ච ජිගුච්ඡතෙ තං
සජ්තු එවං අනුභුය රජ්ජං
ඤාණස්ස පාකෙ සනතං ජහානි.

බාලතෙම අමෘතයක්මෙන් තනකිරි බොන්නේය නැවැත වැඩිමට පැමිණියාවූ ඒ බාලතෙම ඒ තනකිරි යම්සේ පිළිකුල්කෙරේද මෙපරිද්දෙන් කිසිකලෙක ඒ බෝධිසත්වතෙම රාජ්‍යය අනුභවකොට නුවණ මිහිකිරිණුකල්හි අනවරතයෙන් රාජ්‍යය හැරපියා ගෘහාභිනිෂ්ක්‍රමණයකරන්නේය. මෙසේ මෙපරිද්දෙන් මා

විසිනුදු නොබෝකලකින්ම ඒකාන්තයෙන් ගෘහාභි නිෂ්ක්‍රමණය කටයුත්තේයයි කියාද,—

6. සො සෙනකො විජ්ජපසිද්ධකාසායිසප්පං
අඤ්ඤාසි දොසකලුසාය ධියබ්භුතානං
කා වණ්ණනාස්ස බහුදොසවිනිග්ඝාතාය
සබ්බඤ්ඤුතාය දසපාරමිසංභිතාය.

සේනකපණ්ඩිතනම්වූ ඒ බෝධිසත්වතෙම බ්‍රාහ්මණයාගේ අත්පසුම්බියෙහි දරණලාගෙනැ හොත්තාවූ සර්පයා රාගාදිදොෂයෙන් කලුෂවූ ප්‍රඥාවෙන්දත ඒ අංශවර්ජීය දශපාරමිතාවෙන් සිද්ධකරණලද පහවූ රාගාදිදොෂඇති ඒ සර්වඥයන්ගේ සර්වඥතාඥානය ගෙනැ වර්ණනාතොම කවරක්ද. මෙබඳුවූ ප්‍රකාර ඇති කලණවූ ඥානසම්බොධිය කවරකාලෙක්හි මට සම්බොධවේද්‍යහොයි කියාද,—

7. වාලෙන සොසිතකලන්ද ජාතියම්පි
උස්සිඤ්චිතුං සලිලමුස්සහි සාගරස්ස
තම්බුද්ධතාය නභවෙ මතියාමහන්තා
සම්පාදනාභිමතස්ස සමත්ථතාය.

කෘශවූ ලෙහෙනාවූ උපන් සමයෙහි ඒ බෝධිසත්ව තෙම වාලධියෙන් සමුද්‍රජලය ඉසදමන්ට උත්සාහ කෙළේය—එමුග්ධබැවින් නොවෙයි වැලි කුමක්හෙ සිඳ මහත්වූ ප්‍රඥාවෙන් අභිමතාර්ථයාගේ සැපවීමෙහි සමර්ථබැවිනි. මෙබඳුවූ ප්‍රකාරඇති වීර්‍ය්‍යපාරමිතා වට ප්‍රාප්තවූයෙම් කවරකාලෙක්හි වෙම්දෝහොයි කියාද,—

Digitized by Google

8. කලාබුරාජෙන හිඛන්තිවාදී
වධං විධායංපි අතිතාතකෙන
හතෙ පදෙනොරසි ඛන්තිසොමෙ
සො කූටසන්ධිග්ගහණම්බුබොධ *

කලාබු නම් කසීරජහු විසින් ක්ෂාන්තිවාදී තාපස යන්ට වධකොටද තෘප්තියක් නැත්තාහු විසින් තාප සයන්ගේ ලය පයින් පහරනලද කල්හි ඒ ක්ෂාන්ති වාදී තාපසතෙම ක්ෂාන්ති නැමැති ප්‍රාසාදයෙහි කුළු සන්ධිනැන්වීම සැලකීය. මෙබඳුවූ ප්‍රකාරඇති ක්ෂා න්තිපාරමිතාවෙන් කවරකාලෙක්හි සරහම්යි කියාද.

9. මිච්ඡාභියොගං න සහිංසු තස්ස †
රාමාභිධානස්ස පි පාදුකායො
සච්චයා නාඤ්ඤමභාසි ධීරො
සොසච්චසන්ධො චතුසච්චවාදී

ඒ රාමනම් බෝධිසත්වයන්ගේ සිත්පිත් නැත්තාවූ රන්මිරිවැඩිහුද පවා අසත්‍යයෙහි යෙදීම නොඉවසූ හ—සත්‍යසන්ධානඇති මතු චතුස්සත්‍යය කියන්නාවූ ප්‍රාඥවූ ඒ බෝධිසත්වතෙම සම්මුතිසත්‍ය පරමාර්ථ සත්‍ය දෙකින් අන්කතක් නොකී. මමද මෙබඳුවූ සත්‍ය පාරමිතාබලයෙන් සියලු ලොවට චතුස්සත්‍යාවබෝධ කිරීමෙහි හෙවත් දැන්වීමෙහි සමර්ථවූයෙම් කවරකා ලෙක්හි වෙම්යි කියාද,—

---

* උපජාති-පස්වෙනිවර්ගයයි. මෙහි සතරවෙනිපදේ ඉන්ද්‍ර වජ්‍රයි. ඉතිරිපාද උපේන්ද්‍රවජ්‍රයි සලකනු.

† උපජාති-හවෙනි වර්ගයයි. සමවෘත්තයි. අන්තිම අකුර ලඝු වූවත් ඡන්දස් පිනිස ගුරක්සේ සලකනු.

Digitized by Google

10. සො මූගපක්ඛවිදිතො සිරිසිරුතාය
මූගාදිකං වතවිධිං සමධිට්ඨිත්වා
තං තාදිසං අනුභවං අසහම්පිදුක්ඛං
යාවාභිනික්ඛමමහෙදි අධිසීතනෙනා

මූනපක්ෂයයි දන්නාලද ඒ තේමිය බෝධිසත්වතෙම රාජ්‍යශ්‍රියෙහි හයින් ගොළුබැව් ආදිවූ ව්‍රතවිධිය අධිෂ්ඨානකොට සහනයකොට ගතනොහැක්කාවූද මෙබඳු දුක්ඛයාගේ අනුභවයෙන් තාපස ප්‍රව්‍රජ්‍යාව දක්වා හෙවත් ගෘහාභිනිෂ්ක්‍රමණය දක්වා අධිෂ්ඨානය නොබින්දේය. මෙසේ මාවිසින්ද අධිෂ්ඨාන පාරමිතාවගේ සම්පූර්ණතා තොමෝ කවරකාලෙක්හි වේද්‍යහොයි කියාද,—

11. මෙත්තානුභාවෙන සලොමහංසො
පෙමානුබන්ධෙන සවිකාරෙනෙතා
සතෙතා සමනෙතාපිච නිඛවෙරී
සද්දං විරුඩ්ඪ මකාසි ධීරො.

ලෝමහර්ෂ නාම්වූ ඒ මහබෝධිසත්වතොම මෛත්‍රිආනුභාවයෙන් සියලුසත්වයන් කෙරෙහි ප්‍රෙම අනුව බැඳි මෙන් සහජ්කරන්නාවූ ඒ ප්‍රාඥතෙම නිත්‍යවෛරි ශබ්ද බොහෝකාලක් විරුඪවූ අජිඅෑතතා කෙළේය. මමද මෙබඳුවූ ප්‍රකාරඇති මෛත්‍රි පාරමිතාවෙන් කෙළපැමිනියෙම් කවරකාලෙක්හි වෙම්සිකියාද,—

12. සොඑකරජ්ජ විදිතො සමවිතතතාය
මංනාවමානනකාරෙසු තුල්‍යාසරූපො
තොසචරෙසමනුපෙඛ හජීඋපෙක්ඛං
සඛජ්ජ පීතිවිකත්‍රී හතවෙතනො ච.

ඒකරාජ්‍යයයි දන්නාලද ඒ බෝධිසත්වතෙම සමසිත් ඇතිබැවින් මාන අවමාන කරන්නවුන් කෙරෙහි තරාදියකට බඳුවූ සවරූප ඇත්තේ සනෙතාෂයටද

රොෂයටද නොපැමිනා සියලු සත්‍වයාකෙරෙහි තුටු පහටු විකෘතිඇත්තේ පහවූ සිත් ඇත්තාක්හු මෙන් උපේක්ෂාව සේවනායකෙළේය. මෙසේ මමද උපෙක්ෂා පාරමිතාවෙන් කවරකාලෙක්හි සියල්ලවුන්ට සාධාරණවූයෙම් වෙමියිකියාද අනවරතයෙන් සිතී.

මෙසේ පාරමිතා ප්‍රාර්ථනාසංබන්ධතාවූ පස්වනා පරිච්ඡේදය කියා නිමවනලදී.

පරිච්. VI.

1. මෙසේ නිරවද්‍යවූ ස්වභාවඇති දැහැමි සිරි සඟබෝ රජ්හු රාජ්‍යයකෙරෙමින් සිටිකල්හි කිසි කාලෙක්හි සත්‍වයන්ගේ කිසි අකුශල විපාකයෙන්

[ජඨරපිඨර භාරක්කන්තවංකොරුජන්නු
සජලජලදකූටාකාරඝොරොරු කායො
කුටිලකඨිනදාඨා කොටිසන්දෂ්ට ගඬො
නවදිවසකරකොබා රක්ඛසො දීපමාග.]*

තැඹී නැමැති සැලෙහි බරින් මඩනාලදින් වක්වූ මහත්වූ දනමඬුලුඇති ජලසහිතවූ මේඝකූටයකට බඳුවූ ආකාරඇති දරුණුවූ මහත්වූ ශරීර ඇති වක්වූ දික්වූ දළකෙළවරින් ඩහනාලද කපොලස්ථලඇති අභිනව සූර්‍යමණ්ඩලයකට බඳුවූ ඇස්ඇති රාක්ෂසයෙක් සිංහලද්වීපයට පැමිනියේයි.

---

* මාලිනී...තලක්ඛණං......
නනමයයයුතායං මාලිනී භොගිසීහි.
— — —, — — —, ⌒ ⌒ ⌒, — ⌒ ⌒, — ⌒ ⌒

2. ඒ රාක්ෂසතෙම ඒ ඒ ගම් කෙළවරවල්හි හිඳිනේය යම් යම් මනුෂ්‍යකෙනෙක් වපින් අවුත් රත්වූ ඇස්ඇති ඔහු බලත්ද ඒ බැලූවවුන්ගේ අක්ෂීනු රත් වෙති ඒ ඇසිල්ලෙහිම රක්තාක්ෂමාරක නම්වූ ජ්වර රෝගයෙන් පහළව මරයි.

3. මළමළවුන් ඒ යක්ෂතෙම සැකැයක්නැත්තේ කයි ඒ යක්ෂයා නොදැකද යම්යම් සත්වකෙනෙක් ඒ රෝගයෙන් පීඩිතයෝද ඔවුන් බලන්නවුන්ටත් ඒරෝගයතෙම පහළවෙයි මෙසේ නොබෝකලකින්ම යක්ෂභයින්ද රෝගභයින්ද ජනපදයතෙම තුනීවූ ජනයා ඇත්තේවිය.

4. රජතෙම එපවත් අසා මං රාජ්‍යයකොරෙමින් සිටියදී සත්වයන්ට මෙබඳුවූ භයක්වීම සුදුසු නොවන්නේ යයි හගතේ එදවස්ම අෂ්ටාඞ්ගශීලය සමාදන්ව තමා විසින් අනවරතයෙන් කරන්නාවූ දශකුශලකර්මයන් සිහිකොට මම ධර්මයෙන් ජයගන්නා සුලූයෙමි ඒ රාක්ෂසයා නොදැක නැගී නොසිටිමියි ඉතා තරකොට අධිෂ්ඨානකොට ශ්‍රීයහන් ගබඩාවෙහි සැතපිනි.

ඒ දැහැමි සිරිසඟබෝරජහුගේ ආචාරධර්මයෙහි තෙජසින්ද රජහුගේ ආනුභාවයෙන්ද ඒ රාක්ෂසතෙම තැවුණේ චිත්තොත්‍රාසයට පැමිනියේ භයපත්වූයේ ඇසිල්ලකුත් සිටිනට නොහැකිවූයේ ආකාශයෙන් අවුත් ඉතා අලූයම්වේලෙහි ඇතුළුගර්භගෙට වදින්ට නොපොහොසත්වූයේ පිටත සිට රජහට තමා දැක්වී රජහුවිසින් තොපි කවරත්හුදැයි විචාරනලද්දේ මෙසේකියා රතසියා නම් මමය දුරුවූ ජනපදයෙහි සිටියෙම් ඇසිල්ලකුත් සිටින්ට නොහැකිවූයෙමි නුඹවහන්සේගේ ආනුභාවයෙන් බඳනාලූඅදත්හු මෙන් මෙතැන්හි පැමිනියෙමි රජ්ජුරුවන්වහන්ස නුඹවහන්සේගේ දත්මෙහි බාමියි කී.

5. ඉක්බිති රජතෙම යහනින් නැගිසිට සිව්මැදුරු කවුළුව හැර පිටත බලා තොල කාලකනනිය මාගේ ජනපදයට පැමිනියාවූ මනුෂ්‍යයන් කවරහෙයකින් කන්නෙහිදැයි කීහ. මහරජ්ජුරුවන්වහන්ස නුඹවහන්සේගේ දේශයෙහි මාවිසින් මරා එකම්නිසෙකුත් කනලද්දේනැත. වැළි එකෙක් ඇති බලුකැණගිලුන් ආදීන්ට සාමාන්‍ය නොදුරුවූ මෘතශරීරය කමි, එහෙයින් මාගේ කිසි අපරාධයෙක්නැත ඉදින් ඇත්තම් මා කෙරෙහි රාජාඥාව කරණුලැබේවයි කියා වෙව්ලන්නේ නිශ්චලභාවයෙන් සිටින්ට නොහැකිව භයවේගයෙන් හටගත්තාවූ රෝමෝද්ගමන ඇත්තේ අනුනයසහිතවූයේ හෙවත් නැලවිලිසහිතවූයේ මෙසේ කියා—දේවයන්වහන්ස නුඹවහන්සේගේ මේරට පිරුණාවූ ධනධාන්‍යඇත්තේය සමෘධවූ සනතුෂ්ටවූ ජනයන්ගෙන් ගැවසීගත්තේය රජ්ජුරුවන්වහන්සේගේ ධනවර්ෂාවෙන් මනුෂ්‍යයෝ සම්පූර්ණවූ මනදෙළ ඇත්තාහ, දුන් යාචකයෝද ඉතා බොහෝනොවෙති, මම මෙබඳුවූ රටකට පැමිනද නොලබනලද ගොදුරු ඇත්තෙමි, නොපිරුණාවූ මනදෙළ ඇත්තෙමි, කනුබොනු කැමැතිවද බැගෑබැවින් ජීවිකාව කෙරෙමි; එතකුදුළුවත් මෙබඳුවූ භයකට පැමිනියෙමි,—මහරජ්ජුරුවන්වහන්සෑ මට අභය දුනමැනවැයි කී.

6. ඉක්බිති රජතෙම ඔහුගේ බැගෑවචනය අසා කාරුණාවෙන් කම්පාවූ ළඇත්තේ එම්බල රාක්ෂසය තෝ නොබව—තට අභය දෙමි තාවිසින් කැමැතිවනලද වස්තුවක් කියයි කීහ. මෙසේ ඔවුනොවුන්හා කථාකරන්නාවූ රජ්ජුරුවන්ගේද රාක්ෂසයාගේද යන දෙදෙනාගේ ශබ්දය අසා ඇතුළු රජගෙට ගියාවූ ඒ නුවර ජනයෝ රජහු පිරිවැරූහ. රාක්ෂසතෙම ආය රජ්ජුරුවන්හා සමග කථාකරන්නේයයි කථාවට අනු

Digitized by Google

කථාවෙන් අසා සියලු අමාත්‍යයෝද නුවරවැසියෝද සේනාවද රැස්ව රාජාඞ්ගනයද රජගෙයද පූරනෙණැ අරැණුනැගෙමින් සිටියදී මහත්වූ කෝලාහල කළහ.

7. ඉක්බිත්තෙන් රාක්ෂසතෙම රැස්වූ සිව්රඟ සෙනගද ආයුධනත් අත්ඇති සියදහස්ගණන් යෝධසේනාවද දැක අතිශයෙන් භයපත්වූයේ සිටිතැන සිටින්ටද රජහුගේ ආඥාවෙන් යන්ටද කිසිවක් කියන්ටද නොහැකිවී.

රජතෙම ඒ අවස්ථා ඇති ඔහු දැක ලබනලද අභය ඇත්තෙහිය තාවිසින් කැමැතිවනලද වස්තුවක් කියයි කී. මේ ධාර්මික රජතෙම මට කිසි භයක් නූපදවනසේකැයි දැන රජහට මෙසේකියා, රජ්ජුරුවන් වහන්ස සියලු සත්වයන් ආහාරය නිසා පවත්නා බව නුඹවහන්සේම දන්නාසේක, ඒ එසේමය—ඌර්ධ්ව ලෝකවාසී දෙවියෝ අමෘත භෝජනයෙන් ප්‍රීණිතවූවාහු ජීවත්වෙති, නාගලෝකවාසී නාගයෝ මඬුවන් අනුභවකිරීමෙන් තෘප්තියට පැමිණියාහු ජීවත්වෙති, මනුෂ්‍යයෝ කනබොනඳෑ ආදිවූ අනේකප්‍රකාර ආහාරයෙන් ප්‍රමුදිතවූ ජීවත්වෙති, අපබඳු යක්ෂරාක්ෂසයෝ වනාහි මස් ලේ ආශ්වාදයෙන් සතුටුවෙති—ඔවුන් අතුරෙහි මම එක්තරා එකකිමි, සාපිපාස දෙකින් පීඩිතයෙමි, නුඹවහන්සේ බඳු කාරුණාපූරස්සර උත්තමයානන් කෙනකුන් දැකද නොපිරුණාවූ මනදෙළ ඇත්තේ මදපින්ඇත්තෙම් ශෝකාකරෙමියිකී.

8. එකල්හි රජ තෝ මෘතශරීරයන් කම්යි එවිට කීයෙහි නොවේදැයි කීය. එබසට සැබව මහරජ්ජුරුවන් වහන්ස එසේ කීම් එතකුදුළවත් මළවුන්ගේ ශරීරය නම් වියළි පරඬලාපතක් මෙන් රසයක් නැත්තේය, එබැවින් ඒ දුක්ඛජීවිකාවෙන් ප්‍රයෝජන කිම්ද දේව

යන්වහන්ස පහන්ළවමැනව මට වරයක් දුනමැනව- නුබවහන්සේගේ රට සම්පූර්ණවූ මනුෂ්‍යයන් ඇති එක් ජනපදයක් මට ගොදුරුපිණිස දෙනුලැබේවයි ඒ ජනපදයෙහි මනුෂ්‍යයන්ගේ පහනුවූ උෂ්ණවේග ඇති ජීවරුධිරයද ජීව මාංසයද සැපසේ උනුළනුයේ සිත්සේ කාබී බොහෝකලක් ජීවත්වියහැකියයිකී.

එවේලෙහි රජතෙම කොල පවිටුවූ රකුස්ය මම ප්‍රාණවධයක් අනු නොදනිම් තාගේ ග්‍රාහවිකාරය අරුවයිකී. එබැවින් ජනපදයෙක මනුෂ්‍යයන් නාරි නාබැවින් දවසක් දවසක් පාසා එක් මනුෂ්‍යබිලියක් දුනමැනවැයිකී. ජීවබලි එකකුදු නොදෙමියි රජු රුවන් තිකල්හි මබඳුවූවන්ට කල්පවෘක්ෂයෝද පවා අවනෙක්ෂිවූවාහු ඝටව අනත්‍ථීනවූවාහුවෙති යනාවේ බස සැබව බෙදය අදෝමය නස්නාලද්දෙම්වෙම්, මම තුම්කෙරෙම්ද්‍යෙහොයි බෙදායෙන් බැගෑවූ නෙත් ඇත්තේ දුම්මුබවූයේ එහෙයින්ම දෙම්නසට පැමිණියේ වැටහෙන කිසිවක් නැත්තේ සිටියේයි.

9. ඉක්බිත්තෙන් ඒ දැහැමි සිරිසඟබෝ රජහුගේ මහත්වූ කරුණාතොම ඒ රකුසානොරෙහි උපදනී එරජහුගේ සිතාවිවරයෙන් ව්‍යාකූලවූවා කෙළෙයි. ඉක් බිත්තෙන් රජතෙම මෙසේවූ තර්කයක් කෙළේය.

10. නානුස්සරාමි වත යාචිතුමා'ගතානං
මි'ච්ඡාවිඝාතපරිතාපහතප්පභානි
හෙමන්තතිබ්බහිම මාරුත නිස්සිරීක
පංකේරුහෙහි සදිසානි මුඛානි ජාතු.

යම්කිසි වස්තුවක් ඉල්වන්ට මාකරා අාවවුන්ගේ ඉච්ඡාවිඝාතයෙන්වූ සන්තාපයෙන් නසනලද්දාවූ ශෝභාඇති හේමන්තකාලයෙහි දරුණුවූ හිමවයින් ශොභා රහිතවූ පත්මයන්හා සාදෘශ්‍යවූ මුඛයන් කිසි කාලෙකත් එකානතායෙන් සිහිනොකෙරෙම්.

Digitized by Google

11. මේ රාක්ෂසයා කාරණකොටගෙණ මෙරමාට දුක්පමුණුවන්ට කවරකලෙකත් නොහැක්ක—මමද ආධ්‍යාත්මිකවූ දනය කවරකාලෙක්හි දෙම්දැයිහොයි ප්‍රාර්ථනාකෙරෙමි ඒ මේ ආධ්‍යාත්මික දනයට ප්‍රාප්ත වූකල් ඇත්තේවිය මාගේ සත සරීරයට ඉසුරුවූ යෙම් මම්මය මාගේ මස්ලෙහෙයෙන් මේ රාක්ෂසයා සන්තර්පණය කෙරෙමියි කාරණලද නිශ්චයඇති ඒ රජෝත්තමතෙම අමාත්‍යජනයා සමීපයට කැඳවා මෙසේ කීයේසී.

12. ඉමං සරත්තංපිසිතං සරීරං
ධාරෙමි ලොකස්ස හිතත්ථමෙව
අජ්ජාතිථෙය්‍යත්ත මුපෙති තංචෙ
ඉතො පරං කිං පියමත්ථිමය්හං—*

යනුහෙයින් එඹා පින්වත්නි ලේ මස් සහිතවූ මේ ශරීරය සත්වලෝකයහට හිතපිණිසම දරමි එසේ හෙයින් ඒ ශරීරය අදදවසේ මේ රාක්ෂසයාහට අතිථි සත්කාරබව පිණිස හෙවත් ආගන්තුක සත්කාර පිණිස ඉදින් සැපමිනියේද මෙයින් බැහැර මට කවර ප්‍රියජනක කාරණයෙක් ඇද්දැයි කීසේකි.

ඒ ඇසූ අමාත්‍යයෝ මේ රාක්ෂසයා පිණිස සියල්ලෝකයා අසරණකරන්ට කැමැතිවන්නාවූ රජ්ජුරුවන් වහන්සේගේ මේ ධර්ම්මාග්‍රහය කවරේදැයි මෙසේ කීවාහුයි. ඉක්බිත්තෙන් ඒ දැහැමිසිරිසඟබෝ රජතෙම මෙසේ කීයේය.

13. නිබොපභොගස්ස ධනස්සචාපි
න යාචකෙ දට්ඨුමහං ලභාමි
එවං විධං අත්ථි ජනනාථලබ්ධං
න දෙවතාරාධනයාපි සක්කා—

* උපජාති-සත්වෙනි වෘත්තයයි. මෙහි පළමුවෙනි සතරවෙනි පාද උපෙන්ද්‍රවජ්‍රායි, දෙවෙනිතුන්වෙනිපාද ඉන්ද්‍රවජ්‍රායි සලකනු.

Digitized by Google

යනුහෙයින් එම්බා පින්වත්නි නිරන්තරයෙන් සත්ව යන්ට ප්‍රයෝජනඇති ධනයවද පවා යාචකයන් දනින්ට මම නොලබම් මෙබඳු ප්‍රකාරඇති යාචකජනයා දේවතාරාධනාවෙනුදු ලබන්ට නොහැකිය එහෙයින් තෙපි හැම පහව යා මාගේ දනට අනතුරය නොකරවයි කීහ.

ඉක්බිත්තෙන් අමාත්‍යයෝ ඉදින් මෙද නිශ්චයවී නම් නොහැරියයුත්තේවීනම් අප ඇමදෙනා අතුරෙහි එකෙක් එකෙක්ම—[දවසක් පාසා යක්ෂයාට කිලියමට වේවයි කීවාහුය. ඉක්බිත්තෙන් රජතෙම මම ජීවත්වන්නෙම් මෙසේ අනු නොදනිමියි කියා ශල්‍යකර්ත්තෘහු යුහුව මෙතනට ගෙණෙවයි විධානකෙළේයී. ඉක්බිත්තෙන් ඒතැන්හි රැස්වූ සියලු ජනයෝ එපවත් අසා රජ්ජුරුවන්ගේ ගුණයෙහි අනුරාගඇත්තාහු හෙවත් ඇලුනාහු ශෝකයෙන් තැවිනාහු රාක්ෂයා කෙරෙහි පිහිටියාවූ *]

14. රෝෂයෙන් අතිශයෙන් කිපියාහුම වෙන වෙන මෙසේ කියන්නාහුයි. කෙසේද මේ රාක්ෂසතෙම ශීර්ෂච්ඡේදයට හිසකැපීමට සුදුසුයයි සමහර කෙනෙක් කියති මේ රාක්ෂයාගේ කෘෂ්ණ මේඝකූටයකට බඳුවූ ශරීරය නොයෙක් සියදහස්ගණන් ශරයන්ට හියවුරුබවට පමුනුවන්ට යෝග්‍යයයි සමහරකෙනෙක් කියති දමාලා අන්නා රිටි කෝල්ආදීන්ට ලකක් කැළියක් බවට පමුනුවන්ට සුදුසුයයි කියාද සමහරකෙනෙක් කියති ඛණ්ඩනයෙන් කාදලික්‍රීඩාවෙන් මෙතෙම වධකටයුතුය කඩුවෙන් කෙසෙල්කඳ පොලුගසන් නාක්මෙන් පොලුගයන්ට යෝග්‍යයයි සමහරකෙ

* පෙලේ මේ කාණ්ඩය අඩුබැව් පෙන්නුයෙමු. පෙර 20 වෙනි පිටේ අධොලිපිය බලනු.

නෙක් කියති—තොල්කඩින් සකලශරීරය වෙළා මහත්වූ වග්නිස්කන්ධයෙන් දවා හළුකටයුත්තේයයි සමහරකෙනෙක් කියති-මෙසියලු රජ්ජුරුවන්වහන්සේ අනු නොදනාසේක මේ අසත්පුරුෂයා නොමරා අල්වාගෙන ලණුවෙන් උක්සකුරුපිඩක් වෙළන් නාක්මෙන් වෙළා සිරගෙයි ලියයුත්තේයයි සමහර කෙනෙක් කියති. මෙපරිද්දෙන් එතැන්හි බොහෝ කොට කියන්නන්ගේ අතිශයෙන් කර්කශවූ වධ විධානය රක්ෂසතෙම අසා තැතිගත්තේ එතැන්හි සජාතවූ මැඩක්සේ මෘතශරීර ඇත්තාක්හු මෙන් මළ එකෙකු සේ නිශ්චලව ම සිටියේය.

15. ඉක්බිත්තෙන් එ දැහැමි සිරිසඟබෝ රජ තෙම යහළුවූ රක්ෂසය මහත්වූ උපකාරයට කාරණාවූව මෙසේ එව.

දෙයස්ව දනං පවනාව චිත්තං
අජ්ජී තුවං ලොහිතමංසකාමී
සමෙතමෙතං හි තයනුරූපං
මනොරථො සිජ්ඣතු නො උභිනනානි.*

දීයයුතු දනවිසතුවද දනට නැමුනු සිතද ලේමස් කැමැත්තාවූ යාචකවූ තෝදයනමේතුන පැමින ගත නොහැක්කේ දූන් එක්විය. අප දෙදෙනාගේ මන දෙළ සිඹවේවයි කියා මාගේ ශරීරයෙන් දෙනුලබන්නාවූ ජීවමාංසයද ජීව රුධිරයද මාකෙරෙහි අනුග්‍රහයෙන් පිළිගනුවයි ඒ රක්ෂසයාහට කියා කර නැවැම්යාට අභිමුඛ කොට මස් ලියාදෙනු පිණිස දකුණත දිගු කළසේක.

*උපජාති—අටවෙනි වග්ගයයි. පළමුවෙනි දෙවෙනි පාද ඉන්ද්‍රවජ්‍රායි—තුන්වෙනි සතරවෙනි පාද උපේන්ද්‍රවජ්‍රායි සලකනු.

Digitized by Google

16. ඒදුටු රාක්ෂසතෙම දෙඅතින් දෙකණවසා ගෙන
රජ්ජුරුවන් වහන්සේගේ විද්‍යමානවූ පාපයද අනභි
වෘධියද නාසනලද රජ්ජුරුවන් වහන්සේට සවසථක
වේවයි ජිවත්වනු කැමැත්තාහට විෂමිශ්‍ර භෝජනයක්
මෙන්ද අවුවෙන් මිරිකුණාහට ලැව්ගින්නක් වටක
ළාක් මෙන්ද මහත්වූ අකුශල විපාකයෙන් මේ
කිමෙක් පැමිනියේදැයි. ඉදින් මෙබඳුවූ මේ කල්පනාව
වෙසමුණු මහරජ්ජුරුවන් සමීපයෙහි උපන්නේ වී නම්
මාගේ හිස්හි දෙවියන්ගේ ආඥව ඒකාන්තයෙන්
හෙන්නේය ලෝකපාල දෙවියෝද මාගේ හිස් සිඳිති
මමද මෙබඳුවූ ප්‍රකාරඇති අපරාධයක් නොකෙ
රෙමියි නොපිළිගති.

17. ඒ වේලෙහි රජතෙම එබැවින් රාක්ෂසය තාට
කුමක් මාවිසින් කටයුතුදැයි කී ඉක්බිත්තෙන් ඒ රාක්ෂ
සතෙම මහජනයාගේ වධ විධානයෙන්ද රජ්ජුරු
වන්ගේ ආඥවෙන්ද භයපත්වූයේ තැවුනේ දේවයන්
වහන්ස මම අනිකක් නොපතමි බල ඒකොත්ඇත මෙ
තැන් පටන් රජ්ජුරුවන්ට සුදුසුවූ භෝජනයෙන් ගම්න්
ගම උපහාර බලියක් ලබනු කැමැත්තෙමියි කීය. ඉක්
බිත්තෙන් රජතෙම රටවැස්සෝ මෙසේ කෙරෙත්වයි
කියා නුවරද සියලු රටද බෙරහසුරුවා ප්‍රාණඝාත
යෙන් වැලක්ම පිණිස අවවාදකොට ඒ රාක්ෂසයා
වසන තැනට යවී.

මෙසේ රකතාක්ෂ දමන සංඛ්‍යාතවූ සවන පරිචේජ
දශ නිමි.

පරිච්. VII.

1. ඉක්බිත්තෙන් කිසිකලෙක්හි වර්ෂා අධිකකොට ඇති නොහොත් ඓශ්වර්ය්‍යයෙන් ප්‍රමත්තවූ වස්සවලාහක දේවතාවන්ගේ ප්‍රමාදයෙකින් වෘෂ්ටි විඝාතයෙක් මහජනයගෙත් පහළවී.

නිදාඝවෙගෙන රවී පතාපි
උණ්හාභිතත්තො පවනො ඛරො ච
ජරාතුරෙවාසිසිර ධරා ච
පිවිංසු තෙ සබ්බි සබ්බමම්බුං—

යනුහෙයින් ඝර්මවේගයෙන් තෙජස්ඇති සූර්ය්‍යාද උෂ්ණයෙන් තැවුනු කර්කශවූ මාරුතයද සිහිල්නුවූ පෘථිවියද යන මොහු තුන්දෙන ජ්වරයෙන් පීඩිතයන් මෙන් සියලු ජලය සර්වප්‍රකාරයෙන් පූවාහුයි.

2. අනෙත්‍රා හුසුණ්හෙන විපච්චමානා
සනිස්සනමෙහාහරිතෙව චාවී
තිබ්බාතපක්කන්තවනන්තරාජී
රුතාකුලා ඛායති චීරිකානං.

දරුණුවූ අව්වෙන් මඩනාලද වනරේඛාතොම සීරුන් ඇඬීමෙන් ගැවැසීගත්තී ඇතුළත්හි තරවූ උෂ්ණයෙන් හඬනු ලබන්නාවූ නාදසහිතවූ ජලයෙන් පිරුණාවූ සැළක්මෙන් වැටහේ.

3. වස්සානකාලෙපි පභාකරස්ස
පතාපසන්තාපිතමන්තලික්ඛං
සමාචිතං පණ්ඩරවාරිදෙහි
සචන්දනාලෙපමිවාතිරෙචි.

වර්ෂාකාලයෙහි පවා සූර්ය්‍යාගේ සන්තාපයෙන් තැවුනාවූ ආකාශයතෙම පණ්ඩරවන් වලායෙන් ගැවසී

ගන්නේ සඳුන්කල්ක ආලේපසහිතයක් මෙන් අතිශයෙන් බැබලිනි.

4. මෙසේ මහත්වූ ග්‍රීෂ්මයාගේ පැතිරීමෙන් ගංහෝ විල් හෙළ් ආදිය වැළිහා මඩ අවශේෂකොට වියළුනුකල්හි කුඹුරුවල මලාවූ ගොයම් ඇතිකල්හි බහුප්‍රකාරයෙන් පැළුනාවූ භූමිප්‍රදෙශ ඇතිකල්හි පැන් නැතිබැවින් මෘගයන්හා පක්ෂීන් මිරිකුනුකල්හි එපවත් අසා රජතෙම කරුණාවෙන් කම්පිතවූ ලඈත්තේ අෂ්ටාංගසීලය සමාදන්ව රුවන්වැලි මහසෑ මළුවට අවුත් මේඝයතෙම හැමතැන්හි පතළාවූ ජලධාරාවෙන් සියලු ලංකාද්වීපය පිනවමින් වැසිවැස මහත්වූ ජලප්‍රවාහයෙන් යම්තාක්කල් මාංනුල්පවාද එතාක්කල් මියෙම්නාමුදු නැඟිනොසිටිමියි තරවා අධිෂ්ඨානකොට ඒ චෛත්‍යඞ්ගනයෙහි සලපතර මත්තෙහි සැතපිනි.

5. එක්ෂණයෙහි ඒ දැහැමි සිරිසඟබෝ රජහුගේ ශීලතෙජසින් චකිතවූද අවශිෂ්ටගුණප්‍රබන්ධයෙන් ප්‍රසන්නවූද දිව්‍යනාගයන්හා යක්ෂයන්ගේ ආනුභාවයෙන් හාත්පසින් වස්සවලාහකයෝ නැංගාහුයි හෙවත් වැසිනැඟී. එසේමැයි—වැසිනැඟුයේ මේ ප්‍රකාරයෙන්මැයි.

6. දීඝා මිනානත්තාව දිසාපයාමං
විප්ඵාරයන්තාංව තමං සිබාහි
ඡායාගිරීනං විය කාලමෙඝා
නභප්ලාංදුසගතා ලසිංසු.

කාලමේඝයෝ ආකාශතල නැමැති කැටපතට පැමිණියාහු බැබලුනාහුයි,—කුමක්මෙන්ද දිගාන්තරයන්ගේ දිග දිගින් මනාන්නාවුන්මෙන්ද අන්ධකාරය පතුරුවන්නාවූ පර්වතච්ඡායා මෙන්ද බැබලුනාහුයි.

Digitized by Google

7. ගම්භීරධීරධනිතා පයොදා
තහිං තහිං වස්සිතුමාරභිංසු
සමුන්නදන්තා සිඛිනො කලාපං
සඤ්චාරයුං ඡත්තමිවුන්නමෙන්තා.

මේඝයෝ ගැඹුරුවූ මහත්වූ ගර්ජනා ඇත්තාහු ඒ ඒ තැන්හි වසින්ට පටන්ගත්හ—මයූරයෝ කේකාධ්වනි පවත්වා පිල්වැටි තමන්ගේ ශීර්ෂයෙහි ඡත්‍රයන් මෙන් දැරූය.

8. මුත්තාකලාපා විය තෙහි මුත්තා
ලම්බිංසු ධාරා පසමිංසු රෙණූං
ගන්ධො සුභො මෙදිනියා චචාර
විතඤ්ඤමානො ජලදනිලෙන.

ඒ මේඝකූටවලින් මිදුනාවූ ජලධාරාවෝ මුතුකලප් මෙන් එල්ලෙන්නාහුය—රජස්ධූලීහු සන්හුන්හ ශෝභනවූ පෘථිවියෙහි දුඹුළු සුවඳතෙම මේපවනින් පැතිරෙනු ලබන්නේ හැසිරින.

9. ජුතීහි ජම්බුනදපිඤ්ජරාහි
මුඤ්චං දිසන්තා අනුරඤ්ජයන්තී
මෙඝස්ස තාලිතුරියානුයාතා
විජ්ජුලතා නච්චිවාචරිංසු.

විද්‍යුල්ලතාවෝද හැසිරෙත් කුමන්මෙන්ද ජාම්බෝනදස්වර්ණයසේ පිඟුවන්වූ ශෝභාවෙන් දිගන්තරයන් රඳන්නාහු මේඝධ්වනි පංක්ති නැමැති තූර්‍ය්‍යනාද අනුවගියාවූ නෘත්‍යයක්මෙන් ස්වර්ණස්වර්ණයෙහි හැසුරුණාහුය් තුමක්මෙන්ද,

10. කොධෙන රත්තා විය තම්බවණ්ණා
නිනාදයන්තා ජයපීතියාව
ගවෙසමානා විය ගිම්හවෙරිං
චරපිංසු සඞ්ඝෙ තද මහොඝා.

යනුහෙයින් ක්‍රොධයෙන් රත්ව ගියවුන්මෙන් තඹ වන්වූද ජයප්‍රීතියෙන් නාද පවත්වන්නාවුන් මෙන්ද ග්‍රීෂ්මනැමැති සතුරා සොයන්නාවූන් මෙන්ද හැම තැන්හි එකල්හි මහවතුරු පතළේයි.

11. මෙබඳුවූ ප්‍රකාරඇති වර්ෂා පැවැතිකල්හිද රජතෙම මා මහවතුරු නොඉල්ලාවූයේයයි නැඟි නොසිටියේමැයි ඉක්බිත්තෙන් අමාත්‍යයෝ සලපතර මළුයෙහි පැන්යන්නාවූ නැසින් වැස්වූහ ඇතුළෙහි සම්පූර්ණවූ ජලයෙන් රජහු ඉල්පවිය ඉක්බිත්තෙන් ඒ රජතෙම නැඟිසිට චෛත්‍යයට මහත්වූ උත්සව කොට රජගෙට ගියේයි.

12. ඉක්බිත්තෙන් දඬනයක් නැති විසින් ශස්ත්‍රයක් නැති විසින් හෙවත් දඬදුන ශස්ත්‍රදනයක් නැති විසින් රාජ්‍යඅනුශාසනා කරන්නාවූ රජහුගේ අතිශයෙන් මොළොක්වූ සිත්ඇතිබව දැන උඩඟුවූ කිසි මනුෂ්‍යකෙනෙක් ගම්පැහැර්ම් ආදිය කරන්නාහු සොරවූහ. ඒ අසා රජතෙම ඒ සොරුන් ජීවග්‍රාහ කොට නොමරා අල්වා සිරගෙයිලා රහසිගතව කවුරුනුත් නොදන්නා පරිද්දෙන් ඔවුන්ට රන්රුවන් ආදිය දී මෙසේ මතු නොකරවයි අවවාදකොට සවාරාත්‍රියෙහි අමුසොහොනෙන් මෘතශරීරයන් ගෙන්වා සොරුන් හිංසාකරවන්නක්හුමෙන් ගින්නෙන් දලවා නුවරින් පිටත දැමමවූයේය. මෙසේ සොරභයද පහ කොට එක්දවසෙක මෙසේ සිතී.

13. ඓශ්වර්‍ය්‍යසම්පත්තියෙන් මට ප්‍රයෝජන කිම්ද සම්පූර්ණවූ භාණ්ඩාගාරඇති පරිවාර ජනසහිතවූ අන්තඃපුරවාසීන්හා අමාත්‍යයන් සහිතවූ සේනාවාහන සහිත මේ රාජ්‍යය කිසිවක්හට දනසවරූප යෙන්දී වනයට වැද සිල්සමාදන්ව කායවිවේක චිත්ත

විවේක උපදවන්ට වටනේයයි රාජ්‍යය හැර තපසට
යාමෙහි ඇල්ම ඉපදවී.

එකල්හි ඒ බෝධිසත්ත්වවූ රජතුමාගේ අභිප්‍රාය සිඛ
කරණපිණිස මෙන් ගෝඨාභය නම්වූ භාණ්ඩාගාරයෙහි
නියුක්ත පුරුෂතෙම මෙබඳුවූ පාප කල්පනාවක් කල්
පනා කොළේයි. මේ දැහැමි සිරිසඟබෝ රජතෙම
ධර්මිෂ්ඨය සත්පුරුෂයන්ගේ ආචාරයෙහි දක්ෂය දව
සක් දවසක්පාසා කරනුලබන්නාවූ දශවිධ කුශල
කර්මයෙන් ආයුසංස්කාරය ඕහට වඩනේය එසේහෙ
යින් උපපීඩක කර්මයෝද එරජහට පහවෙති එහෙ
යින්ම ඉතා බොහෝ කලක් ජීවත්වන්නේය, මේ රජ
හුගේ ඇවෑමෙන් මම කවරකලෙක්හි රාජ්‍යය ලබ
ම්ද රාජ්‍යශ්‍රීයට පැමිනාද අතිශයෙන් වෘඬවූ මම තරුණ
ජනයා විසින් සේවනය කටයුතුවූ පචකාම සැපය
කෙපරිද්දෙකින් අනුභව කොරෙම්ද වහා මේරජහු
මේනුවරින් පලවා රාජ්‍යයෙහි පිහිටමියි සිතා බොහෝවූ
මුක්තාමාණික්‍යාදි සාරධනය ඇරගෙන උතුරුදිග
වාසල්දොරින් නික්ම පූර්වයෙහි සොරුන් එක්කරවා
සේනාසමූහය ගෙනඅවුත් නුවර වාසල්දොර ගත.

එපවත් අසා රජතෙම රාජ්‍යය කිසිවක්හටදී ගෘහාභි
නිෂ්ක්‍රමණය කොරෙම්ද්‍යෙහොයි කරණලද සනිටුහන්
ඇති මාගේ කිසිම දෙවිකෙනෙකුන්ගේ ආනුභාවය
කින් මේ සනිටිකරණලදැයි හඟිම් අමාත්‍යයෝ මා
විසින් අනුනොදන්නා ලදහුද ඇසිල්ලකින් යුඬයට
පටන්ගනිති එසේකල්හි මානිසා ස්වපක්ෂ ප්‍රතිපක්ෂ
දෙකට ගියාවූ මහජනයාට බොහෝවූ දුක්ඛය වන්
නේය මේ රාජ්‍යයෙන් මට කවර ඵලයෙක්ද රාජ්‍යය
කැමැත්තාවූහටම දෙනුලද්දේවේවයි සිතා කිසිවක්හට
නොදන්වා පෙරහන්කඩ පමණක් ගෙණ කිසි

Digitized by Google

කෙනෙකුන් විසින් නොහඳුනනු ලබන්නාවූ වෙස් ඇත්තේ දකුණුදිග වාසල්දෙරින් නික්ම මායාරටට යන්නේ.

14. සදා සන්තුට්ඨචිත්තානං සක්කා සබ්බත්ථ ජීවිතුං
කුත්‍ර නාම න විජ්ජන්ති ඵලමූලජලාලයා—*

යනුහෙයින් හැමකල්හි ලදදෙයකින් සතුටුවූ සිත් ඇත්තාවුන් ජීවත්වන්ට හැමතැන්හි හැකිව ඵලය මූලය ජලය ගෘහය යන මොහු කොතැන්හිනම් නැද්දැයි.

15. මෙසේ සිතන්නේම ක්‍රමයෙන් ගොස් අත්වනගලු නම්වූ මහත්වූ අරණ්‍යස්ථානයට වන්නේය. එහි තුනීනොවන්නාවූ ඝනවූ ලපලු පත්‍රයෙන්ද පුෂ්පඵල යනමෙයින් ගැවසීගත්තාවූ පලල්වූ ශාඛාමඩලඇති කුදු මහත් නුග් නොම්බි කොස් මී හඹ ගිවුල් තිඹිරි දෙසි ළ දඹ බුළු නෙල්ලි අරළු රිටි සල් හොර මුහුළු කින දෙඹ නා කොළොම් හොපලු මිදෙල් සපු කිතුල් තල යනමේ ආදිවූ අනේකප්‍රකාරවූ වෘක්ෂ සමූහයා විසින් ගැවසීගත්තාවූ බොහෝ නිර්මල පර්වත ප්‍රාන්තයෙන් වැටුනු නදීන් එක්වූතැන තොටට බට අනෙකප්‍රකාර මුවමුළු සමූහයාගෙන් ඝමානවූ පක්ෂිසමූහයා විසින් සෙවිනාලද මහෙශාක්‍යදෙවියන් විසින් අධිගෘහිතවූ නන්දන වනයමෙන්මනොඥවූ මූලඵලජාතිය ජලය යන මොවුන්ගේ සැපසේ අනුභවකිරීමෙන් සිත්කලුවූ ඒ මහවනය බලා මේ වනය මට තපෝවන වන්ට සුදුසුයයි කරනලද අංලාස ඇත්තේ කායවිවේක චිත්තවිවේකයන්ගේ ලැබීමෙන් එකාගවූ

* පඨමවග්ගං, තුන්වෙනි වර්ගයයි.

සිත්ඇත්තේ මෛත්‍රීභාවනායෙහි යෙදෙන්නේ වන සෙහිවූ ජීවිකායෙන් හටගත්තාවූ සනෙතාංශයන්ගේ පැතිරීගමන් පිරුණාවූ ශරීරඇත්තේ වාසයකෙරෙයි.

මෙසේ අභිනිෂ්ක්‍රමණය කළාවූ සත්වන පරිචෙඡ දය කියා නිමවනලදී.

පරිච. VIII.

1. ඉක්බිත්තෙන් ගොඨාභයද රාජ්‍යයට පැමිණ කීපදවසක් ඇවෑමෙන්, මාගේ වඩබව හේතුකොට ගෙන පහවූ ඇලුම්ඇති ප්‍රජාවශ්‍යතෙම වනයට වන් නාවූ සංඝබෝධි රජ්ජුරුවන් ගෙනවුත් රාජ්‍යය කරන් නට කිසිකලෙක්හි උත්සාහකරන්නේයයි හටගත් තාවූ ශංකා ඇත්තේ ඒ රජහු මරවන්ට වටනේයයි රුචිකොට සිරිසඟබෝ රජ්ජුරුවන්ගේ ඉස යමෙක් ගෙනාවේවිනම් ඔහට කාවණු දහසක් සන්තෝෂ ධනයයි නුවර බෙර හැසිරවී.

ඉක්බිත්තෙන් මංයාරට වෑන්නාවූ කිසි දුගීපුරු ෂයෙක් තමාගේ කටයුතුතාක්නිසා බත් මුලක් හැර ගෙන වනයෙහි මගයන්නේ බත් කනවේලෙහි ගල්කොම් සමීපයෙහි උන්නාවූ ඒ සිරිසඟබෝ රජ්ජු රුවන් දැක ඒ රජ්ජුරුවන්ගේ ආකල්පයෙන් ප්‍රසන් නවූ සිත්ඇත්තේ ආහාරයෙන් ඒ රජහු පැවරීය, රජ තෙම ඒ පුරුෂයා කීවචනය නොපිළිගත, එවේලෙහි ඒ පුරුෂතෙම මම හීනජාතියෙක්හි උපන්නෙම් නොං චම් ප්‍රාණවධයෙකට ජීවත්වන්නාවූ කෙවුලෙක්හෝ වැද්දෙක්හෝ නොවම් වැලිදු උත්තමවූ ජාතිඇති

Digitized by Google

අනුභවයට යෝග්‍යවූ වංශයෙහි උපන්නෙම් වෙම් මේ ආහාරය මාසතුය අනුභවකරන්ට සුදුසුය කලණ ස්වභාවැති උතුමානන්වහන්සැයි නැවත නැවත ඒ රජහට යාචඥා කෙළේයි.

2. එසේ යාචඥා කළ ඉක්බිති රජතුමාතෙම

භායාග නෙහං සබ්බාය සෙය්‍යා වත්ථං තවෙනච
අසනං ඵලපතෙතාහි සාධෙනති තරමො මම.

3. එවංසම්පනන භොගස්ස න තණ්හා
[පරයනතාකො
තව ජවවාදි මුද්දිස්ස ගරහා මෙ න විජ්ජතීති—

සනුහෙයින් වෘෂභයෝ තමන්ගේ භායාවෙන් මට ශයනයද අත්තෙන් මට ආසනයද සුඹුළෙන් මට වස්ත්‍රසද ඵලයෙන්හා කොළින් මට ආහාරයද සිඩකෙරෙති මෙසේ සමෘඬවූ භොග ඇති මට අනුන්සනතකයෙහි තෘෂ්ණාවකුත් නැත තාගේ ජවාෂදීන් උදෙසා ගර්හාවකුත් නැතැයි කියා නොඉවසූයේ මය.

4. ඉක්බින්තෙන් ඒ දුගී පුරුෂතෙම භූමියේ වැදහෙව නමස්කාර කරන්නේ ඇච්චිලිව යාචඥාකොළේයි, ඒ පුරුෂයාගේ ඇච්චිලිය වලකන්ට නොහැකිවැ ආදරගෞරව සහිතවැ ඔවුන්විසින් දෙනලබන්නාවූ ආහාරයද තමන්ගේ පෙරහන්කඩින් පෙරාපැන්ද අනුභවකොට අත කට තේදීමෙන් සමාප්තවූ ආහාරකෘත්‍යඇත්තේ මොහු විසින් කරනලද උපකාර ඇත්තෙම් කෙබඳුවූ ප්‍රත්‍යුපකාරයක් මෝහට කෙරෙම්දෝහෝයි සිතන්නේ ඔහු තමාට අභිමුඛකොට අනුරාධ පුරයෙහි පවත් කවරේදැයි විචාළේය.

එබසට ඒ පුරුෂතෙම පළමු රජ්ජුරුවන්වහන්සේ පළවා ගොඨාභය නම් රජෙක් රාජ්‍යයෙහි පිහිටා දැහැම්සිරි සඟබෝරජහුගේ ඉස යමෙක් ගෙනවුත්

Digitized by Google

දක්වාද ඕහට දහසක් සතුටු පඬුරුයයි සුවර බෙර හැසුරුවූලයි ඇසිඹියි කී.

5. ඒ මගියාගේ වචනයට අනතුරුවම තුටුපහටු සිත් ඇත්තේ මාගේ දනයට යොග්‍යවූ ශීර්ෂදනයෙන් දුන් මෝහට ප්‍රත්‍යුපකාර කරණලද්දේවෙයි අධ්‍යත් මික දනයක් බැවින් දනපාරමිතාවද කෙළපැමිණියේ වේදැයි කොල මෙයිත්එක්කල්පනාවෙකි.

6. න පූතිපූගීඵලමත්තකම්පි
අග්ඝන්ති සීසානි විජීවිතානං
සීසන්තු මෙ වත්තාති බොධියා ච
ධනස්ස ලාභාය ච අත්ථිකස්ස—

සත්‍යහෙයින් මළවුන්ගේ ශීර්ෂයෝ ද කුණු පුවක් ගෙඩියක් පමණකුත් නොනගිති මේ මාගේ ශීර්ෂය වනාහි අදවූ කලී සර්වඥතාඥනය පිණිස ද මේ මගියාට ධනලාභය පිණිස ද පවත්නේය—තාවද,

7. නාළිවණයොසව රුජාකරස්ස
පූතිප්පධානස්ස කළෙබරස්ස
දුක්ඛනාත්‍රිභූතං පටිජග්ගනෙන
සදාවියොගා සඵලං කරොම්ති—

අතිශයෙන් රෙදීමකරන්නාවූ නාඩි ව්‍රණයක්මෙන් කුණපය ප්‍රධානකොටඇති මේ ශරීරයාගේ පිළිදැගී මෙන් දුක් අනුභවකරණලද ප්‍රයෝජනයෙහි සෙදී මෙන් සඵල කෙරෙමියි සිතා—කරණලද නිශ්චයඇත් තේ පින්වත්වූ පුරුෂය සිරිසඟබෝ රජනම් ඒ මගිය මාගේ ඔබ් හිස ඇරගෙන ගොස් රජහට දක්වයිකී. එතෙම ඒ අසා දේවයන්වහන්ස මම මෙබඳු ප්‍රකාර ඇති පව්වූ කර්මයක් නොකෙරෙමි බමිය්කී.

8. එවේලෙහි රජතෙම තෝ නොබ මසුදුස ලැබීම
පිණිස මම්ම තට උපකාරකෙරෙමි හුදෙක් තෝ මා
විසින් කියනලද ක්‍රමයෙන් පිළිපදුවයිකියා සහස්‍රලාභ
යෙහි ගිජුවූ ඒ පුරුෂයා විසින් ඉවසනලද කල්හි ශීර්ෂ
ච්ඡෙදය පිණිස ශස්ත්‍රයක් නොලබන්නේ ධර්මාධි
ෂ්ඨාන තෙජසින් ශීර්ෂය සනාධියෙන් වෙන්කොට
දෙමියි සිතා හෘරම්ණීය නාදකොට බැඳ මාගේ මේ
ශීර්ෂදානය සර්වඥතාඥානයාගේ ලැබීම පිණිස කාර
ණාවේවයි කියා සොම්නස් පෙරදැරිකොටඇති ප්‍රාර්ථ
නාවකොට, ඒ මගී පුරුෂයා තමා සමීපයට කැඳවී
ඒ පුරුෂතෙම පූර්වයෙහි නුදුටු නොඇසූ කොටගත
නොහැක්කාවූ කටයුතුවූ දෙනලද ශීර්ෂදානය ගෙන
අනුරාධපුර නුවරට ගොස් රජහට දක්වමි කවරෙක්
ඒ හිස ඇඳිනගනීද කවරෙක් ඒ අදහාගනිදයිකී.

9. එවේලෙහි දැහැමිසිරි සඟබෝ රජතෙම කියන්
නේ එම්බල පුරුෂය ගෝඨාභය රජතෙම තාගේ වච
නය අදහා නොගනීනම් මම්ම එතැන්හිදී සාක්ෂිකාව
මසුරන් දහසක් දෙවමි තාවිසින් එතැන්හි මෙසේ
කටයුතුයයි පිළිපැදියුතුවූ ආකාරය කියා උගන්වා
එම්බා සත්පුරුෂය මෙසේ මාගේ සමීපයෙහි නැමීසිට
තාගේ දෙඅත්ල එක්කිරීම්වශයෙන් දෙහොතකොට
අත දික්කරවයි කියා උභය පාර්ශ්වයෙහි නීලමනී
නම්වූ ධමනීන්දෙදෙනාගේ සෘජුබවට පැමිනවීමෙන්
ග්‍රීවයෙහි නළ මනාකොට සිටුවා පැනින් තෙමන
ලද පෙරහන්කඩින් ශීර්ෂනාඩිය ජලරෙඛාවෙන් පිරි
සිඳ සවතිය දකුණත්මිටින් කෙස්වැටිය තරකොට අල්
වාගෙන යම්තාක් මාගේ හිස හැරගෙන මගියාඅත
පිහිටුවම්ද එතාක්කල් මාගේ චිත්තජවූ වායෝධාතු
වේගය තෙම අවිච්ඡින්නව පවතීවයි අධිෂ්ඨානය
කොට කෙස්වැටිය උඩට අභිමුඛ කොට ගෙසවිය,

එකෙණෙහිම ශිෂ්ඛණ්ඩය තෙම වෙන්වූ, ඔහුවිසින් දකුණත්මිටින් ගන්නාලද්දේම වැගිරෙන්නාවූ ලේ ධාරාවහා සමඟ මගියාගේ හස්තතලයෙහි පිහිටියේය එකෙණෙහි වෙනෙහි වසන්නාවූ දෙවියෝ සාධුකාර වචනයෙන් මුඛරවූවාහු මල්වැසි වස්වා හිසට ආරක්‍ෂා ගත්තාහුයි,

10. සංසතතාරතතාකලලෙඛකපාණිබෙතෙත
නිකඛිතතාසීසවරබීජ සමුබභවාය
එතසස දනමයපාරමිතාලතාය
සබඤඤුතාඵලරසො ජනතං ධිනොතු—

එක්බැඳිව හැසුනාවූ ලේනැමැති මඩඇති මගියාගේ හස්තතල නැමැති ක්‍ෂෙත්‍රයෙහි පිහිටුවනලද ශිෂී නැමැති උතුම්වූ බිජුවටින් උපන්නාවූ මේ රජහුගේ දනමයවූ පාරමිතා නැමැති ලියයෙහි සර්වඥතාඥාන නැමැති ඵලරසය තෙම සත්වසමූහයා සතුටුකෙරේවා.

11. ඒ ඉක්බිත්තෙන් ඒ මගී පුරුෂතෙම සුවඳ වනපසමලින් ශිෂීය සරහා පුවක්පතසලා ශීඝ්‍රවූ ගමන්වේගයෙන් අනුරාධපුරනුවරට ගොස් ගෝඨාභය රජහට දැක්වී ඒ රජතෙම ඒ හිසදැක හැඳිනගන්ට නොහැකිවූයේ සැකව සිටියේය. එවේලෙහි මගී පුරුෂතෙම රජහු විසින් කීක්‍රමය සිහිකරන්නේ ඒ හිස ගෙන ආකාශයෙහි දමා ස්වාමිනි දැහැමිසිරි සඟබෝ රජ්පුරුවන් වහන්ස මෙතැන්හි මට සාක්‍ෂි උව මැනවැයි දෙහොත් මුදුනෙහි බැඳ ආකාශය බලා යාච්ඤා කෙළේයි. ඉක්බිත්තෙන් ඒ හිස දෙවියන් විසින් අධිගෘහිතවූයේ එල්බීමක් පිහිටක් නැත්තාවූ ආකාශයෙහි ලබනලද පිහිටඇත්තේ ගෝඨාභය රජහට අභිමුඛව—

12. රජ්ජගමෙව සුතදෙ සිරිසංඝබොධි
සීසප්පදානවිධිනාසි සම්බවිතෙතා
තවාසි රජ්ජසිරිලාභසුඛෙන දෙව
එසො ච හොතු පටිපානානසහස්සලාභොසි—

යනාදීන් තමාබව හඟවා දෙස්කී-කෙසේද, ගෝඨාභය රජ්ජුරුවන්වහන්ස නුඹවහන්සේට යහළුවූ දැහැමි සිරිසඟබෝ නම් මමය ඉස දන්දුන් කුශල ක්‍රියාවෙන් සමෘද්ධවූ සිත්ඇත්තෙම්වීම් දෙවයන්වහන්ස රාජශ්‍රීලැබීම් සැපයෙන් නුඹවහන්සේද සමෘද්ධවූ සිත ඇතිසේක මසුරන් දහසක් ලැබීමෙන් මේ මගීපුරුෂයාද සමෘද්ධවූ සිත් ඇතිවේවයිකී.

13. ඒ අසා ගෝඨාභය රජතෙම විස්මපත්වූ ආශ්චර්‍ය්‍යමත් සිත්ඇත්තේ සිංහාසනය සරහා මත්තෙහි දළපුබුස්සත් නංවා මෙතැන්හි දේවයන්වහන්ස බටමැනවැයි යාචඤකොට එතැන්හි බටුවාවූ ශීර්ෂය අනේක ප්‍රකාරපූජාවෙන් සත්කාරකොට නමස්කාර කරණු ලබන්නේ ක්ෂමාකරවා මහත්වූ පූජාවෙන් ආදහන කෘත්‍ය කරවා මගියා කහවණු දහසකින් සන්තර්පණ කරවා යැවී.

මෙසේ අධ්‍යාත්මික දානපරිත්‍යාගය කළාවූ අටවන පරිච්ඡේදය කියා නිමවනලදී.

පරිච. IX.

1. ඒ සිරිසඟබෝ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් කිසවූ වනාහි රජ්ජු ගියබවදැන මම්ද ඔහු අනුවෙමියි එක්තරා අප්‍රසිද්ධ වේශයකින් දකුණුදිග වාසල්දොරින් නික්ම මහවත හැර ඒ ඒ ගම්වලට වැද හිමියා නොදැක සවභාවයෙන් බහන සුලුබැවින්ද බුහුර්තොවන

Digitized by Google

බැවින්ද විචාරන්ටද නොහැකකී මාසාරටටම ගිය ශේක්වනැයි සිතා එල්ලමං නොදන වටකොට යන වංකවූ මගින් යන්නී තමා කොමලබැවින් ඉක්මන්ව යන්ට නොහැක්කී කාජ්‍යවා ඒ වනාන්තරයට කුදු රුවූ ගමෙක්හිදී රජහුගේ ඉස දන්දුන් පවත් අසා ඒ කාලකතානිවූ මමද දැකීම පමණකුදු නොලදිමියි යන ශොකයෙන් පිරුණාවූ සිත්ඇත්තී එම වනලැහැබට වැද සවාමිහුගේ ශරීරය සොයන්නී සම්පගම්වල්හි මහජනයා අතින් විචාරන්නී නොහඳුනනලද සලකුණු ඇතිබැවින් ඒ ඒ තැන්හි ඇවිදිනීය සමීප ගම්වල වසන්නාවූ බාලයෝද ගොපල්ලෝද දර ගෙන යන්නාවූ ස්ත්‍රීහුද ඒ කිසවුන්ගේ බැගෑපත්වූ හඬඅසා කම්පිතවූ ලඇත්තාහු ඒ කිසවුන්හා සමග ඇවිදිති ඒ කිසවුහතාම මෙහේ අඩන්නී සුපුෂ්පිතවූ කුසුමයන් හා නිර්මලවූ වැලිතලාඇති වනලැහැබක් දැක එ තැන්හි වැටියි බිමපෙරලෙන්නී ඉතා බැගෑවූ හැඬීම වැලපීම කලාසි. ඒ ප්‍රදේශය අදදක්වා වැඳඹුවනයයි ව්‍යවහාර කරනුලැබේ.

2. මහත් හැඬීමෙන් රාත්‍රී එහිම යවා දෙවන දවස්ද ඇතමැත ඇවිදිනී මහත්වූ ශොකාග්නීන් තැවෙන්නී සන්තානගතවූ තැවිලිය ඉවසන්ට නොහැකකී එක්තරා කුඩා පොකුණක වැටී ගිලුනීම මූර්ච්ඡා වෙගයෙන් දෙතුන්ඇසිලුක් එහිම හි ලබනලද ආශ්වාද ඇත්තී තැවිලීයනිවූ ඒ ස්ථානය දුන් නිවන්පොකුණයයි යන ව්‍යවහාරලදු.

3. එතැනින් නැගී ලැහබක් ලැහබක් පාසා රුකක් මුලක් රුකක් මුලක් පාසා ගලතලක් ගලතලක් පාසා සොයන්නී ගල්පොකුණ සමීපයෙහි වැද හොාතතාවූ දේවතාවන්ගේ රකවලින් බලුකැණහිල් ආදීන්විසින් තුඩක් නොපහරනාලද නොකනලද

වියලි ශරීරඇති ඉස පුන්නාවූ මෘතකලේබරය දැක ශොකවේගයෙන් පැළීනාවූ ළ ඇත්තියකමෙන් කවඩරූපය ඉතා තරකොට වැලඳගෙන හෝනාලද්දීම ආහාර වෛකල්‍යයෙන්ද දුර්‍ගකතර ගෙවා ඊමෙන්ද ඒ ඒ තැන්හි හිමෙන්වූ කායපීඩාවෙන්ද මිරිකුණාවූ ශරීරඇතිහී මුහපත්වූ වේලාව හා එවිටම කාලක්‍රියා කළාය.

4. අසල ගම්වැස්සෝ රැස්ව ඔවුනු පලන්නාවූ රජහුගේද බිවුසන්ගේද ශරීරය අපවැත්නවුන් විසින් ස්පර්ශ කරන්නටද අල්වවන්නටද සුදුසු නොවෙයි දැන් රජකරණ රජ්ජුරුවන්වහන්සේට නොදන්වා ආදහන කෘත්‍යඃ කරන්නටද සුදුසු නොවන්නෙ යයි මන්ත්‍රණය කොට එක්ව කථාකොට වැසි අවූ වලකනපිණ්ඩ ගෙයන්කොට බලූ කැනහිල් ආදී තිරශ්චීනයන්ගේ ප්‍රවේශය වලකනපිණ්ඩ වට වැට බැඳ එතැනින් නික්මගියාහුයි.

5. ගෝඨාභය රජද ඒ සිරිසඟබෝ රජහුගේ අනන්‍ය සාධාරණවූ ගුණප්‍රබන්ධය සිහිකරන්නේ බාල්‍යයෙහි පටන් බුද්ධාදිරත්නත්‍රය අවශ්‍යයෙන් පිහිටකොට ඇති බවද සතතයෙන් පංචශීලය රක්ෂාකරණලද බවද දීර්ඝනිකායාදී සුගතාගම දැන්මෙහි නිපුනබවද සිව්සැට කලාවෙහි දක්ෂබවද රාජ්‍ය ලෝභය නැතිබවද දන්දීමෙහි ලොල්බවද රාක්ෂස දමනාදී කොට ගත නොහැකකාවූ දුෂ්කරවූ චරිතඇති බවද සිත්ඇත්තාවූ කවර නම් සත්වයක්හට ප්‍රීති නොඑලවාද විශෙෂයෙන් ඒ මිහිපුරුෂයාහට සහස්‍ර ප්‍රතිලාභය පණිස ස්වහස්තයෙන් සවතියවූ ඉසගලවාට සනාථියෙන් ගල වාදිමද අවශේෂවූ ඒ හිස නිරාලම්බවූ ආකාශයෙහි සථානව සිටිමද අතිශයෙන්ව්‍යක්තවූ වචනයෙන් සවතියවූ අභිප්‍රාය දැන්වීමද යන මේ ආශ්චර්‍යද අද්භූතවූ

පෙර නුදුටුවිරූ නොඇසූවිරූ නිර්මලවූ චරිතයෙද
මහත්වූ මාගේ අපරාධ නැමැති කලංකය හාසමඟ
ඉතා බොහෝකලක් පවත්නේය අනේ මම චිරකා
ලයක් පවත්නාවූ මෙබඳු අකීර්තිඝොෂාවෙන් උප
ලක්ෂිතව සාධුජනයා විසින් නින්දාකටයුතුදවෙම් විශෙ
ෂයෙන් වනාහි හැමකල්හිම කල්‍යාණමිත්‍රවූ මෙබඳු
මහත්වූ ආනුභාවඇති කිසිම අපරාධයක් නොක
ළාවූ මහා පුරුෂයාගේ රාජ්‍යය උදුරාගෙන ප්‍රාණවධ
කරවීම් නස්වාපිම් ඒකාන්තයෙන් මිත්‍රද්‍රොහි කර්ම
යෙන් හාත්පසින් වෙළාගන්නාලද්දෙම්වෙම්යි සිතන්
නේම හටගත්තාවූ හයින් නැවිලියෙන් පිටතට නික්
මුනාවූ සෙවද ජලයන්ඇත්තේ කම්පාවූයේ මෙබඳු
මහත්වූ අකුශලකර්මය කෙසේ ගලවා හරිම්දැයි
නැවත නැවත පරීක්ෂාකෙළේය.

6. ඉක්බිත්තෙන් ඒ මහාපුරුෂයාහට දඬුවම් කිරීම්
වශයෙන් අතිශයෙන් මහත්වූ කුශලකර්මයක් මාවි
සින් කටයුතුයයි නුවණට වැටහුනේය, ඉක්බිත්තෙන්
ඒ ගොඨාභය රජතෙම අමාත්‍යමණ්ඩලයා රැස්කොට
ඔවුන්හා කථාකොට කරණලද නිශ්චයඇත්තේ මහ
සංඝයාවහන්සේ විසින්ද එසේම අනුශාසනාකරණ
ලදුව මහත්වූ සිවුරඟසෙනඟහා සමඟ ගොස් ඒ අ
රණ්‍යස්ථානයට හෙවත් ඒ රජතු පළමු උන්තැනට
නුදුරුතැන්හි සේනාව රඳවා ඒ මහාපුරුෂයාගේ දුෂ්
කරවූ නොකොටහැකි අපදාන සංඛ්‍යාත චරිතයට
සාක්ෂිවූ කුශලස්ථානයට රජතෙමේම ගොස් ගල්
පොකුණට නුදුරුවූ සුදුසුවූ ස්ථානයක් සලකා ඒ රජ
තුමාගේ රාජානුභාවයද දක්වන්නේ ආදාහන භූමිය
දිව්‍යපුරයක් මෙන් සරහා උදක්ම මහත්වූ සඳුන්හරින්
අතිශයෙන්ම උස්කොට දරසෑය බැඳ භාරයෙන්හා
ප්‍රමාණයෙන් රජ්ජුරුවන්ගේ ශරීරයහා සාදෘශ්‍යකොට

ජම්බෝනද සුවර්ණයෙන් කණ්ඨනාල සහිතවූ ශීර්ෂ යෙහි ආකාරයද දක්වූ සුවර්ණකාරයන් ලවා කරවා කවන්ධරූප සංඛ්‍යාත හිස්සුන් මළකඳෙහි හිස ගළපා තබා අනේකවිධ රත්නයෙන් බබලන්නාවූ රන්ඔටුන් නක් පලඳවා ඒ රජහුගේ අගමෙහෙසුන් කිසවුන්ද එ පරිද්දෙන්ම සරහා ඒ රාජමහෙසිකා දෙදෙනාම කාසිකවස්ත්‍රයන්හා සාදෘශ්‍යවූ මාහැඟිවූ දුහුල් සළු වෙන් වසා නොයෙක් රන්කර්මාන්ත කරණලද සුවර්ණ මඤ්චකයකට වඩා සඳුන් දරසෑය මත්තේ තබා අත්‍යන්ත පරිශුද්ධවූ ශොභාමත් ගිනි දල්වා නො යෙක් සියගණන් ක්ෂත්‍රිය රාජකුමාරවරුන් විසින් පිරි වරණලද ඒ ගොඨාභය රජතෙම එතැන්හිම සිට නොයෙක් සියගණන් ගිතෙල් කළින් නමා ආදහන පූජාව විශෙෂවිහිතව කැරවී.

7. දෙවෙනි දවස්හිද එසේම මහ පෙරහැරින් ආද හන භූමියෙහි පැන්කල සලවා නිවා ඒ ආදහන භූමි යෙහි වට දාගෙයක් කරවන්ට වටනේයයි සිතා අමා ත්‍යමණ්ඩලයා කැඳවා දන්ම මෙතැන්හි නොයෙක් මාල් ඇතිකොට ඉතා මහත්වූ ඝනරන්මයවූ වටදා ගෙයක් කරවියහැක්කේය එසේ කළකල්හි මතු අනාගත කාලයෙහි පරිහරණය කරන්නවුන්ගේ නොවීමෙන් නොපවත්නේය රත්නත්‍රයෙහි අප්‍රසන් නවූ ගම්පහරණ සොරුන් ආදිවූ අශුභ සත්වයෝද සුවර්ණලොභයෙන් සිඳබිඳ නසති එහෙයින් එබඳුවූ ලාමක ජනයාවිසින් අලෝභනීයවූ නිරාකුලයෙන් පවත්වාගත හැකිවූ පමණින් යුක්තවූ වටදාගෙයක්ද ඒගෙට සුදුසුවූ දාගබක්ද නොබෝදවසකින්ම කැර විය යුතුයයි අමාත්‍යමණ්ඩලයාහා කථාකොට සේනා වට නියෝගකොට යටකියනලද ක්‍රමයෙන් දෙමහල් වටදාගෙයක් කරවා ඒ ගෙය ඇතුළෙහි සර්වඥයන්

වහන්සේගේ ධාතූන්වහන්සේ පිහිටුවා පූජනීයවූ චෛත්‍යයක්ද කරවා ඒ මහොත්සව දිනයෙහි මහ සංඝයා වහන්සේට දක්වා ස්වාමිනි මේදැහැමිසිරි සහ බෝරජ්ජුරුවන් වහන්සේ මේ ශ්‍රීලංකාද්වීපයෙහි පළමු ඒකච්ඡත්‍ර නංවා රාජ්‍යශ්‍රී අනුභවකළසේක දැන්වූ කලි ඒ චෛත්‍ය ස්වරූපඇතිවූ කීර්තිමය ශරීරඇති ඒ රජ්ජුරුවන්වහන්සේට සේසත්පිට සේසත් නැංවූවාක් මෙන් මාවිසින් දෙමහල් වටදාගෙයක් කරවා චෛත්‍ය මස්තකයෙහි කිරීටයක්වැනි ඝනරත්මය කොතකැඩු පලඳවා සියලු දෙව්මිනිසුන්විසින් ගන්ධමාලාදීන් පිදිය යුතු බවටද නමස්කාරකටයුතු බවටද පමුනුවනලද් දේයයි කියා ඒ චෛත්‍යගෘහයට අනේකප්‍රකාරවූ ග්‍රාමක්ෂෙත්‍රයන්ද දහසකට වඩා පරිවාර ජනයාද ලවා. ඒ පර්වතප්‍රාන්තයෙහි අනේක ශතප්‍රාසාද පිරිවෙන් චංක්‍රමණ රාත්‍රිස්ථාන දිවාස්ථාන ධර්මශාලා ගොපුර ප්‍රාකාරාදී වෙන වෙන විභාගවශයෙන් කරණලද අනේකප්‍රකාර සංඝාරාමයන්ද කරවා එහි වාසය කරන්නාවූ නොයෙක් දහස්ගණන් භික්ෂු සංඝයා වහන්සේට නිරන්තර උභය පිණ්ඩ පරිවාර ජනසහිතවූ ග්‍රාමක්ෂෙත්‍රයන්ද ලවා මහලේ රටවනැගූ ධ්වජයක් වැනිවූද මේ ශ්‍රීලංකාද්වීපයට අධිපතිවූ ක්ෂත්‍රිය නරේන්ද්‍රයන්ට කුලපරම්පරාවෙන් පැවතඑන්නාවූ ධනයක් වැනිවූද මේ මාවිසින් කරවනලද රජමහවිහාරය මතු ඇතිවන සියලු රජුන් විසින් නොපිරිහෙලා පැවැත්තයුතු විභවඇත්ව නිරන්තරයෙන් පාලනය කටයුතුතොත්යයි කියා ඒ මහජනයා මධ්‍යයෙහි තමන්ගේ රාජකුමාරවරුන්ට නියෝගකොට අනුරාධපුරනුවරට ගියාවූද ඒ මහානාගය රජතෙම එම අකුශලකර්මය මදකරණපිණිස අනිකුත් ඒ ඒ විහාරවල්හි මහත්වූ පින්කම් කැරවී.

එතැන්පටන් ලංකාවෙහි අධිපතිබවට පැමිණියාවූ රජදරුවන්විසින්ද මහාමාත්‍යාදීන් විසින්ද මේ අත්වනගල්ලු මහාවිහාරය අනන්තරනන්තරයෙහි නැවත සංස්කාරවනු ලබන්නේ නොපිරිහුණ්නාවූ සත්කාර ඇතිව පැවැත්තේයි.

මෙසේ ඒ වටදාගෙයි උත්පත්ති සංඛ්‍යාත නවවැනි පරිච්ඡෙදය කියා නිමවනලදී.

පරිච්. X.

1. ඉක්බිත්තෙන් එසින් මෑතකාලයෙහි කිසිකලෙක්හි ඒ වෙහෙර වාසයකරන්නාවූ මහසංඝයා වහන්සේ අතුරෙන් එක්තරා මහතෙරකෙනෙකුන් වහන්සේ අබ්භොකාසිකාඞ්ගය සමාදන්ව ඒ විහාරය ඇතුළෙහි එක්තරා එක් ප්‍රදේශයෙක්හි වැඩහිඳ භාවනායෙහි යෙදෙනසේක් විදර්ශනාවඩා මහපොළොව ගුගුරුවා භූමිඝොෂාවෙන් අහස්කුස් පූරමින් සකලකෙලෙශයන් ප්‍රහීණකොට රහත්වූසේක;

2. එසමයෙහි උපතිස්සනම් රජෙක් රාජ්‍යයකරන්නේ මධ්‍යමරාත්‍රි වේලෙහි ඒ භයානකවූ භූමිකම්පාව අසා මෙයින් මට කුමක් වේද්දෝහෝයි යන චින්තාසන්තාපයෙන් නිදිනොලබන්නේ ශොකයෙන් තැවෙන්නේය ඉක්බිත්තෙන් ඒ රජහුගේ දළපුඩු සේසතේ අධිගෘහීත දේවතාවූ තොමෝ මහරජ්ජුරුවන් වහන්ස නුඹවහන්සේ නොබව මැනව මේ භූමිකම්පාවෙන් නුඹවහන්සේට වන්නාවූ අනභිවෘද්ධියෙක් ඇත්තේනැත අත්වනගල්ලු මහවිහාරයෙහි එක් තෙරකෙනෙකුන් වහන්සේ කෙලෙසුන් නසා රහත්වූසේකැයි කිවූ.

Digitized by Google

උන්වහන්සේ රහත්වූ වේලෙහි භූමිකම්පාවන්ට හේතු කවරේදැයි රජහු කීකල්හි දේවතාදු කියන්නී රජ්ජුරුවන්වහන්ස ඒ මහතෙරුන්වහන්සේ යටගිය දවස එක් කුශලකර්මයක් කරණයේත් අහස්පොළෝ ගුගුරුවා රහත්වෙම්වයි කියා ප්‍රාර්ථනාවක් කළසේක මේ එහි විපාකයයි රජහට කියා අස්වැසූ. රජතෙම

3. ඒ අසා සෙසු ඈමදෙනා වහන්සේගේ රහත් බවට පැමිණීමටත් වඩා මූන්වහන්සේගේ රහත්වීම අතිශයෙන් විශෙෂයයි ප්‍රසන්නවූ සිත්ඇති රජතෙම ඒ මහතෙරුන්වහන්සේ පසඟපිහිටුවා වැඳ උන්වහන්සේගේ කෙලෙසුන් දිනූ ජයමඟුල් දිනයෙහි වැඩහුන්නාවූ ඒ භූමිප්‍රදෙශයද ප්‍රාසාදයක් කැරවීම් වශයෙන් සත්කාර කෙරෙමියි සිතා මහත්වූ සේනාව ගෙණ අනුරාධ පූරයෙන් නික්ම මේ ජනපදයට අවුත් ඒ භූමි ප්‍රදේශයෙහි පස්මහල්ඇති මහා ප්‍රාසාදයක් කරවා අනෙකප්‍රකාර විචිත්‍රවූ චිත්‍රකර්මාන්තයෙන් අලංකෘතකොට රන්කම් කරනලද තාම්‍රපත්‍රමයවූ උළින් සොයවා දිව්‍ය විමානයක්මෙන් සරහා ක්‍ෂයකරණලද කාමාශ්‍රවාදී චතුරාශ්‍රවයන් ඇති ඒ මහතෙරුන්වහන්සේහා තෙසූ භික්‍ෂුසංඝයා වහන්සේ ඒ ප්‍රාසාදයෙහි වාසයකරවා සිව්පසයෙන් උපස්ථානකොට පරිවාර ජනසහිතවූ ග්‍රාමක්‍ෂෙත්‍රයන් ඒ ප්‍රාසාදය සනාථක කොට ලවා ගියේයි.

4. ඉක්බිත්තෙන් බොහෝ කලක් ඇවෑමෙන් කාල්‍යාමකින් මායාරට වසන්නාවූ හෙවත් ගල්වල්රට වසන්නාවූ ඝම්භර සිරිවණ්නියොනෙක් එක්ව ගෙණ ගම් පැහැරීම් ආදියකොට බොහෝ වස්තු ලැබීමෙන් උඩතාවූවාහු ඉපැයූ සම්පත් දීමෙන් සෙනඟ රැස්කොට ගෙණ බොහෝසේ සිංහල ජනපදය තමන්ට හස්ත ප්‍රාප්තකොට ගෙණ රජ සෙනඟද මැඩ බලීව ගෙණ

Digitized by Google

සිතුවක් කොට ඇවිදිනාහු මහත් මහත් විහාරවල්ද පැහැර නසන්නාහු පලසෙවෙනිවල රන්පත් උපුටා ගන්නාහු පස්මාල් ප්‍රාසාදය විධ්වංශනය කළාහුය.

5. එ සමයෙහි මුගලන් නම් රජෙක් රාජ්‍යය කරන්නේ එපවත් අසා ඒ සොරුන් සමීපයට චරපුරුෂයන් යවා දන සාම භෙද යන ත්‍රිවිධ උපායෙන් ඔවුනොවුන් බිඳවිය, ඔහු බිඳුනාහු උනුන්හා යුධකොට තුමූම දුවී වූවාහුය; ඉක්බිත්තෙන් ඒ මුගලන් නම් රජ ඔවුන් නොසමගිබව දැන තමන්ගේ සිවුරඟ සෙනඟ ගෙණ එතැන්නොස් උන් වෙන වෙන අල්වා නිග්‍රහකොට එ රට නිර්භය වන පරිද්දෙන් ආඥා බෙරලුවා එ ජනපදය මොනවට පිහිටුවා ඔවුන්විසින් නසනලද විහාර නැවත ප්‍රකෘතිමත්කරවා ඒ පස්මාල් මහපාය රන්පත් විදුගන්නාවූ කාලයෙහි එල්ලූහයි අසා පළමු පරිද්දෙන් රන්උළින් සෙවූකල්හි පසුවත් මෙබඳුවූ විපත්තිය වන්නේයයි දැන තුන්මහල්කොට පෙර පරිද්දෙන් ප්‍රාසාදය කරවා නිමවා මැටි උළින් සොයවා වටදාගෙද නැවත සංස්කාරවා සියලු සංඝාරාමද ප්‍රකෘතිවත්කරවා ජීයේය.

මෙසේ ප්‍රාසාදෝත්පත්ති නම්වූ දසවන පරිච්ඡේදය කියා නිමවනලද්.

පරිච්. XI,

1. ඉක්බිත්තෙන් ශ්‍රීමත්වූ ලංකා නැමති අඞ්ගනාවට අලංකාරාභරණවූ විශාල විමලතර කුශලසමාධියෙන් හා ත්‍රිවිධ ක්‍රමාතික්‍රමවික්‍රමයෙන් යුක්තවූ බුද්ධ ධර්ම සංඝ සංඛ්‍යාත රත්නත්‍රය ශරණ පරායණවූ අනෙ-

නාප්‍රකාරවූ ලංකාධීශ්වර ප්‍රවරතර නරේන්ද්‍ර සමූහයාගේ ඇඥා කීර්ති ස්වරූපාවශෙෂවූ කාල්හි පහවූ ධර්මනීති ඇති රාජ්‍ය පරිපාලනොචිත විධාන විරහිතප්‍රකීර්ණ මන්දභාග්‍යාධික්‍ය නරාධිපයන් ප්‍රාප්තවූ කාල්හිද තත්කා ලාශ්‍රවූ අමාත්‍යවූ මන්ත්‍රිජනයාද බාහුල්‍යවශයෙන් අන්‍යොන්‍ය විරොධත්වයට ප්‍රාප්තවූ කාල්හි ලංකාද්වීප වාසීන්ගේ කිසි පූර්වකෘතාදරණවූ අපූර්ණ්‍යක්‍රියාබල යෙන් නානාදේශ නිවාසීවූ අවිදිතවූ ශාස්ත්‍රසමයඇති ප්‍රවිෂ්ටමිථ්‍යාදෘෂ්ටියෙන් ගහණවූ ශත්‍රුසේනා තොම ජම්බුද්වීප ප්‍රදේශයෙන් සවදේශාවතීර්ණව මේ සියලු ශ්‍රීලංකාද්වීපය අනෙකාතංක කලංකයෙන් සංකීර්ණ කෙළාය.

2. එ සමයෙහි පරශත්‍රු සේනාව විසින් ඉතා දුෂ්කතරයකොට පීඩාකරණු ලබන්නාවූ රජ යුවරජ මහාමාත්‍යාදීහුද නොයෙක් සියදහස්ගණන් ජනසමූහයාද භයින් ත්‍රස්තවූ සිත් ඇතතාහු තමතමන්ට රක්ෂාස්ථාන සොයන්නාහු හරණලද ගම් නියම්ගම් දනව්ඇති නගරවාසීහු ඒ ඒ ගිරිදුර්ග වනදුර්ග ජලදුර්ගාදිවූ ස්ථානවල්හි සජාතවූ කායික චෛතසික දුඃඛයෙන් උපලක්ෂිතව වාසයකළාහුය.

ඉක්බිත්තෙන් සර්වඥදාඨාධාතූන්වහන්සේගේ රක්ෂායෙහි නියුක්තවූ උතුරුමූල වංශයෙහි භික්ෂූන්වහන්සේද දළදාකරඬුව හා පාත්‍රාධාතූන්වහන්සේ ගෙන ගිරිදුර්ගයෙන්හා වනදුර්ගයෙන් වැද්ද නොහැක්කාවූ කොත්මලය යන නාමාභිධානයක් ඇති ජනපදයට පැමින එහිදු ඒ දළදා පාත්‍රධාතූන්වහන්සේ රක්ෂාකොට තබන්ට අසමර්ථවූවාහු සුදුසුවූ භූමි ප්‍රදේශයෙක්හි නිධානකොට කැමතිතැනකට වැඩිසේක.

3 යටගිය දවස සියලු දසදහසක් සොඳුන් දඹදිවට
නායකවූ සූර්‍ය්‍යවංශයට තිලකාභරණයක් වැනිවූ ධර්මා
ශොක නාම් රජ්ජුරු විසින් තමහට මිත්‍රවූ දෙවන
පෑතිස්රජහට ශ්‍රීමහාබොධීන්වහන්සේවඩාගෙණෙන
දවස් කැටුව එවනලද තමන්හා සමානවූ ගොත්‍රඇති
රාජකුමාරවරුන්ගේ දරු මුනුබුරු පරම්පරායෙන්
පැවතආවාවූ විජයමල්ල නම් රාජොත්තමයාහට ඖරස
පුත්‍රවූ විජයබාහුනම් මහරජතෙම විශෙෂයෙන් දන්
නාලද සියලු සමයාන්තරඇත්තේ නිරන්තරයෙන්
සවකීයවූ ඥාන ශක්තියෙන් පුරුදුකරණලද ලෝක
නීති ධර්මනීති සංඛ්‍යානීති මාර්ගයන් ඇත්තේ
සමෘද්ධවූ චතුරඞ්ගිනී සේනාව ඇත්තේ දඹදෙණි නම්
නුවරක්කරවා එහි වාසයකරන්නේ මහත්වූ සිව්රඟ
සෙනඟින් ජයගන්නාලද පරසතුරන් ඇත්තේ
කොත්මලයෙහි නිධානකළ දළදා පාත්‍රධාතූන්වහන්
සේත් ගෙන්වාගෙන දිව්‍ය විමානයක් හා සමානවූ
විශෙෂයෙන් බබලන්නාවූ දළදාගෙයක් කරවා එහි
දළදා පාත්‍රධාතූන්වහන්සේ වඩා මහත්වූ පූජාසත්කාර
කිරීමෙන් ආදර සම්භාවනාකරන්නේ භාග්‍යවත්වූ
සර්වඥයන්වහන්සේගේ සූවාසූදහසක් ධර්මස්කන්ධයට
එපමණවූම කාර්ෂාපණයෙන් පූජාකොට බුදුසස්නෙහි
මහත්වූ කුශලචරිතයන් කරන්නේ ඒ දැහැමි සිරිසඟ
බෝ රජ්ජුරුගේ ශීර්ෂදානය කළාවූ සිද්ධක්ෂෙත්‍රවූ දහස්
ගණන් ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ පාදධූලීන් පවි
ත්‍රවූ මනොඥවූ භූමිප්‍රදේශයෙහි ගොඨාභය රජ්ජුරු
විසින් කරවනලද අත්වනගලු මහවිහාරයට අලංකාර
යක් වැනිවූ වටදාගෙයි පළමු රාජ්‍යවිලොපය පිණිස
බටුවාවූ සොළී පාණ්ඩි ආදී තීර්ථක පරශත්‍රු සේනාව
විසින් දකුසබිඳිනාලද පමණක් ඇතිකල්හි ජීවිතයක්
වැනිවූ ධාතු කරණ්ඩකය අනන්තර්ධානවූකල්හි හෘදය
වස්තුවක් මෙන් එහිතුබූ රන්රුවන් ආදිය පැහැර

Digitized by Google

ගෙනණ නසනලද විහාරය ජීර්ණෝද්ධාර කිරීමෙන් නැවත කම්මාන්ත කරවන්නේ තුන්මාල් පියවසායෙහි පටන් සකස්කොට බඳවා මහත්වූ රන්කොත් පැලඳ වීමෙන් පූජාකරවා පරිවාරජනසහිත ගම් කුඹුරුද පුද එහි වාසයකරන්නාවූ භික්ෂු සංඝයා වහන්සේට නිරන්තර දන්වැට තබාදී ඒ අත්වනගල්ල මහවිහාරය කරවා සර්වප්‍රකාරයෙන් සමෘද්ධකෙළේය.

4. ඉක්බිත්තෙන් ලංකාධිපතිවූ ඒ රජහුගේ කීර්තිමය ශරීරය අවශෙෂව ගියකල්හි ඒ රජහට උත්තම පුත්‍රවූ පරාක්‍රමබාහු නම් මහරජතෙම අපගේ භාග්‍යවත් අර්හත් ගෞතම සර්වඥයන්වහන්සේ බොධිද්‍රුම මූලයෙහි වජ්‍රාසනාරූඪව වැඩහිඳ මාරපරාජයකොට සමස්තසම්බොධි නැමැති රාජ්‍යයට පැමිනිතැන් පටන් එක්වාදහස් අටසිය සූවිසි අවුරුද්දක් ඉක්මුනු කල්හි පැමිණියාවූ රාජ්‍යාභිෂෙකඇති සතරසංග්‍රහ වස්තුවෙන් සඞ්ග්‍රහකරනලද මහජනයාඇති සිව්පසය දීමෙන් නිරන්තරයෙන් ආරාධිතවූ නොයෙක් දහස් ගණන් භික්ෂු සංඝයා ඇති ස්වකීය බාහුබලයෙන් විධ්වංශනය කරනලද ජයගන්නාලද ප්‍රතිපක්ෂ රාජෙන්ද්‍රයන්ගේ දර්ප්පඇති පරාක්‍රමබාහු රජතෙම අනෙකප්‍රකාර මාණික්‍ය රත්නයෙන් බබලන්නාවූ රුවන් කරඬුවක්ද රත්රන් දහසකින් රන්කරඬුවක්ද රිදී පස්විසිදහසකින් රිදී කරඬුවක්ද ශ්‍රීදන්තධාතූන්වහන්සේට කරවා අතිශයෙන්ම ප්‍රසන්නවූ සිත්ඇත්තේ සුභමුහුර්ත්තයෙකින් ඒ දන්තධාතූන්වහන්සේ එහි වඩන්නේ තමන්ගේ මුළුනුවරද දළදාගෙයද සකස්කොට විශෙෂයෙන් සරහාවා බුහුමන් පෙරදැරිකොට ඇත්තේ දංෂ්ට්‍රා ධාතූන්වහන්සේ ගෙණ අනෙකප්‍රකාරවූ භාග්‍යවත් සර්වඥයන් වහන්සේගේ ඒ ඒ ජාතියෙහි කළාවූ අපදාන සංඛ්‍යාත වීරචරිතයන් විශෙෂ

යෙන් සිහිකොට පූර්‍වයෙහි අනෙකප්‍රකාරවූ ශුඛාවනත රජෝත්තමයෝ ශ්‍රීදන්ත ධාතූන්වහන්සේගේ ප්‍රාතිහාර්‍ය්‍ය දැක්වීමෙන් ප්‍රසන්න කරවනලද සේකැයි ප්‍රවෘත්තවූ කථා නැමැති අමෘත රසධාරාවෙන් මාගේ කර්‍ණයුගලය සම්පූර්‍ණවිය විශෙෂයෙන් පිණායියේය දැනුදු කිසිම ප්‍රාතිහාර්‍ය්‍ය විශෙෂයකින් මාගේ චක්‍ෂු ප්‍රතිලාභයද සඵල කටයුත්තේයයි ආදර සහිතව ආරාධනා කෙළේයි.

5. ඒ ක්‍ෂණයෙහි ඒ දංෂ්ට්‍රා ධාතූන්වහන්සේ ඒ රජහුගේ හස්තතල නැමැති රක්ත පද්මයෙහි රාජ හංසධෙනුවගේ විලාසය විශෙෂයෙන් පතුරුවමින් පෙළහර දක්වා වදාළසේකි—ගේකෙසේදයත්—යම්සේ බුදුවන ජාතියෙහි මව්කුසින් බිහිවූ පමණක්ම ඇති බෝසතුන් වහන්සේ මනුෂ්‍යයන්ගේ හස්තයෙන් එලවනලද දුහුල්සුඹුලෙන් බස්නාසේක්ම අතිශයෙන් බාල්‍යවසිටද සොළොස්හැවිරිදි ඇත්තෙනෙකුන්මෙන්ද නොසැරහුනුසේක් අනේකප්‍රකාර මාලා ගන්ධවිලේපන වස්ත්‍රාභරණාදීන් සැරහුනු කෙනෙකුන්මෙන්ද බිමින් වඩනාසේක් ආකාශයෙහි යන්නාක්හු මෙන්ද සියලුජනයාගේ නුවණැසට වැටහුනුසේක—එපරිද්දෙන්ම එතැන්හි එසමයෙහි ප්‍රශස්තවූ ශ්‍රීදන්ත ධාතූන්වහන්සේගේ ධාතු කරණ්ඩකය සජීව සර්‍වඥකෙනෙකුන් වහන්සේගේ ආකාරඇති ද්වාත්‍රිංශත් මහාපුරුෂ ලක්‍ෂණ අශීත්‍යනුව්‍යඤ්ජන කෙතුමාලාලඞ්කාරයෙන් උපලක්‍ෂිතවූ රූපයෙන් වැටහෙනාසේක් අනෙකවිධ ෂඩ්වර්‍ණඝනබුද්ධරශ්මි මාලාවන් දසදිගාන්තරයෙහි විසුරුවනසේක් එතැන්හි රැස්වූවාවූ සකලසත්වයන්ට බහුලවූ ආදර සම්භාවනාවන් ඉපැදවූසේකි කියනලදමැයි.

Digitized by Google

6. "ලංකාධිනාථසාරපඞ්කජරාජහංසි
නිම්මාය සා දසනධාතු මුනින්දරූපං
නෙකෙහි රංසිනිකරෙහි සමුජ්ජලන්තී
සබ්බාදිසා ච විදිසා සමලංකරිත්ථ."

7. "දිස්වා තමබ්භුතමතීව පසන්නචිත්තො
සම්පත්තචක්කරතනො විය චක්කවත්තී
සෙසෙහි නෙක රතනාභරණාදිකෙහි
පූජෙසි ධාතුමසමං මනුජාධිනාථො"

යනුහෙයින් අද්භූතවූ ආශ්චර්‍ය්‍යමත්වූ ප්‍රාතිහාර්‍ය්‍ය දැක අතිශයෙන් ප්‍රසන්නවූ සිත්ඇති අභිමුඛයට සම්ප්‍රාප්තවූ චක්‍රරත්නයක්ඇති චක්‍රවර්ත්ති රජක්හුමෙන් උතුම්වූ අනේකප්‍රකාර වස්ත්‍රාභරණාදියෙන් ඒ රාජොත්තමතෙම අසදෘශවූ ශ්‍රීදන්තධාතූන් වහන්සේට මහත්වූ පූජාකෙළේසි.

8. ඉක්බිත්තෙන් සර්‍වඥයන් වහන්සේගේ ශ්‍රීදන්ත ධාතූන් වහන්සේ කෙරෙහි ප්‍රසන්නවූ කල්හි යසස් තෙජස් බලපරාක්‍රම මහිමඇති පරාක්‍රමබාහු නම් මහ රජතෙම පොළොන්නාරුව යන මෙනමින් ප්‍රසිද්ධවූ කඳවුරු නුවර විනූ කරණලද ශාසනවිලොපඇති රජ යුවරජ සහිත නොයෙක් සියදහස්ගණන් සොළි පාණ්ඩි ආදී සේනාවද නොයෙක් අෂ්ටාදශදේශ වාසීවූ සියලු රජනැමැති මත්තහස්තිරාජයන්ට කෙසරසිංහ රාජ වික්‍රමඇති කිසිකෙනෙකුන් විසින් මැඩපැවැත්විය නොහැක්කාවූ ලෝකශාසන සංග්‍රහකිරීම්වශයෙන් වචාකරණලද සියලු ලෝකයාඇති සම්බන්ධවූ හස්ත්‍යශ්වාදී සේනාවාහනඇති ලංකා රාජ්‍ය පැහැරගැන් මෙහි ලොභඇතිව තාඹලිගමු දෙශයෙන් බටුවාවූ අතිශයෙන් සාහසිකවූ සාමන්ත රජුන් සහිතවූ චන්ද්‍රභානු නම් රජහුද විනාශයට පමුණුවා ජයගෙණ සියලු ලං

කාම්පය ඒකච්ඡත්‍රකොට ඒකනායකව තමන්ගේ පිය මහරජහටත් වඩා දිවුණක්ව ලොකශාසන සංග්‍රහ කරන්නේ කිසිකලෙක්හි භික්ෂු සංඝයා වහන්සේට කොළින් සිවුරු දෙනුකැමැත්තේ කපු ඉවීම් සිරිකිරීම් හූකැටීම් වියවීම් කඩකැපීම් ගෙතතම් කිරීම් රැඳීම් ආදිවූ සියලු චීවරකර්මාන්තයන් එක දවස් සැටපැය ඇතුළත නිමවා වෙන වෙනම අනෙකප්‍රකාරවූ මාහැඟිවූ වටවිල් තඹකොතළා භිංකාරාදී ගරු භාණ්ඩයෙන් සැරැසුණාවූ ශ්‍රමණ පරිෂ්කාර සහිතවූ අසූවක් පමණ කොළින් සිවුරු පිළිගන්වා ලෝකවාසී ජනයාගේ සාධුවාද නාදයෙන් දශදිගන්තරය පිරිම්කැරවී.

9. තවද මෙසේ ලෝකයෙහි බහුලවූ අනිකුත් විස්මපත්වූ දනාදිවූ කුශලචරිතයන් සමෘද්ධකරන්නාවූ ඒ පරාක්‍රමබාහු නම් මහාරාජෝත්තම තෙම අත්තනගලු මහවිහාරයෙහි තමන්ගේ පියමහරජහු ආදාහන කළාවූ ස්ථානයෙහි මහත් දාගබක් බඳවා එම විහාරයෙහිම නොයෙක් දහස්ගණන් රහතුන් වහන්සේ විසූ උතුම්වූ ප්‍රාසාදයක් චිරාත්කාලයක් නැසීතිබූවා අසා දුනුකෝවතු වංශයෙහි උපන්නාවූ ශුද්ධාදී ගුණ සමෘද්ධියෙන් විශෙෂයෙන් ප්‍රසිද්ධවූ දේවප්‍රතිරාජ නම්වූ අමාත්‍යස්ථානන් යවා ඔහුලවා නොයෙක් දහස්ගණන් වස්තු පරිත්‍යාගය කිරීමෙන් තුන්මාලකින් සැරහුනු අතිශයෙන් මනෝහරකොට පළමුපරිද්දෙන් ඒ ප්‍රාසාදය කරවා එහි වාසයකරන්නාවූ බොහෝ භික්ෂූන් වහන්සේට නිරන්තරයෙන් චීවරාදී සිව්පස දානය පැවැත්වූයේයි.

10. තවද එම විහාරයෙහි වටදාගෙයි යටිමාලේ ඛලල්ලේ ගල්ටැම් පිහිටුවා දැව වතාබැඳ ගෝනැස්උරවා

හාත්පසින් මුත්තැස්පැලුන් පෝරුගස්වා උළින් සොයවා දෙමාල් ගෙය තුන්මාල් කැරවී.

තවද එම විහාරයෙහි මේ ලඞ්කාවීපයෙහි පෙර නොපැවැත්තාවූ ප්‍රතිමාගෘහයක් කරවනුකැමැත්තේ වටදාගෙට උතුරුදිග්භාගයෙහි පළමුකොට ගලතල අවසන්කොටඇති පුරුෂ ප්‍රමාණයෙක කණවා පූරාසිටි පාංශුරාශිය හරවා නැවත හෝවැලි ගෙණවුත් පුරා ඇත්වලල්ලකින් බබලන්නාවූ පිල්කොන් දෙගිපවන් යම්තාක් කොත්කැරල්ලද එතාක් මේ අතුර අටැස්ආකාරයෙන් සිතාති පළසෙවෙනි විභාග කොට වෙන වෙනම නොයෙක් පැහැයෙන් විසිතුරුවූ අෂ්ටාඞ්ග ප්‍රකාරවූ භිත්ති භාගයන්ගේ මස්තකයෙහි පිහිටි බැලූවන්ට කොළි සිනා රසඋපදවන්නාවූ නානාප්‍රකාර වෙසවිලාශයෙන් අලංකෘතවූ භූතකිංකාරයන්ගේ මුදුන්මස්තකයෙන් හාත්පසින් වටගියාවූ කොංබෝගෙඩි වළල්ලෙන් සැරහුනාවූ ප්‍රමුඛඇති උභයපාශ්වීයෙහි අනෙකප්‍රකාරයෙන් විචිත්‍රවූ රූපයෙන් සිත්කළුවූ අතිශයෙන් උස්වූ උළින් බඳනාලද කරණලද සුණුපිරියම් ඇති මකරතොරණ වළල්ලක්ද නිර්ම්මිතකොට ඇතුළු අභ්‍යන්තරයෙහි කරණලද අති මනොහරවූ මාලාකර්ම්ම ලතාකර්ම්මාදී අනෙක ප්‍රකාරවූ පවිත්‍රවූ චිත්‍රකර්ම්මාන්තයෙන් බබලන්නාවූ මනාකොට පිහිටුවා කරණලද ඉණිමං දොරකවුළු ආදියෙන් අලංකෘතවූ වැඩසිටි ලීලාවෙන් සිත්කළුවූ ජීවමාන සර්වඥකොණේනතුන් වහන්සේ හා සාදෘශ්‍යවූ සිටිපිළිමයෙකින් අලංකෘතවූ ඒ පිළිමයට දකුණුදිග්භාගයෙහි කරණලද ශෛලමය විචිත්‍රවූ ප්‍රතිමාරූපයෙකින් සැරහුනාවූ ත්‍රෛභූමිකවූ විමානයක්ද හෙවත් තුන්මාල් අටපිළිම්ගෙයක්ද කරවා මහත්වූ කුශලසම්භාරයන් රැස්කොළේය

මෙසේ අටස්නෙහි කියනලද ප්‍රතිමාගෘහයාගේ උත්පත්තිකථා නම්වූ එකොළොස්වන පරිච්ඡේදය කියා නිමවනලදී.

විඛ්‍යාතසංඛරණතො නවකම්මුනාවා
ඛෙත්තාදිදාන විධිනාව අනාගතෙපි
යෙ සාධවො පරිහරන්තු ඉමං විහාරං
නාමඤ්ච කාරමපි තෙසමිහාලිඛන්තු.*

---

* මෙ ගාථාවට සන්නයක් පොතේ නෑ. එහි අර්ථ මෙසේයි—“අනාගත කාලයෙහි යම් සාධුජනයෝවෙද්ද ඔහුතුමු සුන්බුන් තැන් ප්‍රකෘතිකිරීමෙන්ද ක්ෂෙත්‍රාදිදානවිධියෙන්ද මෙ විහාරය පරිහරණය කෙරෙත්වා ඔවුන්ගේ නාමයද කිරීම නොහොත් සත්කාරයද මෙ පොතේ ලියත්වා.”

Digitized by Google

Digitized by Google

Digitized by Google

Digitized by Google

This book should be returned to the Library on or before the last date stamped below.

A fine of five cents a day is incurred by retaining it beyond the specified time.

Please return promptly.

Digitized by Google

Digitized by Google